ISSN 1391 - 1031
2011 නොවැම්බර්
17 වෙළුම 08 කලාපය

ආධාරය රු 30/=

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"...එක් අතකින් පොදු ජනතාවගේ ආර්ථික තත්වයන් නොඉවසිය හැකි තරම් කටුක වී තිබේ නම් හා අනෙක් අතට කීන්ස් විස්තර කරන ලෙසට ඉතා සුළු අතළොස්සක් වන සර්ව බලධාරී ජයග්‍රාහක රටවල් අතර කැඩී බිඳී යාම ආරම්භ වී වර්ධනය වී යමින් පවතින්නේ නම්, එසේ නම්, අප සිටින්නේ ලෝක විප්ලවයට අදාලවන කොන්දේසි දෙකක් මෝරා යන තත්වයන් යටතේය.''

ලෙනින්
තෝරා ගත් කෘති
11 වෙළුම 39-40 පිටු




කොළඹ විහාර මහ දේවී එළිමහන් රංග පීඨයේ දී පැවැත්වෙන 22 වැනි ඉල්මහ විරු සමරුව නිමිත්තෙනි

# ආණ්ඩුවේ අයවැය පුස්සක්!

**මහින්ද රාජපක්ෂ ආණ්ඩුව විසින් නොවැම්බරයේදී එළිදක්වීමට යන අයවැය වාර්තාවට පෙර සිටම භාණ්ඩ හා සේවාවන්හි මිල ගණන් විශාල ලෙස ඉහළ දැමීමට කටයුතු කිරීම හේතුවෙන් 2012 අයවැය අර්ථශූන්‍ය හුදු ලියවිල්ලක් පමණක් වනු ඇති බව වාර්තා වේ.**

ආණ්ඩුව පළමුවෙන්ම මත්පැන් හා සිගරට් නිෂ්පාදනවල මිල ඉහළ දැමීමට කටයුතු කළ අතර අනතුරුව අත්‍යවශ්‍ය භාණ්ඩයක් වන ඛනිජ තෙල් මිල ඉහළ දැමීමට කටයුතු කළේය. පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් යන සියලු ඉන්ධන වර්ගවල මිල ගණන් විශාල ලෙස ඉහළ දැමීම තුළ සියලු භාණ්ඩ හා සේවාවන්හි මිලද ඉහළ යාම වැළැක්විය නොහැකි වනු ඇත. විශේෂයෙන් පොදු ජනතාවගේ මගී ප්‍රවාහන සේවාවන්හි ගාස්තු ඉහළ දැමිය යුතු බවට දැනටමත් අදාල අංශවලින් දැඩි බලපෑම් එල්ලවෙමින් තිබේ.

මේ අතර එළඹෙන ජනවාරියේ නිසැක ලෙසම විදුලි බිල ඉහළ නංවන බවට ප්‍රකාශ වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස නැවත වටයකින් භාණ්ඩ මිල හා සේවා ගාස්තු ඉහළ යනු ඇත. ආණ්ඩුව තම ආර්ථික අර්බුදය වසා ගැනීම සඳහා කිසිදු පාලනයකින් තොරව මිල ඉහළ නැංවීම එකම විසඳුම බවට පත් කරගෙන ඇති අතර විදුලිය ඉන්ධන වැනි බලශක්තිවල හා සෙසු සියලු අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවාවන්හි මිල ඉහළ යාම පොදු ජනතාව ඉමහත් පීඩාවට පත්කරනු නිසැකය.

රාජපක්ෂ ජනාධිපතිවරයා මුදල් ඇමතිවරයා ලෙස නොවැම්බරයේදී අයවැය වාර්තාව ඉදිරිපත් කළද එයින් ජනතාවට කිසිදු සහනයක් නොලැබීමේ වැඩි ඉඩක් ඇත්තේ, ආණ්ඩුව දැනටමත් 2012 වසරේදී ජනතාවගේ සාක්කුවෙන් වැඩි මුදලක් කොල්ලකා ගැනීමේ සැලසුම් සකස්කර ඇති නිසාය. විශේෂයෙන් 2011 අයවැය සඳහා ආණ්ඩුව ඉදිරිපත් කළ අයවැය සහන යෝජනා සියල්ලම පාහේ පොරොන්දුවලට පමණක් සීමා විය. ආරක්ෂක සේවයේ නියතු වුවන්ගේ පවුල්වල තෙවැනි දරු උපතට රුපියල් ලක්ෂයක් දෙන බවටද විදෙස් ශ්‍රමිකයින් හට විශ්‍රාම වැටුපක් ගෙවන ලබන බවටද විශ්වවිද්‍යාලවල පහසුකම් නංවන බවටද පෙරපාසල් සංවර්ධනය කරන බවටද මාධ්‍යවේදීන්ට ලැප්ටොප් පරිගණක ලබාදෙන බවටද ආදී වශයෙන් සහන යෝජනා රැසක් 2011 අයවැයෙන් ප්‍රකාශයට පත් වූ නමුදු ඒ කිසිවක් ක්‍රියාත්මක වූයේ නැත.

කෙසේ වුවද ආණ්ඩුව විසින් තම ආදායම ඉහළ නංවාගැනීම සඳහා කරන ලද යෝජනා සියල්ල ක්‍රියාවේ යොදවන ලද අතර විදෙස් ශ්‍රමික විශ්‍රාම වැටුප නොලැබුණද ඒ මුදල් සෙවීම වෙනුවෙන් ජාත්‍යන්තර දුරකතන ඇමතුම් ගාස්තු ඉහළ නැංවීමට ආණ්ඩුව කටයුතු කර තිබිණි.

මේ තත්වය තුළ ජාත්‍යන්තර මුල්‍ය ආයතනවල නිර්දේශ මත ආණ්ඩුව ඉදිරිපත් කරන 2012 අයවැය වාර්තාවද ජනතාවගේ පාර්ශවයෙන් කිසිදු වැදගැම්මකට ඇති ලියවිල්ලක් නොවනු ඇතැයි ආර්ථික විශ්ලේෂකයෝ අදහස් පළ කරති.

**3 ඇන්දවීමේ දේශපාලනය**



සාලය මැද රූප පෙට්ටියට වශී වී සිටින ජනයා තම සිහින ලෝකය තනා ගන්නේ ජීවිතය හා සමාජය වටහා ගන්නේ...

**4 තරුණ**



ලිබියානු අත්දැකීම ලොව පුරා විප්ලවවාදීන්ටත් විප්ලවවාදීන් වීමට උත්සුක වන තරුණයන්ටත්...

**5 සංවාදය**



රෝහණ විජේවීර සහෝදරයා කළ වැදගත්ම කටයුතුවලින් එකක් වන්නේ...

**6 ජ.වි.පෙ. නායකයෝ**



මේ වන විට පක්ෂයේ බොහෝ රහස් හා තොරතුරු පුද්ගල නම්, සංවිධාන රටාවන් ආදී සියල්ල ...

**7 2012 අයවැය**



ලංකාවේ රාජ්‍ය ආදායමෙන් 90%ක්ම බදු ආදායම මගින් උපයා ගන්නේ ඒ වෙනුවෙනි. නමුත් ආණ්ඩුවේ පුරාජේරු කයිවාරු පෙළ ගැහෙන්නේ ...

කාලීන.....................08
විශේෂ.....................09
ජාත්‍යන්තර..............10



# වැඩ බිම

## සමාජවාදී සමාජ ක්‍රමයක් නිර්මාණය කිරීමේදී කලාකරුවන්ට යුග මෙහෙවරක් තියෙනවා

**ලාල්කාන්ත සහෝදරයා**



සියලු සෞන්දර්යයන් ආත්මාර්ථයේ ගිල්වා මරා දමමින් මෙම කෲර සමාජ ක්‍රමය ගමන් කරමින් සිටින බවත් ඒ නිසා මෙම සමාජ ක්‍රමය මුළුමනින්ම වෙනස්කොට ඇත්ත මිනිස් බැඳීම් ඇති සමාජවාදී සමාජයක් නිර්මාණය කළ යුතු බවත් ඒ සඳහා කලාකරුවන් විශාල යුග මෙහෙවරක් ඇති බවත් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයා කියා සිටියේය.

ඔහු එසේ ප්‍රකාශ කළේ, පසුගිය ඔක්තෝබර් 27වැනි දින කොළඹ මහජන පුස්තකාල පරිශ්‍රයේදී ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සාහිත්‍ය අනුකමිටුව විසින් 5වැනි වරටත් සංවිධානය කරන ලද වැඩකරන ජනතා කලා උළෙල සහ සංස්කෘතික ප්‍රසංගයේ ආරාධිත කථාව කරමිනි.

කලාව ප්‍රාග්ධනයට නොව ශ්‍රමයට සේවය කරන උපකරණයක් විය යුතු බවත් එය ශ්‍රමයේ උරුමයක් බවත් කලාව ඇතුළු සියලු නිමැවුම් මිනිස් ශ්‍රමයේම නිර්මාණ බවත් එය සිහියට නගා ගැනීම යුගයේ කලාකරුවන්ගේ වගකීම බවත් ඔහු වැඩිදුරටත් කීය. ඔඩු දුවන ධනේෂ්වර ක්‍රමයේ අර්බුදය විසින් ජනයාගේ වින්දනීය වුවමනාවන් දිනෙන් දින කපා දමමින් සිටින බවත් ඔවුන් තනිකරම මිනිස් යන්ත්‍ර බවට හරවමින් තිබෙන බවත් ඔහු අවධාරණය කළේය.

මෙම කලා උළෙලට සිය නිර්මාණ ඉදිරිපත් කළ සිංහල, දෙමළ, මුස්ලිම් නව නිර්මාණකරුවන් රැසක්ම සහභාගී වී සිටීම විශේෂත්වයක් විය. උතුරු නැගෙනහිර ඇතුළු සියලු පළාත් නියෝජනය කරමින් නවක කලාකරුවෝ රැසක්ම මීට එක්වී සිටියහ. මීට අමතරව ප්‍රවීන කලාකරුවන් පිරිසක්ද මෙම අවස්ථාවට සහභාගි වූහ.

## අර්ථ සාධක අරමුදල් කොල්ලය වහා නවතනු!

**අන්තර් සමාගම් සේවක සංගමය**



සේවක අර්ථසාධක අරමුදල් කොටස් වෙළඳපොලේ ආයෝජනය කිරීමට රජය ගත් තීරණය මේ වන විට ඉතාම වංචාකාරී සූදුවක් බව ඔප්පු වී ඇතැයි අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා පවසයි. ඔහු එසේ පවසා සිටියේ පසුගිය 27වැනිදා කොළඹ පැවති මාධ්‍ය හමුවකදීය.

පසුගිය 10 වෙනි දින ලාෆ් සමාගම් කොටස්වලින් 10% ක් සේවක අර්ථසාධක අරමුදල යොදා මිලදී ගෙන ඇති බවත් එය එසේ කර ඇත්තේ ලාෆ් කොටස්වල මිල කෘත්‍රිම ලෙස ඉහළ නැංවීමට සලස්වමින් බවත් සමරසිංහ සහෝදරයා පවසයි. එදින උදේ 10.00 වන විට රු. 38 ට තිබූ ලාෆ් කොටස් මිල දහවල් 11.00 වන විට 48 දක්වා ඉහළ නැංවීමට කටයුතු කර ඇත. නැවත ඉහත කී ගනුදෙනුවෙන් පසු සවස 2.00 වන විට එහි කොටස් මිල රුපියල් 40 දක්වා බැස ඇත. මේ වන විට එය නැවත රුපියල් 38 දක්වා බැස ඇත. මෙම ගනුදෙනුව නිසා සේවක අර්ථසාධක අරමුදලට ඇති වී ඇති මුදල රුපියල් මිලියන 400-500 ක් අතර වන බවද ගණන් බලා තිබේ. මීට වසර 1 1/2 ට පමණ පෙර ග්‍රේන් එලිවේටර්ස් සමාගමේ කොටසක මිල රු. 15 කි. මීට මාස 5 කට කලින් එය රු. 75 දක්වා ඉහළට ගොස් ඇත. නැවත මාස 3 ක් ඇතුළත එය රු. 258.00 දක්වා ඉහළට නැග ඇත. මීට මාස 2 කට කලින් සේවක අර්ථසාධක අරමුදල මගින් කොටසක් රු. 236 ගණනේ එහි කොටස් රුපියල් මිලියන 5 ක් මිලට ගෙන ඇත. දැන එහි කොටසක වටිනාකම රුපියල් 100 කි. අරමුදලට කෝටි ගණනක මුදලක් අහිමි වී ඇත. මීට අමතරව ඔවුන් සමාග මෙන් රුපියල් මිලියන 737 ක කොටස් අරගෙන ඇත. එය මිලදී ගෙන ඇත්තේ කොටසක් රු. 285 ගණනේය. අද වන විට එහි කොටසක මිල රු. 240 ට බැස ඇත.

ඉහත කී ගනුදෙනුවලින් පමණක් රුපියල් කෝටි 100 ට වැඩි මුදලක් සේවක අර්ථසාධක අරමුදලට අහිමි වී තිබේ. මේ සිදුවන්නේ, අන්‍යමක් නොව රජයේ බලධාරීන් තම හිතවතුන්ට සේවක අරමුදල බෙදාදීම බවත් මෙම වංචාව මහ බැංකු අධිපතිවරයාද දන්නා බවත් වසන්ත සමරසිංහ සහෝදරයා තවදුරටත් හෙළිකර සිටියේය.

## ලෝක ගුරු සමුළුව අභිමානවත්ව සැමරේ



ලංකා ගුරු සේවා සංගමයේ සංවිධාන දායකත්වයෙන් පසුගිය 15වැනි දින ලෝක ගුරු වෘත්තීය සමිති සම්මේලනයේ (World Federation of Teachers Union) 2011 ලෝක සමුළුව ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී මුළුදුන් හා ලංකා ලංකා ගුරු සේවා සංගමයේ සංවිධාන දායකත්වයෙන් පවත්වනු ලැබූ මෙම ලෝක ගුරු වෘත්තීය සමිති සමුළුවට රටවල් ගණනාවක් නියෝජනය කරමින් ගුරු වෘත්තීය සමිති නායකයින් 54 දෙනෙකු සහභාගි විය.

ඔක්තෝබර් 15-16 යන දෙදින පැවති මෙම සමුළුවේ සමාරම්භක උළෙලේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ජනතා විමුක්ති පෙරමුණේ නායක සෝමවංශ අමරසිංහ සහෝදරයා සහභාගි විය.

සමාරම්භක උළෙලේ මුලාසනය ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම් හා ලෝක ගුරු වෘත්තීය සමිති සම්මේලනයේ ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා විසින් දරන ලද අතර, ලෝක ගුරු වෘත්තීය සමිති සම්මේලනයේ නිලධාරීහු රැසක් එක්වී සිටියහ.

ලෝක ගුරු වෘත්තීය සමිති සම්මේලනයේ 2011 වාර්ෂික සමුළුවේ තේමාව වුයේ, 'අධ්‍යාපනය පිළිබඳ සමාජ වගකීම' යන්නයි.

## තෙල්මිල ඇතුළු අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ මිල වැඩිකිරීම හෙළා දකිමු!

**ජ.වි.පෙ. දේශපාලන මණ්ඩලය - ජනතා විමුක්ති පෙරමුණ**

රාජපක්ෂ පරපුරකට කිරුළු පළන්දන මේ ආණ්ඩුවේ ක්‍රියාවලිය හඳුනාගෙන එය පරාජය කිරීමට දැනුවත්වීම මහජනතාවගේද වගකීම බව ජනතා විමුක්ති පෙරමුණ අවධාරණය කරයි. ජ.වි.පෙ. දේශපාලන මණ්ඩලය මේ බව කියා සිටියේ , ඛනිජ තෙල් මිල ඉහළ දැමීමට ආණ්ඩුව ගන්නා ලද පියවර හෙළා දකිමින් පසුගිය 30වැනි දින නිකුත් කරන ලද ජනමාධ්‍ය නිවේදනයකය.

රාජපක්ෂ ආණ්ඩුවේ වංචා දූෂණවලටත් නාස්තිය, බොරු විවෘත කිරීම් ඇතුළු ප්‍රචාරක වියදම් සඳහාත් රුපියල් කෝටි දහස් ගණන් මහජන ධනය වැය කරමින් සිටින අතර එම බර මහජනතාව පිට පැටවීම සඳහා තෙල් මිල ඉහළ දැමීම ජනතා විමුක්ති පෙරමුණ තරයේ හෙළා දකී.

2012 වසරට නියමිත අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමට පෙර මහජනයාගේ විරෝධයක් එල්ල නොවන මතපැන් සහ සිගරට් මිල වැඩිකිරීමෙන් ආරම්භ කළ භාණ්ඩ මිල වැඩි කිරීමේ රැල්ල අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල වැඩිකිරීම දක්වා දියත් කරමින් තිබේ. ඊයේ (29) දා මධ්‍යම රාත්‍රියේ සිට ඩීසල්, පෙට්‍රල් සහ භූමිතෙල් මිල වැඩිකළ අතර ඉදිරියේදී විදුලි බිල ද වැඩිකිරීමට නියමිතිය. මෙය සුළුවෙන් තැකිය හැකි තත්වයක් නොවේ. අයවැයට පෙර භාණ්ඩ හා සේවා මිල ගණන් මෙසේ වැඩිකිරීම ඉදිරියේදී ආර්ථික වශයෙන් තවත් දුෂ්කරතාවයන් ඇතිවීමේ පෙර නිමිත්තක් බව අපි මෙරට ජනතාවට අනතුරු අඟවන්නෙමු. විශේෂයෙන්ම තෙල් මිල වැඩිකිරීම සහ යෝජිත විදුලි බිල වැඩිකිරීම මේ රටේ සමස්ත නිෂ්පාදන කර්මාන්ත පද්ධතියටම බලපාන අතර ඒ නිසා දේශීය කාර්මික නිෂ්පාදනවල මිල සහ මගී ප්‍රවාහන සේවාවල ගාස්තුද වැඩිකිරීමේ ආරම්භය සටහන් වේ. එය ආර්ථික කඩාවැටීමක් දක්වා ගමන් කළ හැකි මිල උද්ධමනයකට බලපායි. හැම පැත්තෙන්ම පීඩාවට පත් කර සිටින ජනතාවගේ ආදායම් මාර්ග එක රුපියලකින් හෝ වැඩිකිරීමට අදාල ඵලදායී ක්‍රියාමාර්ග නොග න්නා ආණ්ඩුව තම ප්‍රචාරක කටයුතුවලට රුපියල් කෝටි දහස් ගණන් වියදම් කරන අතර ජනතාවට තරු පෙන්වමින් සිටී. නාස්තිකාර වියදම් කරමින් මහජනතාවගේ සම්පත් කොල්ලකමින් රාජපක්ෂ පරපුරකට කිරුළු පලන්දන මේ ආණ්ඩුවේ ක්‍රියාවලිය හඳුනාගෙන එය පරාජය කිරීමට දැනුවත්වීම මහජනතාවගේ ද වගකීම බව පෙන්වා දෙනු කැමැත්තෙමු. එසේ නොවුව හොත් ඉතා ඉක්මනින්ම මෙරට සෝමාලියාවක් ඉතියෝපියාවක් බවට පත්වීම වැළැක්විය නොහැකිය.

මේ මොහොතේ තෙල් මිල වැඩිකිරීම පිළිබඳව අප පක්ෂය හඳුනාගන්නේ මෙවැනි පුළුල් වටපිටාවක් තුළය. වර්ධනය වෙමින් පවතින සමස්ත අනතුර කල්තියා හඳුනාගෙන එය පරාජය කිරීමේ අවශ්‍යතාවය ජනතා විමුක්ති පෙරමුණ අවධාරණය කරයි.

## සුබ්‍රමනියම් තවපාලන් සහෝදරයාට කරන ලද පහරදීම හෙළා දකිමු!

**සමාජවාදී තරුණ සංගමය**

යාපනය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය නායක සුබ්‍රමනියම් තවපාලන් මහතාට කරන ලද අමානුෂික ප්‍රහාරය හෙළා දකිමින් සමාජවාදී තරුණ සංගමය පසුගිය 18වැනිදා නිවේදනයක් නිකුත් කරන ලදී. ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයාගේ අත්සනින් නිකුත් කරන ලද එම නිවේදනය සම්පූර්ණයෙන් මෙසේය.

යාපනය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය නායක සුබ්‍රමනියම් තවපාලන් සහෝදරයාට පසුගිය 16 දහවල් යාපනය නගර මධ්‍යයේදී අමානුෂික පහරදීමක් සිදුව තිබේ. මෙම මැර ප්‍රහාරය සමාජවාදී තරුණ සංගමය ලෙස අපි දැඩි පිළිකුලෙන් යුතුව හෙළා දකිමු.

මෑත කාලයේ යාපනයේ සිවිල් ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාධරයින්ට ප්‍රහාර එල්ලවීම වේගවත් වී තිබේ. මෙසේ වනුයේ යාපනයේ සිවිල් තත්වයක් ඇති කරනු ලැබුවේ යැයි ආණ්ඩුව විසින් දිගින් දිගටම කියමින් සිටියෙදීය. මෙය උතුරට පමණක් සීමා වූ තත්වයක් පමණක් නොවේ. ආණ්ඩුව දකුණේද පාතාලයට, මැර දේශපාලනයට ඉඩ නොතබන බව කියමින් සිටියෙදී තුවක්කු පත්තු වෙමින් තිබේ; ඝාතන සිදුවෙමින් තිබේ. උදයන් පුවත්පතේ කර්තෘ කුගනාදන්ද ඔහුගේ කාර්යාලය අසලදී ප්‍රහාරයට ලක්වී දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ගත් බවද ඔහුගේ ජීවිතය දැඩි අනතුරක පැවති බවද සියලු දෙනා දන්නා කරුණකි. මෙවර එම අත්දැකීමට මුහුණපෑමට සිදුව ඇත්තේ යාපනයේ ශිෂ්‍ය නායකයකු වන තවපාලන්ටය.

මෙම සිද්ධිය මගින් නැවත වරක් තහවුරු වනුයේ, යාපනයේ කිසිදු ප්‍රජාතන්ත්‍රික ක්‍රියාකාරකමකට ඉඩක් නොමැති බවය. උතුරට සාමය පැමිණ තිබේ යැයිද උතුරට වසන්තය පැමිණ තිබේ යැයිද යාපනයේ ඕනෑම අයෙකුට බියෙන් හා සැකෙන් තොරව හැසිරීමට හැකි යැයිද පවසන ආණ්ඩුවට මෙම සිද්ධි පිළිබඳව ඇති පැහැදිලි කිරීම කුමක්ද යන්න ගැටලු සහගතය.

උතුරේ තරුණ තරුණියන් 60-70 දශකවල බෙදුම්වාදී සන්නද්ධ දේශපාලනයට යොමු කළේද ඔවුන්ගේ අවම ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් පවා එවකට පැවති ආණ්ඩු වලින් උල්ලංඝනය කල නිසා බව අපි දනිමු. බෙදුම්වාදී යුද්ධය අවසන් වූ පසු වත්මන් උතුරේ තරුණයින්ට මෙසේ සිදුකරන ප්‍රහාර වලින් යළිත් පාරකපන්නේ එම මුල් වැරදි දිශාවටම බව අපි අනතුරු අඟවමු. සමාජවාදී තරුණ සංගමය විසින් පසුගිය අගෝස්තු 01-02 යන දිනවල කිලිනොච්චියේදී පැවැත්වූ සහෝදරත්වයේ දින වැඩසටහනේ ක්‍රීඩා තරගයට පවා හමුදාවලින් බාධා එල්ලවූ අතර එම සිදුවීම් වලින් පවා සනාථ වන්නේ උතුරේ ජනතාවගේ සිවිල් අයිතිවාසිකම් නොලැබී ඇතිබව හා සංවිධානය වීමේ නිදහස රාජපක්ෂ ආණ්ඩුව විසින් අවුරා ඇති බවය.

උතුරේ දිගින් දිගට සිදුවන මෙවැනි ජනතාවිරෝධී ක්‍රියාවන් වහාම නතර කිරීමට පියවර ගතයුතු යැයි ආණ්ඩුවට අවධාරණය කරන අපි ප්‍රජාතන්ත්‍රවිරෝධී ක්‍රියාකාරකම්වලට ඉඩසලසන ආණ්ඩුවේ දුෂ්ට දේශපාලනය පැරදවීම සඳහා පෙරට එන ලෙස සමස්ත ලාංකේය ජනතාවගෙන් ඉල්ලා සිටිමු.

## දීපවාලි දිනය වෙනුවෙන් ජ.වි.පෙ. සුභපැතුම්

ජනතා විමුක්ති පෙරමුණේ නායක සෝමවංශ අමරසිංහ සහෝදරයා පසුගිය 26වැනි දිනට යෙදුණු දීපවාලි දිනය වෙනුවෙන් සුභපැතුම් පණිවිඩයක් නිකුත් කළේය.

අන්ධකාරය පරදා ආලෝකය ජයග්‍රහණය කිරීම සංකේතවත් කරන දීපාවලී දිනය අද (26)ට යෙදී තිබේ. විෂ්ණු දෙවියන් විසින් නාරගාසුරන් නම් දුෂ්ට පාලකයා පරාජය කරනු ලැබීම අද වැනි දිනකදී සිදු වූ බව හින්දු බැතිමතුන්ගේ විශ්වාසයයි. විශිෂ්ට තේමාවක් ඇති දීපාවලී දිනය සමරන හින්දු බැතිමතුන්ට මේ අවස්ථාවේදී අපි සුබ පැතුම් එක් කරනුයේ මහත් සන්තෝෂයෙනි.

ගෙවී යමින් තිබෙන මේ මොහොත සමස්ත ශ්‍රී ලාංකේය ජාතියට පමණක් නොව මුළුමහත් ලෝකයටම අන්ධකාරයෙන් මිදී ආලෝකය ලැබීමේ අවශ්‍යතාව තදින් දැනෙමින් තිබේ.

අපි ජීවත් වෙන්නේ සෞභාග්‍යය, නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කරන පාලකයින් විසින් ජනතාව අන්ධකාරය වෙත කැන්දාගෙන යනු ලබන යුගයකය. ඒ නිසා විෂ්ණු දෙවියන්ගේ ආදර්ශය උකහා ගැනීමේ වැදගත්කම අන් කවරදාටත් වඩා දැඩි ලෙස අද දැනෙමින් තිබේ.


එම නිසා දීපාවලී දිනයේ උත්කෘෂ්ට ප්‍රාර්ථනාවන් ජයග්‍රහණය කර ගනු පිණිස පෙරට ඒමට අදිටන් කර ගන්නා දිනයක් බවට අද දිනය පත් කර ගන්නා ලෙස සියලු දෙනාගෙන් ඉල්ලා සිටීමට අපි මෙය අවස්ථාවක් කර ගනිමු. දීපාවලී දිනය සමරන ශ්‍රී ලංකාවාසී හින්දු බැතිමතුන් ඇතුළු සමස්ත ලෝකවාසී හින්දු බැතිමතුන්ට නැවත වරක් සුභාශිංසන පුද කරමු.

# ඇන්දවීමේ දේශපාලනය හා ඇඳීමේ දේශපාලනය

බලය ලබා ගැනීම සඳහාත්, බලය පවත්වාගෙන යෑම සඳහාත් ජනතාවට බොරු පොරොන්දු දීමත් පොරොන්දු කඩ කිරීමත් ධනපති පාලකයන්ගේ ආවේණික ලක්ෂණයකි.

ජනතාවගේ ප්‍රශ්න ධනපති ක්‍රමය තුළ සැබෑ ලෙසම විසඳිය නොහැක. ධනපති පාලකයෝ ද එය දනිති. එහෙත් ජනතාව තුළ බලාපොරොත්තු ඇති කොට තම පාලන කාලය ගෙවා දැමීමට පාලකයෝ සමත් වෙති. ලංකාවේ සියලුම ධනපති පාලනයන් තුළ මෙය සිදුවිය. ලංකාවේදී ජනතාවට බලාපොරොත්තු ඇති කරමින් දවස ගෙවා ගැනීමේ දේශපාලනය ධනපති පාලකයින් විසින් අත්හැර නැතුවාක් මෙන්ම බලාපොරොත්තු මත ජීවත් වීම ජනතාව විසින්ද අත්හැර නැත. ධනපති ක්‍රමයේ අර්බුදය විසින් පාලකයන් හා ජනතාව පත්කර ඇත්තේ එවැනි තත්වයකට ය.

මෙහි දී වත්මන් මහින්ද රාජපක්ෂ පාලනය බොරු පොරොන්දු දීමේ දේශපාලනයේ දී අන් සියලු ධනපති නායකයන්ට වඩා ඉදිරියෙන් සිටී. රාජපක්ෂ ජනාධිපතිවරයා 'සිහින වෙළෙන්දා' ගේ භූමිකාව හොඳින් රඟපාමින් සිටී. අපේ රටේ ජනතාවගේ සිහින ලෝකය තුළ ලොකු ලොකු හීන මෙන්ම පොඩි පොඩි හීනද නිර්මාණය කර තැබීමට රාජපක්ෂ ආණ්ඩුව නිතර දෙවේලේ කටයුතු කරමින් සිටී. පසුගාමී දුබල, අර්බුදයෙන් අර්බුදයට ගිය ධනපති ක්‍රමය තුළ කිසිදු ප්‍රශ්නයකට විසඳුම් නොමැතිව පීඩාවට පත් වේදනාවට පත් ජනතාවෝ හීන තුළ ජීවත්වීමට පුරුදු වූ විට, නිර්වින්දනය වූවන්ගේ තත්වයට පත්වෙති. දැන් ලාංකේය ජනතාව පත්ව සිටින්නේ, එම තත්වයටය. සැබෑ ලෙසම ජනතාව එම තත්වයට පත්ව සිටිනවා නොව ධනපති ක්‍රමය ජනතාව එම තත්වයට පත්කර තිබේ. අර්බුදයේ බරපතළකම විසින්ම යම් දිනෙක සිහින ලොවින් අවදිවීමට ජනතාවට සිදුවන බව සහතික වුවත් එතෙක් හැකිතාක් කාලයක් ජනතාව සිහින ලෝකවල අතරමං කර බලාපොරොත්තු පොදි ගණන් ලබාදී හීලෑ කර තබා ගැනීමට ධනපති ක්‍රමය සියලු උත්සාහයන් ගනී.



''මාධ්‍ය මගින් කරන්නේ බොරු කියන එක පමණක් නොවේ. සාවද්‍ය පරාවර්තනයන් ඇති කිරීමයි. බොරුව හා සාවද්‍ය පරාවර්තනයන් යනු වර්ග දෙකක්. බොරුව දැනුම මත සෘණාත්මක බලපෑමක් ඇති කරනවා. සාවද්‍ය පරාවර්තනයන් චින්තනය මත සෘණාත්මක බලපෑමක් ඇති කරනවා. එය තොරතුරු වසන් කිරීමට හෝ විකෘති කිරීමට සමාන නැහැ. එමගින් සිදුවන්නේ සිතීමට ඇති හැකියාව මොට කිරීමයි''

**ෆිදෙල් කස්ත්‍රෝ - 'මගේ ජීවිතය' පොතින්**

මෙම කරුණේදී මහින්ද රාජපක්ෂ මහතාට වාසි කිහිපයක් තිබේ. එකක් රාජපක්ෂ මහතා ජනතාව අන්දන කලාවේ කෙළ පැමිණ තිබීම වේ. අනෙක ඔහු වටා ඉන්නා ඔහුගේ උපදේශකයන්, කේවට්ටයන්, අන්තේවාසිකයන් යන සියලු දෙනාම ජනතාව ඇන්දිල්ල සඳහා ඇප කැපවී සිටීමය. ඒ වගේම නූතන තොරතුරු තාක්ෂණයේ දියුණුව විසින් නිර්මාණය වී ඇති මෙවලම්ද රාජපක්ෂ පාලනයට මේ සඳහා උපරිමයෙන් උදව් කිරීමය. සාලය මැද රූප පෙට්ටියේ සංදර්ශන මවන හැම නාලිකාවක්ම තරගයට සිදුකරමින් සිටින්නේ, ජනතාව ඇන්දවීමට මහින්ද රාජපක්ෂ පාලනයට සහය වීම හා ඔවුනුත් ජනතාව ඇන්ද වීමය. සාලය මැද රූප පෙට්ටියට වශී වී සිටින ජනයා තම සිහින ලෝකය තනා ගන්නේ ජීවිතය හා සමාජය වටහා ගන්නේ, ඒ තුළ නිර්මාණය වන මායාවන්ට අනුවය. මේ තත්වය නිසා කිසිදා ආර්ථික සංවර්ධනයක් සිදු නොවන ලංකාවේ දැවැන්ත ආර්ථික සංවර්ධනයක් සිදු වෙමින් තිබෙන බවට ජනතාව තුළ හැඟීමක් නිර්මාණය කිරීමට ආණ්ඩුව සමත්වී සිටී. අනාගතයේ දවසක ලැබෙන (ධනවාදය තුළ ඒ දවස කිසිදා උදාවන්නේ නැත.) ආර්ථික සංවර්ධනයේ ප්‍රතිලාභ ගැන බලාපොරොත්තු තබාගෙන ජීවත් වීමට ජනතාව පුරුදු වී සිටී. ධනපති පාලනය විසින් රට ණය කන්දරාවක ගිල්වා ඇති බවවත් දැන් ණය ගනිමින් තිබෙන්නේ කලින් ගත් ණය ගෙවීම සඳහාය යන්නත් නොදකින, නොසිතන ජනතාව ලංකාවට විදේශ ආධාර ලැබෙන්නේය යන මිත්‍යාවට මුලා වී සිටී. රට ණය කර ලබාගත් මුදල්වලින් නාස්තිකාර හා ඵල රහිත සුදු අලි බවට පත්වන මහ පරිමාණ ව්‍යාපෘති මගින් කොමිස් ගිලිමින් රට අනාගත ව්‍යවසනයක් කරා ගෙන යන්නේය, යන්න කල්පනා නොකරන ජනයා රූප පෙට්ටියේ පෙන්වන මුල්ගල් තැබීම්, විවෘත කිරීම්, ඉදිකිරීම්, සැලසුම් ආදියත් ඒ ගැන දේශපාලකයින්ගේ පම්පෝරිත් නරඹමින් මෝහනයට පත්ව සිටිති.

ධනපති ජනමාධ්‍ය ඔස්සේ ආණ්ඩුව වපුරන බොරු සංවර්ධන මිත්‍යාවලට රැවටෙන ජනතාව ආණ්ඩුවේ යෝජනාවලට, මුල්ගල්වලට ව්‍යාපෘතිවලට ඉන් පසු සිදුවූයේ කුමක්දැයි සෙවීමටවත් කරදර නොවෙති. මේ දුෂ්ට ධනපති ක්‍රමයත්, එහි මතවාදයත්, ධනපති ජනමාධ්‍ය හා මෙවලමුත් විසින් ජනතාව පත්කරනු ලැබ ඇති තත්වය එයයි. දැන් රාජපක්ෂ ආණ්ඩුව 2012 සඳහා අයවැය යෝජනා ඉදිරිපත් කිරීමට සූදානම් වෙමින් සිටී. අයවැයේ වියදම් සඳහා **ලබන වසරේ ණය ගැනීමේ උපරිම සීමාව ලෙස රුපියල් කෝටි 115000 ක සීමාවේ තබා තිබෙන තත්වය යටතේ ඉදිරි අයවැයද ණය වැයක් වන බව ඉතා පැහැදිලිය.** එහෙත් ඉදිරි වසර සඳහා අයවැය ''සංවර්ධන යෝජනා'' ලෙස ඉදිරිපත් කරන ආණ්ඩුවේ සංවර්ධන පම්පෝරියට ඉහත සත්‍යය යටයයි. ලබන වසර සඳහා අයවැය සංවර්ධන යෝජනා ඉදිරිපත් කරන විට ඒ ගැන ආණ්ඩුව ජනතාව තුළ බලාපොරොත්තු දල්වන විට පසුගිය අයවැයෙන් ආණ්ඩුව ඉදිරිපත් කළ යෝජනා කීයක් ඉටුකර තිබේද, පොරොන්දු කීයක් කඩකර තිබේද? මහජන සේවා සඳහා වෙන් කරන බව කී මුදල්වලින් කොපමණ ලබාදී තිබේදැයි ජනතාව නොදනී. ධනපති මාධ්‍ය ඒ ගැන කතා නොකරයි. ඒ නිසා ජනතාව දන්නේ ඉදිරිපත් කරන පොරොන්දු හා යෝජනා පමණි. ඊට සිදුවන දෙය නොදනී. උදාහරණයක් ලෙස පසුගිය අයවැයේ දී රාජපක්ෂ පාලන දුන් එක් පොරොන්දුවක් වූයේ හමුදා සොල්දාදුවන්ගේ බිරින්දෑවරුන්ට ලැබෙන තුන්වන දරුවා වෙනුවෙන් රුපියල් ලක්ෂයක මුදලක් ලබාදෙන බවය. හමුදා සොල්දාදුවන්ගේ බිරින්දෑවරුන්ට තුන්වන දරුවාන් ලැබුණාට මහින්දගේ රුපියල් ලක්ෂය ලැබී නැත. එය ජනතාව දකින්නේද නැත. ඔවුන්ට එය මතකද නැත. එවැනි යෝජනා රැසක් තිබේ. ඒ ආණ්ඩුව ජනතාව අන්දවන හැටිය. ආණ්ඩුව ජනතාව රවට්ටන්නේ ජනතාව අන්දන්නේ අයවැය

> සාලය මැද රූප පෙට්ටියට වශී වී සිටින ජනයා තම සිහින ලෝකය තනා ගන්නේ ජීවිතය හා සමාජය වටහා ගන්නේ, ඒ තුළ නිර්මාණය වන මායාවන්ට අනුවය.

ලේඛනයෙන් පමණක් නොවේ, මැතිවරණවලදීද මේ ඇන්දීම කරයි. සැබෑ ලෙසම ගත් විට ඇන්දිල්ලේ දේශපාලනය ජයටම කෙරෙන්නේ මැතිවරණවලදීය. රජයේ සේවකයින්ට ලබාදෙන බව කී රුපියල් 2500 යේ වැටුප් වැඩිවීමේ සිට තරුණයින්ට කොරියානු රැකියා මගින් ''සපිරි ගමක් සුපිරි රටක්'' හැදීමේ සංකල්පය දක්වා මේ ඇන්දිල්ල සිදුවේ. මීට අමතරව ''උතුරු වසන්තය'', ''නැගෙනහිර නවෝදය'', ''උතුරු මිතුරු දුම්රිය'' වැනි චිත්තාකර්ෂණීය ව්‍යාපෘති නාමවලද දැන් සිදුව ඇත්තේ කුමක්ද? ඒ ගැන දන්නේ දෙවියන් පමණි. පසුගිය කාලයේ ආණ්ඩුව කෘෂිකර්මාන්තයෙන් රට සංවර්ධනය සඳහා යැයි කියමින් විශාල උත්සවයක් පවත්වා ''අපි වවමු - රට නගමු'' නම් ව්‍යාපෘතිය ආරම්භ කළේය. ප්‍රචාරණ කටයුතුවලට විශාල මුදලක් වැය කළේය. එහෙත් ඉන් ලද ප්‍රතිඵලයක් නොවීය. ටික කලකට පසු එය අත්හැර දැමූ ආණ්ඩුව 2011 මාර්තුවලදී පළාත් පාලන මැතිවරණ අස්සේ අලුත් ව්‍යාපෘතියක් උත්වශ්‍රීයෙන් හඳුන්වා දුන්නේය. ඒ ''දිවි නැගුම'' ව්‍යාපෘතියයි. ගෙවතු දශලක්ෂයක් වගා කිරීම එහි අරමුණ බව ප්‍රචාරය කළේය. දැන් එහි දෙවැනි අදියර ආරම්භ කරන බව ජනමාධ්‍ය තුළ පළවී තිබේ. එහි දෙවැනි අදියර ගැන යළි මාධ්‍ය ප්‍රචාරණ කරන්නේ පළමු අදියරට සිදුවූයේ කුමක් දැයි කතා නොකරය. එම ව්‍යාපෘතිය මුළුමනින්ම අසාර්ථක ව්‍යාපෘතියක් වී තිබේ. දෙවැනි අදියරක් ගැන කතා කිරීමට ආණ්ඩුවට සිදුව ඇත්තේද ඒ නිසාය.

එසේම පසුගිය වසරේ නොවැම්බර් 18 වැනිදා රාජපක්ෂ ජනාධිපතිවරයාගේ උපන් දිනයට සමගාමීව රටපුරා විශාල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක විය. නැකතට අනුව සිදුකළ එම ව්‍යාපෘතිය වූයේ පැළ ලක්ෂ 11ක් සිටුවීමේ ව්‍යාපෘතියයි. දැන් ඊට වසරක් ගතවී තිබේ. එදා රටපුරා උත්සවශ්‍රීයෙන් නැකතට සිටවූ පැළ ලක්ෂ 11 යෙන් කීයක් ගස් බවට පත්ව තිබේ දැයි කිසිවකු දන්නේ නැත. ඉහත පැළ සිටුවීම ජනතාවගේ මතකයේද නැත. පැළ සිටුවීමේ උත්සවය ජයටම වෙන්වූ රූපවාහිනී නාලිකාවල මහත්වරු දැන් එම පැළවලට සිදුව ඇත්තේ කුමක් දැයි පෙන්වීමට තරම් කාරුණික වී නැත. හම්බන්තොට වරායේ ඇන්දිල්ල මෙන්ම අධිවේගී මාර්ගයේ මාර්ගයේ ඇන්දිල්ලද මෙසේමය.

පසුගිය වසර 63ක ඉතිහාසය තුළ අපේ රටේ බලයට පත් ආණ්ඩු මැතිවරණවලදී මෙන්ම බලයට පත් වූ පසු දෙනු ලැබූ පොරොන්දුවලින් 25%ක් ඉටු කළේ නම් එම ආණ්ඩු ආරම්භ කළ ඊනියා සංවර්ධන ව්‍යාපෘතිවලින් 25%ක් වත් සාර්ථක වූයේ නම් ලංකාව තිබෙනු ඇත්තේ සංවර්ධනයේ හිනිපෙතේය. එහෙත් දැන් ලංකාව ධනපති ක්‍රමය තුළ වැටී ඇත්තේ බරපතළ අගාධයකටය. ඛේදවාචකයකටය. අර්බුදයට ගොස් ඇති ධනවාදය තුළ රාජපක්ෂ පාලනයට හෙට දවසේ සිදුවන්නේත් බොරු පොරොන්දු දීමටය. සිහින විකිණීමටය. බොරු ව්‍යාපෘති ගැන පුරසාරම් දොඩමින් ජනතාව ඇන්දීමටය. ඒ මගින් හැකි දුරක් ධනවාදයත් තම පාලනයත් පවත්වාගෙන යාමටය. දැන් මේ ඇන්දිල්ලේ දේශපාලනය පරාජය කළ යුතුය. මෙහි ගැටලුව වන්නේ ආණ්ඩුව ජනතාව අන්දන අතර ජනතාවද කැමැත්තෙන් ඇඳීමය. ජනතාව රැවටීම, ජනතාව ඇන්දීම ධනපති ආණ්ඩුවේ ස්වභාවය වුවත් ඊට ගොදුරුවීම සිදු නොවිය යුතුය. ඒ සඳහා ධනවාදය තුළ ජනතාව පත්ව ඇති මේ ඛේදවාචකය හඳුනාගෙන එය වෙනස් කිරීමට සමාජ බලවේග කටයුතු කළ යුතුය.

ධනවාදය තුළ දශක ගණනාවක් හා පංති සමාජය තුළ සියවස් ගණනාවක් පරම්පරා ගණනාවක් තිස්සේ පීඩාවට, රැවටීමට, විශ්වාසභංගත්වයට, හුදකලාභාවයට පත් වූ ජනතාවක් ආත්මාර්ථකාමීත්වයට හා අවිද්‍යාවට පත්කළ ජනතාවක් මෙවන් තත්වයට පත්වීම පුදුමයක් නැත. විශේෂයෙන්ම ධනවාදය විසින් නිර්මාණය කරනු ලැබූ සන්නිවේදනයේ දියුණුම මෙවලම් ජනතාව රැවටීමට යොදා ගනිද්දී තත්වය ඉතා බරපතළය. තමා පෙලෙන පීඩාවන් වැඩිවන තරමට ජනතාව යථාර්ථයෙන් ඈත් කර තැබීමටත් හුදකලා කිරීමටත් අවිද්‍යාව පසුපස දිවවීමටත් ඕපාදූපවලට, ධනපති පංතියේ බොරුවලට හසුකර ගැනීමටත් ධනපති ක්‍රමය සවිඥානිකවම ක්‍රියාත්මක වේ.

ධනවාදයේ අර්බුදය විසින්ම අර්බුදයේ බරපතළකම දරා ගැනීමට නොහැකි සීමාවකට පැමිණෙන විට ජනතාව තමන් පත්වී සිටින සිහින ලෝකවලින් අවදි වනු ඇති බව සත්‍යයකි. එහෙත් එතෙක් බලා සිය යුතු නැත. ජනතාව මුලා කිරීමේ ඇන්දීමේ ධනපති දේශපාලනයට එරෙහිව ධනපති මාධ්‍ය භාවිතයට එරෙහිව ජනතාව දැනුවත් කිරීමේ, අවදි කිරීමේ දේශපාලන මැදිහත්වීමත් අවශ්‍ය වී තිබේ. ඒ සඳහා ප්‍රගතිශීලි සමාජ බලවේග කණ්ඩායම් ප්‍රගතිශීලි බුද්ධිමතුන් මැදිහත් විය යුතුය. එහෙත් ඊට මග පෙන්වීමේ, ප්‍රගතිශීලි බලවේග මෙහෙය වීමේ හා අවදිකිරීමේ වගකීම පැවරෙන්නේ, නිර්ධන පංතියේ විප්ලවකාරී ව්‍යාපාරයටය. වමේ ව්‍යාපාරයටය. එබැවින් ධනපති ක්‍රමයේ ඇන්දිල්ලේ දේශපාලනයත්, ධනපති ක්‍රමයේ අර්බුදයේ ගොදුරු බවට පත් ජනතාවගේ ඇඳීමේ දේශපාලනයත් වෙනස් කර ධනපති ක්‍රමයේ අර්බුදයේ යථාර්ථයත් ඊට ඇති එකම විසඳුමත් තේරුම් ගෙන ඒ වෙනුවෙන් සටන් වදින ජනතාවක් බවට මෙම ජනතාව පත්කරන භාරදූර වගකීම වමේ ව්‍යාපාරය භාරගත යුතුය. ධනපති පංතියේ ඇන්දිල්ලේ දේශපාලනය පරාජයට පත් කිරීම වමේ ව්‍යාපාරයේ වගකීම වන අතරම එවැනි ඇන්දිල්ලට හසු නොවීමේ හා ඇන්දිල්ලේ දේශපාලනයෙන් මිදීමේ වගකීම ජනතාවටද තිබේ.





# හැමදාම අලුත් වන හඬ



මේ අඳුරු ඉල්මහත්
ගෙවී යන සඳ සොයුර
තව වසරකට යළිත්
ඔබේ හඬ අලුත් වෙයි

ඔබේ රුව ගුණ ඈතිව
මහපොළොව දළු ලයි
ඔබ ම යළි ඉල්ලයි

සිව්දිගට ගලායන
සිව්දිගින් ගලාඑන
නපුර
තව නොනවතියි
මව්බිම ම ඉකි බිඳියි

පෙර හැම වරෙක මෙන්
අවිචාර සමයක්ය
මගේ මව්බිම නැවත

තුන්කල් දකින
දිනන මග කියන
ඒ මහා මිනිසා නුඹය

ඉදින් නැවතත්
ඉල්මහක් එයි

කොඳමල් පිපෙයි

ආයමත් ඔබේ හඬ
අලුත් වී ඇසෙයි

**උපුටා ගැනීම - අඩ පියාසැරිය**

# CHE DAY 20011

සමාජවාදී තරුණ සංගමය පසුගිය 15 වැනිදා චේ සමරුව කොළඹ ජයවර්ධන කේන්ද්‍රයේදී පවත්වන ලදී. ඒ සඳහා කියුබානු තනාපතිනි නර්සියා කස්ත්‍රෝ සහෝදරිය සහභාගි වූ අතර එහි ප්‍රධාන දේශනය ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසින් පවත්වන ලදී. එම සමරුවේ ගත් ඡායාරූප කිහිපයක් පහත දැක්වේ.












# ගඩාෆි, අපි සහ හිරුනැගීම



ලිබියාවේ ජනාධිපති මුහම්මර් ගඩාෆි ඝාතනය කිරීම පසුගිය සතියේ ලොව වැඩිම අවධානය දිනාගත් සිදුවීමක් විය. වසර 42ක් ලිබියාව පාලනය කළ ගඩාෆි - නේටෝ හමුදා මැදිහත්වීම හා ලිබියාව එහි ආධාර ලැබූ ''කැරලිකරුවන්ගේ'' ප්‍රහාරවලට ගොදුරුව මාස 07කට පසුව ඝාතනය කෙරිණි. ලිබියානු අත්දැකීම ලොව පුරා විප්ලවවාදීන්ට, විප්ලවවාදීන් වීමට උත්සුක වන තරුණයන්ටත් එකවිට පාඩම් රැසක් කියාදෙයි.

ලිබියාව තුළ මෙම තත්වයට අදාල මූලික ආසන්න හේතු නිර්මාණය වන්නේ 2010 වසරේ සැප්තැම්බරයේ සිට උතුරු අප්‍රිකාව හා මැදපෙරදිග හරහා හමාගෙන යන දේශපාලන නැගිටීමේ ප්‍රවාහය තුළමය. ටියුනීසියාවෙන් ඇරඹී ඊජිප්තුව හරහා හමාගිය එම නැගිටීම් උතුරු අප්‍රිකාවේ හා මැදපෙරදිග බොහෝ රාජ්‍යයන් හරහා හමා ගිය අතර ටියුනීසියාවට හා ඊජිප්තුවට මැදිව තිබෙන ලිබියාව ඉන් ගැලවුණේ නැත. 2008 වසරේ සිට ඇතිවී තිබෙන ලෝක ආර්ථික කඩාවැටීමෙන් තම ආදායම, තම රැකියා, තම අධ්‍යාපනය, තම ව්‍යාපාර, තම අනාගතය බිඳවැටුණු, අපේක්ෂාභංගත්වයට හා කෝපයට පත්වූ මිලියන සියය ගණන් ජනයා අතර ලිබියානු ජනතාවද විය. ලෝක ධනවාදයේ අර්බුදය නිසා දියුණු ධනපති රටවල ජනයා එක්වරක් ද ලිබියාව, ඊජිප්තුව, ශ්‍රී ලංකාව වැනි රටවල ජනයා දෙවරක්ද හමගැසෙන තත්වයක් යටතේ ලිබියානු ජනතාවද තමන් මුහුණ දුන් ආර්ථික, සමාජ, දේශපාලන ප්‍රශ්නවලට එරෙහිව වීදි බැසීම අරුමයක් නොවේ.

ලිබියාවේ ට්‍රිපොලි නුවර වීදි තරුණ තරුණියන්ගේ උද්ඝෝෂණවලින් පිරී ගිය අතර ආර්ථික අර්බුදය මෙන්ම වසර 42ක් එක දිගට තම රට තම ජීවිතත් පාලනය කරන ධනේෂ්වර දූෂිත ඒකාධිපති පාලකයාට සහ ඔහුගේ ඥාති පරම්පාරාවට එරෙහි වෛරයද එම උද්ඝෝෂණවල සටන්කාමීත්වය තියුණු කළේය. 1967 දී ලිබියාවේ බලය අල්ලා ගත් ගඩාපි අරාබි ජාතිකවාදයේ පියා වූ නසාර් අනුව යමින් මුල් කාලීනව අධිරාජ්‍ය විරෝධී විදේශ ප්‍රතිපත්තිය යම් තරමකට ක්‍රියාත්මක කළේය. එහෙත් 1990 න් පසු ක්‍රමානුකූලව (2003න් පසු තීරණාත්මකව) අධිරාජ්‍ය ගැති විදේශ ප්‍රතිපත්තියකට මාරු වූ අතර 'දේශප්‍රේමය' හා 'අරාබි ජාතිකවාදය' තම පවුලේ සුඛවිහරණය හා ආණ්ඩු බලය පවත්වාගෙන යාම සඳහා යොදා ගත්තේය.

දුර්වල දූෂිත ජනතා ද්‍රෝහී පාලකයන් සිටින තරමට බලවත් රටවල් අධිරාජ්‍යවාදී සතුටු වන අතර ඔවුන් අල්ලේ නැටවීම අධිරාජ්‍යවාදීන්ට පහසුය. මේ ආකාරයේ ඒකාධිපතියන් බලය ගන්නේ දේශප්‍රේමීත්වය ගැන කතා කියා වුවද ඔවුන් ඉන්පසුව අධිරාජ්‍යවාදීන්ගේ සුරතලුන් බවටත් ඊට පසුව අධිරාජ්‍යවාදීන්ගේ ගොදුරු බවටත් තමනුත් පත්වී තම රටවලුත් ජනතාවත් පත් කරවන බව ඉරාක, ඇෆ්ගනිස්තාන, සර්බියානු, ලිබියානු අත්දැකීම් අපට කියාදෙයි. අධිරාජ්‍යවාදීන් හැමවිටම ක්‍රියාත්මක වන්නේ, දේශීය ධනපති පංතියේ එකඟතාවය ඇතිව යයිද දේශීය ධනපති පංතිය සමඟ ගැටුම් ඇති කර ගනිමින් අධිරාජ්‍යවාදී රටවල් බලයට මැදිහත් නොවන්නේ යැයි කියන සමහර ට්‍රොට්ස්කිවාදී මහත්වරුන්වද ලිබියානු අත්දැකීම් විසින් අල්ලා පොළොවේ ගසා තිබේ.

ජනතාව මහ බලයක් බවත් ඔවුන් යම් මොහොතක තමන් පෙළන පීඩකයන්ට එරෙහිව නැගී සිටින බවත් මෙම සිදුවීමෙන් සනාථ වන අතර එහි දී තවත් කරුණක් වෙත අවධානය යොමුකළ යුතුය. එනම්, එම ජනතා අරගලවලට ඕනෑම සන්නිවේදන මාධ්‍යයක් මගින් (Facebook, Email) උත්තේජන සැපයිය හැකි වුවද එම නැගිටීම් ජනතා ජයග්‍රහණවලින් කෙළවර කරගැනීමට නම් ඒවාට දේශපාලන නායකත්වය සපයන පංතියේ හා ජනතාවගේ අරමුණු වෙනුවෙන් කටයුතු කරන විප්ලවවාදී ව්‍යාපාරයක නායකත්වය ලැබිය යුතු වීමයි. ඊජිප්තුවේ, ටියුනිසියාවේ හා ලිබියාවේ අප නොදුටුවේද එයයි. අනාගතයේදී එවන්නක් ගොඩනැගෙනු ඇති බවට වන විශ්වාසයක් අපට තිබේ.

ශ්‍රී ලංකාවේ ජනතාවට විප්ලවය සඳහා මග පෙන්වන ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු සහෝදරවරුන් ඝාතනය කර මේ සටහන පළවන ඉල්මාසයට වසර 22ක් පිරේ. ඔවුන් ඝාතනය කරමින් ජ.වි.පෙ. විනාශ කිරීමට නොහැකි වූ විවෘත හා ආවෘත පංති සතුරන් මේ මොහොතේදී පවා ක්‍රියාත්මක වෙමින් සිටින්නේ, ඒ වෙනුවෙනි. එය තම දුරදක්නා නුවණින් හොඳින්ම දන සිටි විජේවීර සහෝදරයා පළ කළ අදහසක් මෙහි බහාලමින් මේ සටහන නිමා කරමු.

**''අපි වේලාසනින් අවදිවීමු. අප වේලාසනින් අවදිවූ පමණින් හිරු උදාවන්නේ නැත. එසේ වුවද අපි කලින් අවදිවී සිටීම හිරු නැගෙන විටකදී අපට ප්‍රයෝජනවත් වනු ඇත.''**

# අපි තමයි 99%

ලෝක අධිපතියා ලෙස පෙනී සිටින ඇමරිකා එක්සත් ජනපදයෙන් හඬක් නැඟෙන්නට පටන් ගෙන තිබේ. මෙතෙක් කල් ලෝකයට ඇමරිකානු නායකයින්ගෙන් අසන්නට ලැබුණේ තර්ජනයන්ය. බලහත්කාරයන්ය. සම්බාධකය. ඒ නිසාම එක්සත් ජනපදය පිළිබඳව ලොව පුරා ජනතාවට ඇත්තේ පිළිකුලකි. එහෙත් එකී අප්‍රසන්න හඬ වෙනුවට පීඩිතයන්ගෙන් නැගෙන හඬක් ඇසෙන්නට පටන්ගෙන ඇත. ඒ ''අපි තමයි 99%'' හඬයි. වෝල් වීදියේ අරගලය ලෙසින් මතුව ඇත්තේ එයයි.

මීට වසර 3කට පමණ පෙර එනම් 2008 පමණ එක්සත් ජනපද මූල්‍ය වෙළඳපොළ බිඳ වැටීමත් සමඟ මතුවූ අර්බුදය සමඟ ඇමරිකානුවන්ගේ ජන ජීවිතද, කඩා වට්ටනු ලැබුණි. ඔවුහු කුලී නිවාසවල කුලී ගෙවීමට නොහැකි වූ තැන එම නිවාසවලින් එළියට ඇද දමනු ලැබුණි. වාහනවල වාරික ගෙවා ගැනීමට නොහැකි වූ කළ වාහන පවරා ගනු ලැබුණි. එසේම ඔවුහු රැකියාවලින් ඉවත් කරනු ලැබුණි.



මෙසේ දසදහස් ගණන් ජනතාව මහ මගට ඇද දමන ක්‍රියාවලියක් ආරම්භ විය. එහෙත් ඇමරිකානු ආණ්ඩුව තම සමාගම්කාර ධන කුවේරයන් බේරා ගැනීමට උත්සාහ කළා විනා මහමගට ඇද වැටුණු අසරණ ජනතාව දෙස බැලුවේ නැත. තවතවත් මහා පරිමාණ වශයෙන් ණය ලබා ගනිමින් ඒවා බිඳ වැටෙන මූල්‍ය සමාගම් හා ව්‍යාපාර වෙත පොම්ප කරමින් ඒවා රැක ගැනීමට අසාර්ථක උත්සාහයන් ගනු ලැබුණි. මේ සියළු පැ්‍යත්නයන් වලට ප්‍රශ්නය විසඳීමට නොහැකි වී ඇති බව කාලයද, සිදුවීම්ද විසින් පෙන්වා දී තිබේ.

පසුගිය සැප්තැම්බර් 17 වොෂින්ටනයේ නිදහසේ ප්‍රතිමාව අසලින් ඇරඹී ''වෝල් වීදිය අත්පත් කරගනු!'' සටන අද ඇමරිකා එක්සත් ජනපදයේ නගර පුරා ඇවිලයමින් තිබේ. ඔවුන්ගේ සටන් පාඨ අතර ප්‍රධාන එකක් වන්නේ ''අපි තමයි 99%'' යන්නයි. එනම්, වැඩ කරන පීඩිත ජනතාව තමන් බවයි. තවද, ඉතිරි 01% ජනතාව පෙළන, ඔවුන්ව සූරා කන ධන කුවේරයන් බවයි. සරල ප්‍රතිසංස්කරණවාදී සටන් පාඨයකට වඩා මෙම සටන් පාඨය අර්බුදයේ හැඩ රුව කියා පායි. එහෙත් එසේ වූ පමණින් මේ සටන් විප්ලවීය යැයි, අර්ථකථන දීමට අප හදිසි විය යුතු නැත. එනමුත් පොලිස් මර්දනයන් මධ්‍යයේ ඇමරිකානු තරුණයන් සටනට එළඹීම සුභදායක තත්වයකි.

ලොව පුරා මෙසේ මතු වූ අරගල රැසක් නිසි නායකත්වයක් නොලැබීම නිසා කෙළවර වූයේ සැබෑ ජනතා ජයගහණයන්ගෙන් නොවේ. ටියුනීසියාව, ඊජිප්තුව, ලිබියාව වැනි රටවල අත්දැකීම් කියාපාන්නේ එයයි. එනම්, අවශ්‍ය වන්නේ ධනවාදයේ අර්බුදය තුළ එයට ස්ථිර විසඳුම වන ධනවාදය අවසන් කරන සමස්ත ක්‍රමය වෙනස් කරන සමාජවාදී ජයග්‍රහණයකින් කෙළවර කරන විසඳුමක් ය.

***නියමුවා: පසුගිය පළාත් පාලන මැතිවරණය වෙත සැලකිය යුතු අවධානයක් යොමු කිරීමට ජ.වි.පෙට නොහැකි වුණා. ලැබුණු මැතිවරණ ප්‍රතිඵලය පිළිබඳව ජ.වි.පෙ විග්‍රහය මොකක්ද?***

***අනුර දිසානායක සහෝදරයා:*** මෙම මැතිවරණවලින් ජනතාවගේ මතය කිසිසේත් නිරූපණය වෙන්නේ නැහැ. එය කුඩා ප්‍රදේශයක පැවැත්වෙන කුඩා මැතිවරණයක් වීම, රාජ්‍ය බලය මුළුමනින් යෙදවීම, මාධ්‍ය හැසිරීම, ප්‍රචණ්ඩත්වය, නිදහස් හා ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ පැවැත්වීමට බාධා කිරීම් ආදී සියල්ල හේතුකොටගෙන මෙම මැතිවරණවලින් පෙන්නුම් කරන්නේ, සැබෑ ජනමතයේ විකෘතියක්. ඒ නිසා මේ මැතිවරණ ප්‍රතිඵල මත පදනම් වී දේශපාලන පක්ෂවල, ව්‍යාපාරවල, තත්ත්වයන් පිළිබඳව තක්සේරුවකට ඒම සුදුසු නැහැ. නමුත් මේ ධනපති ක්‍රමය වෙනුවට අපේ රටට නව සමාජ ක්‍රමයක් ස්ථාපිත කිරීම වෙනුන් සමාජ මතය ගොඩනගන්න. ඒ සඳහා කම්කරු, ගොවි ජනතාව, තරුණ ශිෂ්‍ය කාන්තා බලවේග පෙලගස්වන්න. සමාජ වෙනසක් වෙනුවෙන්, සාධාරණ සමාජයක් වෙනුවෙන් මේ රටේ ජනතාව පෙළගස්වන්න. ඒ සඳහායි ජනතා විමුක්ති පෙරමුණ අවධානය යොමුකරමින් කටයුතු කළ යුතු වන්නේ.

පාතාල කණ්ඩායම් සහිත මන්ත්‍රීවරුන් මොනතරම් බලවත්ද කියනඑක එයින් පෙනුණා. නීතිය හා විධානයේ ආධිපත්‍ය බිඳවැටී ඇති අන්දම මෙයින් පිළිබිඹු වුණා.

දිගින් දිගටම ජනතා විමුක්ති පෙරමුණ මේ පිළිබඳව කරුණු ඉදිරිපත් කරමින් තිබුණා. අපේ රටේ නීතිය සාධාරණ නැහැ, අපේ රටේ පොලීසියේ ක්‍රියාකාරිත්වය සාධාරණ නැහැ. ඒ නිසා නීතිය හා විධානයේ සාධාරණත්වය තහවුරු කිරීමක් අවශ්‍යවී තිබෙනවා. මෙම සිදුවීමෙන් පස්සෙ ආණ්ඩුවේ මැතිඇමතිවරුන්ගේ ආරක්ෂකයින් නිල ඇඳුමින් සිටිය යුතු බවට නියෝගයක් කර ඉන්නවා. නමුත් ඇමතිවරුන් සහ ඇතැම් මන්ත්‍රීවරුන්ට නිළ ආරක්ෂකයින් සහ නොනිල ආරක්ෂකයින් යනුවෙන් කොටස් දෙකක් තිබෙනවා. ඔවුන් කරන කවර හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවකට අදාලව නීතිය ක්‍රියාත්මක කිරීමට පොලීසිය උත්සුක වන්නේ නැහැ. ඒ වගේම තමයි අත්අඩංගුවට ගත්තත් නීතිපතිවරයා අධිකරණයට ගොස් ඔහුට ඇති චෝදනා



# මාක්ස්වාදය ලංකාවට ගැලපූ ආකාරය රෝහණ සහෝදරයාගෙන් උගත යුතුයි!

## ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික අනුර දිසානායක සහෝදරයා



මාක්ස් වූ කලී මාක්ස් වූ කලී ඔහුගේ යුගයේදී සාතිශය වෛරයටත් අතිශය අවමානයටත් භාජනය කරනු ලැබූ පුද්ගලයාය. අත්තනෝමතික මෙන්ම සමූහාණ්ඩුවාදී ආණ්ඩුද තමන්ගේ දේශ සීමාවලින් ඔහු පිටමං කළහ. කොන්සවේටිව් හෝ වේවා, අති ප්‍රජාතන්ත්‍රවාදී හෝ ධනේශ්වර පංතිය ඔහු මත අවලාද ගොඩනැගීමෙහිලා එකිනෙකා හා තරඟ වැදුනාහ. අත්‍යන්ත වුවමනාව විසින් තමාට බලකරනු ලැබූ අවස්ථාවන්හිදී පමණක් පිළිතුරු දෙමින් ඔහු ඒ සියල්ල නොසලකා හරිමින් මකුළු දැලක් මෙන් ඒවා බැහැර කර දැම්මේය.

**එංගල්ස්**
**මාක්ස්ගේ අවමඟුල් උත්සවයේදී**
**1883 මාර්තු 18**

***නියමුවා: මැතිවරණය සාමකාමී බවටත් සටනක් නොමැති බවටත් ආණ්ඩුව පාරම්බාමින් සිටියත් මැතිවරණ දිනයේ සිදුවූ මාරාන්තික වෙඩි හුවමාරුවෙන් ආණ්ඩුවේ ප්‍රකාශය විහිළුවක් වුණා. මේ පිළිබඳව යමක් කීවොත්?***

***අනුර දිසානායක සහෝදරයා:*** ආණ්ඩුව දිගින් දිගට මැතිවරණ සාමකාමී හා සාධාරණය යැයි ප්‍රකාශ කරන්න උත්සාහ කරන්නේ මැතිවරණයේ අවසන් දිනයේ තත්ත්වය අනුවයි. එය කිසිසේත් සාධාරණ නැහැ. මැතිවරණය කියන්නේ ක්‍රියාදාමයක්. ඒ තුළ මැතිවරණයට දින යොදාගැනීම, මැතිවරණ ව්‍යාපාරය වැනි සියල්ල මැතිවරණ සාධාරණද නැද්ද යන්නට, ජනතාවගේ මතය නිවැරදි ලෙස පිළිඹිබු වන්නට ඉඩදුන්නා යන්නට අදාල වෙනවා.
කෙසේ වුවත් මේ මැතිවරණ දිනයේදී ජනාධිපති වෘත්තීය සමිති සම්බන්ධීකරණ අධ්‍යක්ෂක ජෙනරාල් සහ ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරයාත් අතර ගැටුමක් ඇතිවෙනවා. අපි දන්නවා, බොහෝ කාලයක් පුරා අපේ රටේ පාතාලය මෙහෙයවනු ලබන්නේ ආණ්ඩුවේ සමීපතම මන්ත්‍රීවරුන් හා ඇමතිවරුන් විසින්. කුඩු ව්‍යාපාරවලට ආරක්ෂාව දුන්නේත් කුඩු ජාවාරම් කළේත් එම පිරිස්. ගණිකාමඩම් පවත්වාගැනීම් ආදී බොහෝ ක්‍රියාකාරකම්වලට ඔවුන් මැදිහත්වී තිබුණා. එහිදී එක් අවස්ථාවක් තමයි එදා කොළොන්නාවේදී සිදුවී තිබුණේ. විශේෂයෙන් භාරත ලක්ෂ්මන් සහ දුමින්ද සිල්වා අතර ගැටුමින් පෙන්නුම් කරන්නේ මේ තත්ත්වයයි. නීතිවිරෝධී අවි ඇත්තේ කාළගද? පාතාල කණ්ඩායම් ඇසුරු කරන්නේ කවුද? ඒ පාතාල කණ්ඩායම් සාමාන්‍ය ජනතාවට හිරිහැර කර තිබෙන්නේ කොහොමද? එම

ඉල්ලා අස්කර ගන්නවා. ඒ නිසා ආරක්ෂකයින්ට යුනිෆෝම් ඇන්දවීමෙන් මේ ප්‍රශ්නය නිරාකරණය කරගත හැකිවේයැයි සිතන්න බැහැ. දැන් අවශ්‍යවී තිබෙන්නේ, අපේ රටේ නීතියේ හා සාධාරණත්වයේ හිමිකම සෑම කෙනෙකුටම සමාන ලෙස ලැබීමේ ක්‍රමවේදයක් සැකසීමයි. එවැනි සමාජක්‍රමයක් ස්ථාපිත නොවනතාක් ප්‍රචණ්ඩත්වයක් මරාගැනීම් සුලභ අත්දැකීම් වීම වළක්වන්නට බැහැ.

***නියමුවා: ජ.වි.පෙ.න් ඉවත්විය ගිය පිරිසක් ජවිපෙට චෝදනා එල්ලකරමින් සිටිනවා. පක්ෂය තුළ පැනනැගී කණ්ඩායම්වාදය විසින් හානිකරන්නේ පක්ෂයට වඩා නව දේශපාලන ගමනක් පිළිබඳව වන ජනතා අපේක්ෂාවන්ටයි. මේ කණ්ඩායම් බිහිවීමේ පදනම කුමක්ද?***

***අනුර දිසානායක සහෝදරයා:*** රෝහණ විජේවීර සහෝදරයා පෙන්නුම්කර තිබෙනවා ධනපති පංතිය නිර්ධන පංති ව්‍යාපාරයට මෙනතරම් චෝදනා අවලාද එල්ලකළත් ඒවා ජනතාව තේරුම් ගන්නවා. ඒවා ධනපති පංතියේ පිරිස් විසින් ඉදිරිපත් කරන ඒවාය යන දෘෂ්ටිකෝණයෙන් යුතුව ඒවා තේරුම් ගැනීමට ජනතාව සමත්. නමුත් නිර්ධන පංති ව්‍යාපාරයකට එරෙහිව යම් සමාජ මතයක් ගොඩනැගීමේදී නිර්ධන පංති ව්‍යාපාරය තුළ සිටින පිරිස්ම ඊට යොදාගැනීමට ඇතැම්විට ධනපති පංතියට හැකියාව ලැබෙනවා. ඉතිහාසයේත් අපේ පක්ෂය තුළත් ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ අත්දැකීම් තුළත් අපි මේ තත්ත්වය දැක තිබෙනවා. වර්තමානයේත් එය දකිමින් සිටිනවා.

විශේෂයෙන් කණ්ඩායම්වාදය බිහිවීමේදී කරුණු කිහිපයක් බලපානවා. එකක් තමයි දේශපාලනයේ තිබෙන පසුබෑම. ඒ පසුබෑම වී තිබෙන ඓතිහාසික තත්වයත් විෂයමූල වටාපිටාවත් මාක්ස් ලෙනින්වාදී ලෙස නිවැරදි ලෙස විග්‍රහකර ගැනීමට අසමත් වුවහොත් එම පසුබෑම් පිළිබඳව වෙනත් වෙනත් විග්‍රහයන් ඇතිකර ගන්නවා. ඒනිසා දේශපාලන ව්‍යාපාරය තුළ පසුබෑම් ඇතිවීමේදී මෙවැනි කණ්ඩායම් බිහිවීමේ ප්‍රවණතාවක් තිබෙනවා. ඒ වගේම තමයි පුද්ගල පෞරුෂයන් පිළිබඳව ඇතිවන ගැටුම් මේ තත්වයට හේතු වෙනවා. ඒ වගේම තමයි බලය ලබාගැනීම සඳහා තිබෙන ආශාව. විශේෂයෙන් ජ.වි.පෙ තුළ මෑත කාලීනව බිහිවූ කණ්ඩායම්වාදයේ අරමුණ වූයේ ක්‍රමානුකූලව පක්ෂයේ බලය තහවුරු කර ගැනීමයි.

ඒ බලය තහවුරු කර ගන්නේ, නිවැරදි දේශපාලන මතයක් වෙනුවෙන් නෙවෙයි. රෝහණ විජේවීර සහෝදරයාට මුළුමනින්ම පිටුපාපු ජාතික ප්‍රශ්නය පිළිබඳ ස්ථාවරයක සිටිනවා. රෝහණ විජේවීර සහෝදරයා කළ වැදගත්ම කටයුතුවලින් එකක් වන්නේ, ජාතික ගැටලුව පිළිබඳව නිවැරදි ස්ථාවරයක් දැක්මක් ලාංකේය නිර්ධන පංති ව්‍යාපාරයට ලබාදීමයි. නමුත් මේ කණ්ඩායම ඊට වෙනස් ස්ථාවරයක සිට තිබුණා. ඔවුන් ඒ පිළිබඳව මධ්‍යම කාරක සභාව හෝ වෙනත් මණ්ඩල තුළ සාකච්ඡා නොකොට ඉන් පිටත තමන්ට හැසිරවිය හැකි ප්‍රකාශන මගින් එය පැතිරවීමට උත්සාහ කළා.

රෝහණ විජේවීර සහෝදරයාගේ විශේෂත්වය වන්නේ, ජ.වි.පෙ ගොඩනැගීමේදී මාක්ස්වාදය ලංකාවට උචිත පරිදි ගැලපීමට සමත්වීමයි. ඔහු ලංකාවේ සමාජ හැඩගැස්ම නිවැරදි ලෙස තේරුම්ගෙන ඒ තුළ පැළකළ හැකි වෘක්ෂයක් ලෙස ජ.වි.පෙ ගොඩනැගුවා. එහෙත් මොවුන් තමන්ට බලය තිබූ තැනක ප්‍රකාශන මගින් ලංකාවේ තත්වය තේරුම් නොගනිමින් යම් යාන්ත්‍රික පොතේගුරු වාදයකට තල්ලුවීමට තැත්කළා. ලෙනින් සහෝදරයා කී පරිදි න්‍යාය ඇදහිල්ලක්නෙවෙයි. න්‍යාය අවසන් හැඩරුව ගන්නේ එය ප්‍රායෝගිකත්වයට නැංවීම තුළිනුයි. අප තේරුම් ගත යුතු වන්නේ එයයි. එසේ වටහා නොගෙන න්‍යාය ඇදහිල්ලක්



> රෝහණ විජේවීර සහෝදරයා කළ වැදගත්ම කටයුතුවලින් එකක් වන්නේ, ජාතික ගැටලුව පිළිබඳව නිවැරදි ස්ථාවරයක් දැක්මක් ලාංකේය නිර්ධන පංති ව්‍යාපාරයට ලබාදීමයි. නමුත් මේ කණ්ඩායම ඊට වෙනස් ස්ථාවරයක සිට තිබුණා. ඔවුන් ඒ පිළිබඳව මධ්‍යම කාරක සභාව හෝ වෙනත් මණ්ඩල තුළ සාකච්ඡා නොකොට ඉන් පිටත තමන්ට හැසිරවිය හැකි ප්‍රකාශන මගින් එය පැතිරවීමට උත්සාහ කළා.

කොටගෙන යාන්ත්‍රිකව ගැලපීමට දරන උත්සාහයක, ජාතික ගැටලුව පිළිබඳ වැරදි දිශාවන්ට තල්ලුවීම, බලය පිළිබඳ තිබූ ආශාව, ජයග්‍රහණ නොලැබීම නිසා ඇතිවුණු මානසික පසුබෑම ආදී බොහෝ කරුණුවල සංකලනයක් අපි මේ කණ්ඩායම්වාදය තුළ දුටුවා.

***නියමුවා: ජවිපෙ මහජන නියෝජිත භූමිකාව නෙවැදගත් බවත් විශේෂයෙන් පාර්ලිමේන්තුව තුළ ජ.වි.පෙ.ට භූමිකාවක් නැති බවත් විප්ලවවාදීන් යැයි තමන්ව හඳුන්වාගන්නා ඇතැමෙක් ප්‍රකාශ කරනවා. මේක ඇත්තක්ද?***

***අනුර දිසානායක සහෝදරයා:*** විශේෂයෙන් පාර්ලිමේන්තුව නිර්ධන පංති ව්‍යාපාරයන්ට ඉඩ සලසන ආයතනයක් නෙවෙයි. පාර්ලිමේන්තුව, ධනපති ක්‍රමය ජනතාව ඉදිරියේ සුජාත කිරීම සඳහා පවත්වාගෙන යන ආයතනයක්. එය කිසිසේත් ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයක් නොවෙයි. ධනේෂ්වර මතවාදයන් බලහත්කාරයෙන් ජනතාව මත පටවමින් තමන්ට අවශ්‍ය පරිදි බලය අත්පත් කරගැනීම සඳහා සකස්කොට ඇති මැතිවරණ ක්‍රමයක් මගින් බලය අත්පත් කරගත් ආයතනයක්. පාර්ලිමේන්තුව කිසිසේත් අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයක් හෝ රටේ ජනතාවගේ මතය කිසිසේත් පිළිඹිබු කරන්නේ නැහැ.

නමුත් ලෙනින් සහෝදරයා පෙන්වාදී ඇත්තේ, පාර්ලිමේන්තුව තුළත් නිර්ධන පංති ව්‍යාපාරයට අරගලයක් තිබෙන බවයි. ඒ වගේම පාර්ලිමේන්තුව තුළත් නිර්ධන පංති ව්‍යාපාරයේ නායකයන් අත්හදා බැලිය යුතු බව ඔහු කියනවා. විශේෂයෙන් ජනතා විමුක්ති පෙරමුණ පාර්ලිමේන්තුවට සම්බන්ධ වෙන විට හොඳාකාරවම අපි දන්නවා, අපේ රටේ සමාජ පරිවර්තනයක් කළ යුතුයි, ඒ පරිවර්තනය වෙනුවෙන් කම්කරු, ගෙවිජනතාව, ශිෂ්‍ය ප්‍රජාව, රැකියා විරහිත තරුණයින් පෙළගැස්වීම, ඒවගේම දුරස්වී ඇති සිංහල දෙමළ ජනකොටස් එක

*11 වැනි පිටුවට*




# ජ.වි.පෙ. නායකයෝ රැසක් ඝාතනයට ලක්වෙති

1989 නොවැම්බරයේදී රෝහණ විජේවීර සහෝදරයාත් උපතිස්ස ගමනායක සහෝදරයාත් අත්අඩංගුවට ගෙන අත්අඩංගුවේදී මරා දැමීමත් සමග පක්ෂය බරපතළ අර්බුදයකට මුහුණ පෑවේය. 1965 දී ඇරඹි සිය ඉතිහාසය තුළ ජ.වි.පෙ. විටින් විට අර්බුද රැසකට මුහුණදී තිබුණත් පක්ෂය මුහුණ දුන් අතිශය බරපතළම අර්බුදය හා පරාජය වුයේ 1989 දී රෝහණ සහෝදරයා ඝාතනයට ලක්වීම සමග මතුවූ අර්බුදයයි.

රෝහණ විජේවීර සහෝදරයාගෙත් උපතිස්ස ගමනායක සහෝදරයාගෙත් ඝාතනය සැලවීමත් සමග පක්ෂයේ බොහෝ දෙනා මානසික ඇදවැටීමටත් අරගලය පිළිබඳ විශ්වාසය අත්හැරීමේ තත්වයකටත් පත්විය. අත්අඩංගුවේ සිටි හා මේ දිනවල අත්අඩංගුවට පත්වූ සමහරු ජීවිත බේරා ගැනීම සඳහා සතුරා ඉදිරියේ දුර්වලයින් බවට පත්ව තොරතුරු හෙළිකරන තත්වයකටද පත්වූහ. මෙම බිඳවැටීම සිරගෙවල් තුළද යම් පමණකින් තිබිණි. එහෙත් මේ ඉතාම දුෂ්කර තත්වය තුළ පවා විශ්වාසය හා අධිෂ්ඨානය දුර්වල කර නොගත් මෙම දුෂ්කර පැය ධෛර්යයෙන් පියමන් කිරීමට සූදානම් බොහෝ දෙනෙක් පක්ෂය තුළ සිටියෝය. පක්ෂය රැකුණේත් යළි ගොඩ නැගීමට හැකිවුයේත් එවන් සැබෑ විප්ලවවාදීන්ගේ ධෛර්ය හා මැදිහත් වීම නිසාය.

1971 අරගලයේ පරාජය, 1983 පක්ෂ තහනම වැනි බරපතළ අර්බුදවලදී පක්ෂ නායකත්වය සැපයූ හා නිර්මාතෘවරයා වූ රෝහණ විජේවීර සහෝදරයා සතනයට ලක්වීම විසින් නිර්මාණය වූ තත්වය ඉතාම සුවිශේෂී තත්වයක් විය. විජේවීර නොමැති ජනතා විමුක්ති පෙරමුණක් තිබිය නොහැකිය යන තරමට විජේවීර සහෝදරයාගේ නායකත්වය ජ.වි.පෙ. හා බැඳී තිබුණි. එබැවින් 1989 පරාජය සියලු පරාජයන්ට වඩා බරපතළ විය. එහෙත් විජේවීර සහෝදරයා නිර්මාණය කර තිබුණේ තමන් නැති තත්වයක වුවද පවතින හා ඉදිරියට යාහැකි මිනිසුන් සහිත පක්ෂයක් නිසා ජ.වි.පෙ. විනාශ කිරීමේ සතුරන්ගෙ වුවමනාව ඉටුකර ගත නොහැකි විය.

රෝහණ සහෝදරයා අහිමි වීමෙන් පසු පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ අනෙකුත් සහෝදරවරුන් පැවති තත්වය මත අදහස් හුවමාරු කරගනිමින් පක්ෂය ඉදිරියට ගෙනයාම සඳහා පක්ෂයේ නායකත්වයට සමන් පියසිරි ප්‍රනාන්දු සහෝදරයා තෝරා ගන්නා ලදී. ඒ අනුව සමන් පියසිරි සහෝදරයාගේ නායකත්වය යටතේ පක්ෂය සිය කටයුතු ඉදිරියට ගෙනයාමට තීරණය කොට ඒ සඳහා ක්‍රියාත්මක වුවද සමන් පියසිරි සහෝදරයා ඇතුළු සහෝදරවරු කිප දෙනෙක්ම අත්අඩංගුවට පත්ව ඝාතනයට ලක්වීම නිසා පක්ෂය යළි ගොඩ නැගීමේ එම උත්සහය අසාර්ථක විය.

රෝහණ සහෝදරයා ඝාතනය කර මසක් පිරුණු දින පක්ෂය විසින් රට පුරා විරෝධතාවයක් දියත් කරන ලදී. එය සැලකිය යුතු ප්‍රමාණයකින් සාර්ථක වුවද ආණ්ඩුව විසින් දියත් කරමින් තිබූ මර්දනය තුළ අත්අඩංගුවට පත්වීම් හා ඝාතනයට ලක්වීම් දිගටම සිදුවිය. මේ වන විට පක්ෂයේ බොහෝ රහස් හා තොරතුරු පුද්ගල නම්, සංවිධාන රටාවන් ආදී සියල්ල ආණ්ඩුවේ අරක්ෂක අංශ වෙත පත්ව තිබිණි. එය ඔවුන් අතට පත්වූයේ ඔවුන්ගේ දක්ෂතා මත නොව පාවා දෙන්නන්ගේ හා දුර්වලයින්ගේ හෙළිදරව් කිරීම් නිසාය. මෙවැනි තත්වයක් තුළ පියවරක් පසුපසට ගෙන සිදුව තිබූ තත්වය විග්‍රහ කරගෙන සියලු උපක්‍රම වෙනස් කළ යුතුව තිබුණත් එය අවශ්‍ය පමණක කඩිනමින් ඉටුකර ගැනීමට පක්ෂයට නොහැකි විය. අරක්ෂක අංශවල අත්අඩංගුවේ සිටියෙදී රෝහණ සහෝදරයා කළ ප්‍රකාශය තුළින් පවා ඔහු දුන් පණිවිඩය වූයේ ''සියල්ල වෙනස් කරන'' ලෙසය.

එහෙත් එය කඩිනමින් ක්‍රියාවට නැගීමට අසමත් වීම නිසා සතුරා තම මර්දනය දිගටම ගෙන ගියේය.

1990 ජනවාරි අරම්භය වන විටම සමන් පියසිරි සහෝදරයා අත්අඩංගුවට ගැනීමට අරක්ෂක අංශ සමත් විය. ඔහුගෙන් ප්‍රශ්න කරමින් ඔහුට මැරෙන තුරුම පහර දී තිබූ අතර සමන් සහෝදරයා එකදු වචනයක්වත් නොදොඩා මරු වැළඳ ගෙන තිබුණි. එම එම දිනවලම දේශපාලන මණ්ඩල සභිකයකු වූ ලලිත් විජේරත්න සහෝදරයා අත්අඩංගුවට ගෙන මරා දමා තිබුණි. සමන් පියසිරි සහෝදරයා ඝාතනය වන විට පක්ෂයේ නායකත්වය පැවරුණේ ඔහුටය. 1990 ජනවාරි කාලයේදීම දේශපාලන මණ්ඩල සභිකයකු වූ ශාන්ත බණ්ඩාර සහෝදරයා අත්අඩංගුවට ගෙන මත්තගොඩ හමුදා කඳවුරේ දින කිහිපයක් රඳවාගෙන සිට මරා දමන ලදී. ශාන්ත බණ්ඩාර සහෝදරයාද මියගොස් තිබුණේ පක්ෂය පිළිබඳ එකදු වචනයක්වත් සතුරන්ට නොපවසා වීරයකු ලෙසය. මීට අමතරව දේශපාලන මණ්ඩලයේ සෝමවංශ අමරසිංහ සහෝදරයා හැර අනකුත් සියලු සහෝදරවරුන් සති කිහිපයක් තුළ අත්අඩංගුවට ගෙන මරා දැමීමට ආණ්ඩුව සමත්විය. ඒ සමඟ පක්ෂය පත්වූයේ ඉතාම බරපතළ තත්වයකටය.



මෙම මර්දනකාරී හා ඝාතන ක්‍රියාවලියේදී සෝමවංශ අමරසිංහ සහෝදරයා පමණක් ජීවිතය බේරා ගැනීමට සමත්වූ අතර පැවති තත්වයේ බරපතළකම තේරුම් ගෙන කටයුතු කළේය. සියලු තොරතුරු හා ස්ථාන සතුරා අතට පත්ව ඇති තත්වය නිසාත් දුර්වලයින් ආරක්ෂක අංශ සමඟ සැරිසරමින් පාවා දෙමින් සිටි නිසාත් අරක්ෂාව සඳහා විදෙස් ගතවීමට සෝමවංශ අමරසිංහ සහෝදරයා තිරණය කළ අතර 1990 පෙබරවාරි මාර්තු කාලයේ විදේශ ගත විය.

මේ අතර යළිත් වරක් පක්ෂයේ ජීවතුන් අතර සිටි වගකීම් දැරූ සහෝදරවරුන් අතර සම්බන්ධකම් ගොඩනගා ගනිමින් කිසියම් සංවිධානමය ස්වරූපයක් ඇතිකිරිමට ජිනදාස කිතුලේගොඩ සහෝදරයා උත්සාහ කළේය. එහෙත් 1990 නොවැම්බරයේ කිතුලේගොඩ සහෝදරයා අත්අඩංගුවට පත්වීමත් සමග පක්‍ෂය මධ්‍යගත කර ගැනීමේ එම උත්සහයද බිඳ වැටිණි. ඒ සමගම පක්ෂය සංවිධාන මධ්‍යගතභාවයෙන් තොරව විසිරී යමින් තිබුණි.

1991 වනවිට පක්ෂය පැවතියේ විසිරුණු පිරිස් ලෙසටය. සමහරු මර්දනය සමග විදේශ ගතව සිටියෝය. සමහරු සිටියේ සිරගතවය. තවත් සමහර අය කුඩා කුඩා පිරිස් ලෙස වනගතව හෝ රට තුළ සැඟවී සිටින ලදහ. විදේශ ගත වූ සෝමවංශ අමරසිංහ සහෝදරයා විදේශ ගත පිරිස අතර කිසියම් සම්බන්ධයක් ගොඩනගා ගනිමින් ඉතා දුෂ්කර තත්වයක් තුළ විදේශ ගත අය සංවිධාන රටාවක පවත්වාගෙන යාමට කටයුතු කළේය. එසේම රට තුළ සිටි විවිධ කොටස් සමඟ වෙන වෙනමත් සිරගත අය සමගත් සබඳතා පවත්වන ලදී. මේ වන විට තිබූ සංකිර්ණ තත්වය තුළ පාවා දෙන්නන්, ඔත්තුකරුවන්, දුර්වලයන් හැම තැනකම සිටි බැවින් පක්ෂයේ ඉතිරිව ඇති මානව සම්පත මධ්‍යගත කිරීම අනතුරුදායක විය. ඒ නිසාම ඒවා පැවති ස්ථානවල, ප්‍රදේශවල වෙන වෙනම පවතින්නට ඉඩහැර ඒවා සමග වෙන වෙනම සම්බන්ධතා පවත්වාගෙන යනු ලැබීය. එම ක්‍රමය එහි වටපිටාව තුළ අනුගමනය කළ හැකිව තිබූ හොඳම ක්‍රමය විය.

> “මේ වන විට පක්ෂයේ බොහෝ රහස් හා තොරතුරු පුද්ගල නම්, සංවිධාන රටාවන් ආදී සියල්ල ආණ්ඩුවේ අරක්ෂක අංශ වෙත පත්ව තිබිණි. එය ඔවුන් අතට පත්වූයේ ඔවුන්ගේ දක්ෂතා මත නොව පාවා දෙන්නන්ගේ හා දුර්වලයින්ගේ හෙළිදරව් කිරීම් නිසාය.”

මේ අතර ආරක්‍ෂක නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස කටයුතු කළ, ජ.වි.පෙ. මර්දනය කිරිමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටුකළ රන්ජන් විජේරත්න බෝම්බ පිපිරීමකින් 1991 දී මිය ගියේය. එසේම ජනාධිපතිව සිටි ප්‍රේමදාස මහතාද 1993 මැයි 1 දා බෝම්බ ප්‍රහාරයකින් මිය ගියේය. මේ සමගම එ.ජා.ප. ආණ්ඩුවේ මර්දන යාන්ත්‍රණය දුබල විය. අනෙක් අතට ජ.වි.පෙ. ක්‍රියාකාරකම්ද නැවතී තිබුණි. ඒ නිසා දේශපාලන තත්වයේ වෙනසක් ඇති විය. ප්‍රේමදාස ජනාධිපතිවරයා මිය යාමත් සමඟ එවකට අගමැතිව සිටි ඩී.බී. විජේතුංග මහතා ජනාධිපති ධූරයට පත්විය. ඔහු යටතේ මර්දන යාන්ත්‍රණය ලිහිල් වන්නට විය.

එසේම එ.ජා.ප. ආණ්ඩුව විසින් සිදුකළ ඝාතනයන්ට හා අතුරුදහන් කිරීමවලට එරෙහිව ජනතා විරෝධතාවයක්ද මතුවන්නට විය. එම ජනතා විරෝධය සිය දේශපාලන අරමුණු වෙනුවෙන් ශ්‍රී.ල.නි.පය යොදාගෙන තිබුණි. මෙහිදී චන්ද්‍රිකා කුමාරතුංග, මංගල සමරවීර හා මහින්ද රාජපක්‍ෂ යන අය සක්‍රීයව මේ සඳහා කටයුතු කළහ. මෙලෙස දේශපාලනය කෙමෙන් වෙනස් වෙමින් පැවති අතර 1994 දී මහ මැතිවරණය පැවැත්වීමට එ.ජා.ප.යට සිදුවිය. ජ.වි.පෙ. නැවත ප්‍රසිද්ධ දේශපාලනයට ප්‍රවිශ්ඨ වූයේ 1994 මහ මැතිවරණයත් සමගය.

1994 මහ මැතිවරණය හා ඊට ජ.වි.පෙ. ඉදිරිපත්වූ අයුරුත් එහි තිබූ අභියෝග පිළිබඳවත් මීළඟ කලාපයෙන් කථා කරමු.

# අයවැය 2012
# කයිවාරුව හා කෙරුවාව

2012 අයවැය ඉදිරිපත් කිරීමට රාජපක්ෂ සන්ධාන පාලනය ලකලෑස්ති වෙමින් සිටී. පෙරහැර එන බව කියන්නේ කසකාරයින් මෙන් අයවැය එන බව සලකුණු කරමින් සිගරට් මිල අයවැයට කලින්ම වැඩි කළේය. විදුලි බිලද වැඩි නොකර බැරි යැයි කෙඳිරියක් ඇසෙමින් තිබේ.

සාමාන්‍යයෙන් ධනේශ්වර ආණ්ඩුවේ අයවැය කතාව වාර්ෂිකව, සම්ප්‍රදාය ලෙස ඉදිරිපත් කරන කයිවාරු දෙසුමක් බව දුන් පොදු ජනතාවගේද පිළිගැනීම වී ඇත. එහි පළමු පියවර ලෙස විසර්ජන පනත් කෙටුම්පත මේ වන විට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. කයිවාරුවට උත්සව සිරිය දෙන්නේ අයවැයට ඉදිරිපත් කරන අයවැය කතාව තුළින්ය. කයිවාරුවේ තරම 2011 අයවැය කතාව අවසන් කළ අවසන් ඡේදයෙන්ම මනාව පැහැදිලි වෙන්නේය. එහිදී මුදල් ඇමතිවරයා ලෙස අයවැය දෙසුම ඉදිරිපත් කළ මහින්ද රාජපක්ෂ ජනාධිපති මෙසේ කීය. '' ගරු කථානායකතුමනි, අපි ඉදිරි දැක්මක් ඇති අය විය යුතුයි. අපගේ එකම වගකීම වන්නේ හොඳ අනාගතයක් වෙනුවෙන් වර්තමානය කළමනාකරණය කිරීමයි. එය අවස්ථාවන් බොහෝමයක් ඇති අනාගතයක් විය යුතුය. අපේ පවතින වෙනස් මතිමතාන්තර පසෙකට දමා රට මුලින් තබමු. අපේ දරුවන්ගේ අනාගතයට ප්‍රමුඛත්වයක් දෙමු''

මේ කයිවාරුවෙන් කොටසක් පමණය. නමුත් පසුගිය වසර සිහිබුද්ධියෙන් ආපසු හැරී බලන ඕනෑම කෙනෙකුට පෙනී යන සත්‍යයක් ඇත. ඒ මේ සියල්ල කයිවාරු පමණක්ම බවයි. 'ඉදිරි දැක්මක් ඇති විය යුතු' යැයි කීවාට ආණ්ඩුවට හා ආණ්ඩුවේ නායකත්වයට නැත්තේම එයයි. අපගේ වගකීම වන්නේ, හොඳ අනාගතයක් වෙනුවෙන් වර්තමානය කැප කිරීම යැයි කීවාට කරන්නේ, සම්පූර්ණ එහි ප්‍රතිවිරෝධය පමණය. වර්තමානය බලය රැක ගැනීම වෙනුවෙන් මුළු රටේම, මුළු මහත් ජනතාවගේම අනාගතය කැප කරන්නේය. අයවැය මගින් ඉදිරිපත් නොකර දේශය සතු අක්කර දහස් ගණන් බහුජාතික සමාගම්වලට විකිණීමට කටයුතු කරන්නේ වර්තමානයේ බලය රැක ගැනීම වෙනුවෙන්ය. 'අපේ පවතින මතිමාතන්තර පසෙක දමා රට මුලින් තබමු' යැයි කීවාට පළාත් පාලන ඡන්දයේදීත් මරාගන්නේ තමන්ගේ පක්ෂයේ



මිනිසුන්ය. කයිවාරුවට වඩා කෙරුවාව වෙනස් බවට අනන්ත සාක්ෂි එකතු කළ හැකිය.

### 2011 කෙරුවාව

අයවැය කයිවාරුව තරම් කෙරුවාවක් නොමැති බව පසු ගිය වසරට ඉදිරිපත් කළ අයවැය යෝජනාවලින් ක්‍රියාත්මක වූ සහ ක්‍රියාත්මක නොකළ යෝජනා පිළිබඳව අධ්‍යයනය කරන විට හොඳින්ම පෙනී යයි. අයවැයක් ඉදිරිපත් කළත් නොකළත් රටක් වසරක් පවත්වා ගෙන යාමේදී දැරිය යුතු අනිවාර්ය වියදම් ඇත්තේය. වැටුප් ගෙවීම, සෞඛ්‍ය සඳහා, අධ්‍යාපනය සඳහා වියදම් දැරීම, රටේ පරිපාලන කටයුතු පවත්වා ගෙන යාම, ආරක්ෂාව සැලසීම එවැනි දේය. ඒ අනිවාර්ය වියදම් සඳහා ඕනෑම ආණ්ඩුවක් ජනතාවගෙන්ම බදු අය කරයි. ලංකාවේ රාජ්‍ය ආදායමෙන් 90%ක්ම බදු ආදායම මගින් උපයා ගන්නේ ඒ වෙනුවෙනි.

**2011 අයවැය යෝජනා තුළ ඉදිරිපත් කළ නමුත් ක්‍රියාත්මක නොකළ යෝජනා**

රු. මිලියන

| | |
|---|---|
| 1. වැඩිහිටි, ආබාධිත, ත්‍රස්තවාදයට ගොදුරුවූ සහ අවදානම්වලට භාජනය විය හැකි ජනතාවන්ට සුභසාධනයට | 1000 |
| 2. ග්‍රාමීය ප්‍රදේශ වල පෙර පාසල් ප්‍රවර්ධනයට | 200 |
| 3. ''මතට තිත'' වැඩසටහන පුළුල් කිරීමට | 200 |
| 4. වැටුප් සහ විශ්‍රාම වැටුප් සංශෝධනයට (මෙහි විශ්‍රාම වැටුප් සංශෝධනයට උද්ඝෝෂණය කියා නතර විය) | 33,000 |
| 5. විදේශ රැකියා නියුක්තියකයින්ගේ විශ්‍රාම අරමුදල | 1000 |
| 6. අසංවිධිත අංශය සඳහා පුරවැසි විශ්‍රාම වැටුප් රක්ෂණ අරමුදල | 1000 |
| 7. මෑත කාලීනව ස්ථාපිත කල විශ්වවිද්‍යාල පහසුකම් නැංවීම | 1000 |
| 8. ජාතික විශ්වවිදාල ජාත්‍යන්තර පිළිගැනීමට ප්‍රවර්ධනය | 600 |
| 9. බෝ නොවන රෝග (ඩෙංගු) වැළැක්වීම | 900 |
| 10. අනතුරට පත් හමුදා සෙබළ පවුලක තුන්වන දරු උපතටරු. 100,000ක් දීම | 1200 |
| 11. මාධ්‍යවේදීන්ට පරිඝනක ලබාදීමට | 50 |
| 12. අධිකරණවල නඩු විසඳීම කඩිනම් කිරීමේ තුන් අවුරුදු වැඩ සටහන | 50 |

නමුත් ආණ්ඩුවේ පුරාජේරු කයිවාරු පෙළ ගැහෙන්නේ ඒ අනිවාර්ය වියදම් මගින් නොවේය. පසුගිය වසරේදී ජනමාධ්‍ය සිරස්තල පවා පළවූ අයවැය යෝජනා කිහිපයක්ම ඉටු නොකිරීමෙන්ය.

අනතුරට පත්වූ ආරක්ෂක සේවයේ නියුතු පවුල්වල තුන්වන දරු උපතට රු. 100,000 යක් පිරිනැමීම එවැන්නකි. ඒ වෙනුවෙන් රු. කෝටි 120ක් අයවැයෙන් වෙන් කරන ලද්දේය. නමුත් එවැනි අපූරු තිළිණයක් ලබා දුන් එකම දරු සිඟිත්තෙකු අඩු තරමේ ජනමාධ්‍යයකවත් පෙන්නුවේ නැත. එවැනි තුන්වන දරු උපතකට රු. 100,000යක් ගෙව්වේ නම් මේ ආණ්ඩුව මාධ්‍ය මගින් නොපෙන්නා ඉන්නේද නැත.

නව විශ්‍රාම වැටුප් ක්‍රමයද හඳුන්වා දෙමින් වැටුප් විෂමතා ඉවත් කිරීමට එවැනි විශාල ප්‍රචාරයක් ලබාදුන් යෝජනාවකි. නමුත් අවසානයේදී වැඩකරන ජනතාවගේ උද්ඝෝෂණයන්ගේ ප්‍රතිඵල ලෙස එම ඊනියා විශ්‍රාම වැටුප් උගුල මගින් අර්ථසාධක කප්පාදුව ඉවත් කර ගැනීමට ආණ්ඩුවට සිදුවිය. ඒ වෙනුවෙන් වෙන්කල මුදල රු.කෝටි 3300කි. විදේශ රැකියා නියුක්තිකයින්ට ඔවුන්ගේද දායකත්වය සහිතව විශ්‍රාම අරමුදලක් හැදීම තවත් එවැනිම යෝජනාවකි. ඒ වෙනුවෙන්ද රු.මිලියන 1000ක් (කෝටි 100ක්) වෙන් කරන ලදී. එම යෝජනාවද ක්‍රියාත්මක නොවීය.

වැඩිහිටියන්ට පිංපඩි දීමනාව වැඩ කිරීමද පසුගිය අයවැයේ පැවැති කයිවාරුවකි. රු.මිලියන 750ක් ඒ වෙනුවෙන් වෙන් කළද එවැනි පිංපඩි දීමනා සංශෝධනයක් පසුගිය වසරේදී සිදු නොවූ බව අදාල ඇමතිවරයා පාර්ලිමේන්තුවේදී 2011-අගෝස්තු 26 ලබා දුන් පිළිතුරකම සඳහන්ය.

මෑත කාලීනව ස්ථාපිත කළ විශ්වවිාලවල පහසුකම් නැංවීමට රු. මිලියන 1000ක් වෙන් කළ අතර, ජාතික විශ්ව විද්‍යාල සඳහා ජාත්‍යන්තර පිළිගැනීම ප්‍රවර්ධනය කිරීමටද තවත් මිලියන 600ක් වෙන් කරන ලදී. නමුත් වසර අවසන් වන විට සත්‍ය ලෙසම ජාත්‍යන්තර පිළිගැනීම ඇත්තේ, ජාතික විශ්වවිද්‍යාලවලටද, නැත්නම් ආණ්ඩුව අලුතින් අනුග්‍රහ දක්වා අටවන ලද මාලබේ පෞද්ගලික විශ්වවිද්‍යාලයටදැයි ජනතාව කල්පනා කළ යුතුය.

බෝ නොවන රෝග වැළැක්වීමට ආණ්ඩුව පසු ගිය වසරේදී අයවැයෙන් වෙන් කළ මුදල රු. මිලියන 900කි. (කෝටි 90) නමුත් ඩෙංගු රෝගීන් වැඩිම ප්‍රමාණයක් වාර්තා වුයේද පසු ගිය වසරේදීය. වැඩිම රෝගීන් වැළඳීමෙන් මිය ගියේද පසු ගිය වසරේදීය. ආණ්ඩුවේ අයවැය කයිවාරු හා කෙරුවාවේ තරම එහෙමය.

**අයවැයට එකතු වන විදෙස් ණය බර (රුෑමිලියන)**

| විදෙස් ණය | 2008 | 2009 | 2010 |
|---|---|---|---|
| බහු පාර්ශ්වීය ණය | 618,181 | 665,040 | 674,936 |
| ද්වී පාර්ශ්වීය ණය | 666,533 | 684,750 | 739,213 |
| මූල්‍ය වෙළඳපොළ ණය | 164,020 | 410,677 | 610,433 |
| මුළු ණය | 1.448,734 | 1,760,467 | 2024,583 |

මතට තිත ක්‍රියාත්මක කිරීම පුළුල් කිරීමටද තවත් අමතර මිලියන 200ක් වෙන් කළේය. ග්‍රාමීය ප්‍රදේශවල පෙර පාසල් ප්‍රවර්ධනයට වෙන් කළ මුදල රු. මිලියන 200කි. නමුත් ඒවා මුදල් වෙන් කිරීමට හා අයවැය ඉදිරිපත් කළ පසුගිය වසරේදී ඒ දින කිහිපයේ ජනමාධ්‍ය සඳහා පුවත් මැවීමට පමණක් සීමාවිය. රටේ සාමාන්‍ය ජනයා මෙන්ම ජනමාධ්‍යවේදීන්ද තාවකාලිකව සතුටු කිරීමට මාධ්‍යවේදීන්ට පරිඝණක ලබා දෙන්නේ යැයි කියා තවත් රු. මිලියන 50ක්ද වෙන් කළේය. මේ සියල්ල ආණ්ඩුවේ අයවැය කයිවාරු පමණක් විය.


අයවැය මගින් යෝජිත ජනතාවට බලපාන වියදම් යෝජනා එසේ ක්‍රියාත්මක නොකර හමස් පෙට්ටියට හා මාධ්‍ය කයිවාරුවට සීමා වුවද ආණ්ඩුවේ ආදායම එකතු කරන යෝජනා අයවැයෙන් ඉදිරිපත් කරන තරමටවත් වඩා වැඩිපුර ක්‍රියාවට නගන්නේය. ආණ්ඩුව අයවැය මගින් ජාතිය ගොඩනැගීමට බදු දැළ පුළුල් කළේය. ජාත්‍යන්තර දුරකථන ගාස්තු සඳහා අයකිරීම වැඩි කළේය. සංචාරක හෝටල් සඳහා ඇඳ බද්දේ සිට බොහෝ බදු අයකිරීමට යෝජනා කළේය. ඒවා ක්‍රියාත්මක කළේය. ගෑස් මිළ ඉහළ දැම්මේ, බස් ගාස්තු වැඩි කළේ මෙම අයවැය යෝජනාවලට අමතරවය. ගෝල්පේස් පිටිය ෂැංග්‍රිලා හෝටල් සමූහයට අලෙවි කිරීමෙන් ආණ්ඩුව ලබන ආදායම අයවැය යෝජනාවල අඩංගු නොවුණේය. ඒවා අයවැයට පිටින් ලබන ආදායම්ය.

### 2012 කයිවාරුව

ආණ්ඩුව 2012 අයවැය ඉදිරිපත් කිරීමට උත්සාහ කරන්නේද 2011 දී මෙන්ම සංවර්ධන පුරාජේරුවක් සමග බව සැකයක් නැත. 2011 දී අයවැය හිඟය පියවා ගැනීමට පමණක් රු. බිලියන 328ක් ණය ගැනීමට ආණ්ඩුවට සිදුව ඇත. 2011 දී අයවැය අනුව ණය ගැනීම හැර මුළු ලැබීම රු.බිලියන 986.1ක් යැයි ගණනය කරන විට අපේක්ෂා කළ මුළු ණය ගැනීමේ අවශ්‍යතාවය රු. බිලියන 1024.7කි. (2011 අයවැය) නමුත් දුන් ඒ ප්‍රමාණය ඉක්මවා ගොස්ය. ආණ්ඩුව කොතරම් කයිවාරු ගැසුවද ණය මිස රජයට ලැබී ඇති ප්‍රදානයන් (ණය නොවන ආධාර) සීඝ්‍ර ලෙස පහත බැස ඇත. 2010 දී ලද විදේශ ප්‍රදාන රු. බිලියන 16.9කි. එය කලින් වසරට වඩා 34.8%ක අඩුවීමකි.

ණය අර්බුදයක රට ගිලී යමින් තිබියදී රාජපක්ෂ පාලනය යළි යළිත් විශ්වාසය තබා ඇත්තේද ණය මතම බව මෙවර අයවැයට අදාල විසර්ජන පනතද සාක්ෂි දරයි. ඉදිරි වසරේද ණය ලෙස ලබා ගැනීමට අපේක්ෂිත ප්‍රමාණය රු. කෝටි 115,000ක් වේ යැයි ආණ්ඩුව ගණනය කර

11 වැනි පිටුවට



සමාජවාදය ගොඩනැගීම රඳා පවත්නේ කම්කරු ශ්‍රම ශක්තියේ ප්‍රතිඵලයක් වශයෙන්ද නිෂ්පාදන දියුණුව සහ ශ්‍රමඵලදායිතාවයේ හැකියාවද මතයි. අපේ නිෂ්පාදන ධාරිතාවය දියුණු කිරීමට නොහැකි වන්නේ නම් අපට පාරිභෝගික ද්‍රව්‍ය නොමැති නම් අපේ හෘද සාක්ෂිය සංවර්ධනය කිරීම අපහසු කාර්යයක් වනු ඇත.

**අර්නර්ටෝ චේ ගුවේරා**







# කොමිස් මුදලට යටවී දුම්රිය මගින් මරාදැමීම

ශ්‍රමය සුරාකෑමත්, සම්පත් කොල්ලකෑමත්, වංචාව දූෂණය නාස්තියත් එක් තැන් කරනු ලැබූ ධනපති ක්‍රමය ක්‍රියාවට නගන්නා වූ ඕනෑම ක්‍රියාමාර්ගයක් හමුවේ සාමාන්‍ය ජනතාව පීඩාවට පත්වීම අනිවාර්ය ප්‍රතිඵලයකි. වසර 64 ක් පුරා මාරුවෙන් මාරුවට ක්‍රියාත්මක වන අප රටේ ධනපති ක්‍රමයද මෙරට ජනතාවට උරුම කර දී ඇත්තේ අධික ණය බරත්, මන්ද පෝෂණයත්, දිළිඳුකමත් පමණි. තම පැවැත්ම වෙනුවෙන් ශ්‍රමය සූරාකනු ලබන වත්මන් මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ අධිරාජ්‍යගැති ආණ්ඩුව, විවිධ රටවල් සිදුකරන සම්පත් කොල්ලයට ඉඩ දෙමින් තම පැවැත්ම තහවුරු කරගන්නා අතර වංචාව, දූෂණය හා නාස්තිය මගින්ද රට හිඟමනට ඇද දමමින් සිටී. මේ බව මනාව තහවුරු වන සිද්ධීන් කිහිපයක්ම පසුගිය දින කිහිපය තුළ අපට දැක ගත හැකි විය.

විටෙක බාල බිත්තර ගෙන්වනු ලැබූ ආණ්ඩුව තවත් විටෙක බාල පෙට්රල් ගෙන්වනු ලැබීය. එතැනින් නොනැවතුන කොල්ලකාරී පාලකයින් තවත් මොහොතක බාල සිමෙන්ති ගෙන්වනු ලැබූ අතර එය දැන් රාජපක්ෂ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වන තරමටම ඉදිරියට පැමිණ තිබේ. එහි අලුත්ම සාකච්ඡාව කරළිගත වී ඇත්තේ ඉන්දියාවෙන් ගෙන්වන ලද බාල දුම්රිය බලවේග කට්ටල පිළිබඳවයි. ජනතාව බිල්ලට දෙමින් මෙරටට ඉන්දියාවෙන් ගෙන්වනු ලැබූ එස්- 11 බලවේග කට්ටල සිද්ධිය සමාජය තුළ සාකච්ඡාවට බඳුන් වූ කරුණකි. මෙය වඩාත් කතා බහට ලක් වූයේ පසුගිය සැප්ः 17 දින අලව්ව දුම්රිය ස්ථානය අසල සිදු වූ දුම්රිය අනතුරත් සමඟින්ය.

මෙම එස්-11 බලවේග කට්ටල් මෙරටට ගෙන්වනු ලබන්නේද පරාධීන ආර්ථිකයේ ප්‍රතිඵලයක් ලෙසය. 2008 වර්ෂයේ ඉන්දියානු රජය සමඟ වත්මන් ආණ්ඩුව අත්සන් කරනු ලැබූ රටත් ජනතාවත් බිල්ලට දීමේ ගිවිසුම අනුව ඇමරිකන් ඩොලර් මිලියන 165 ණයක් ලබාගන්නා ලදී. මෙම ගිවිසුම අනුව ඇමරිකන් ඩොලර් මිලියන 165 ක ණය මුදල වෙනුවට ඉන්දියාව ලබාදෙන්නේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් සහ සේවා කටයුතු සඳහා අවශ්‍ය උපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ අමතර කොටස් වේ. ඒ අනුව ඉන්දියාවේ නිෂ්පාදිත එස් -11 වර්ගයේ බලවේග කට්ටිල 15 ක් ලබාගන්නා අතර ඉන් බලවේග කට්ටල 4 ක් 2011 වසරේදී ගෙන්වා දුම්රිය ධාවනයට එක්කරන ලදී.

මෙම දුම්රිය ගෙන්වීමෙන් පසු පරීක්ෂා කළ අපේ දුම්රිය ඉංජිනේරුවන්ගේ නිගමනය වූයේ මෙකී දුම්රිය කට්ටලවල තිරිංග ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් තමන්ට සෑහීමකට පත්විය නොහැකි බවයි. බලවේග කට්ටලවල නිමාවේ සිට තාක්ෂණික දෝෂ සම්බන්ධයෙන් වෘත්තීය සමිතිද කරුණු ඉදිරිපත් කළ අතර එහිදී සමස්ත ලංකා දුම්රිය සේවකයින්ගේ පොදු සේවක සංගමය ඉදිරිපෙළ කාර්යයක නියලෙමින් මෙම හෙළිදරව් කිරීම් සිදුකළද ඒ ගැන තැකීමක් නොකළ වත්මන් දූෂිත ආණ්ඩුවේ වගකිවයුත්තන් එස්-11 බලවේග කට්ටල දුම්රිය ධාවනයට එක්කළ අතර මාතර සිට කොළඹ බලා ධාවනය මංගල දුම්රිය අතරමග ක්‍රියා විරහිත වූ අතර පැය දෙකක් පමණ යනතුරු දුම්රිය ක්‍රියා විරහිතවීමට වීමට හේතුව පවා සොයා ගැනීමට නොහැකි විය. එස් -11 දුම්රිය සිය මංගල ගමනේදි ක්‍රියා විරහිත වීමත් සමඟම ගෙන්වීමට නියමිත ඉතිරි දුම්රියයන් ගෙන්වීම නතර කරන බවට ප්‍රවාහන අමාත්‍යවරයා ප්‍රකාශ කළද ඉන් සති දෙකක් ඉක්ම යාමට ප්‍රථමයෙන් එස් - 11 තවත් දුම්රියක් ලංකාවට එවීමට ඉන්දියානු රයිට්ස් සමාගම කටයුතු කරන ලදී.

සැප්ः17 දින අලව්ව දුම්රිය ස්ථානය අසලදී එස්-11 දුම්රිය අනතුර සිදුවූ අවස්ථාවේ ඉදිරිපස දුම්රියේ ගමන් කළ විදෙස් ජාතිකයාට අමතරව එස්-11 දුම්රියේ සේවය කරන ලද රියදුරු සහ සහායක එම ස්ථානයේම ජීවිතක්ෂයට පත් වූහ. ඔවුන්ගේ දේහයන් තිබුනේ රියදුරු කුටියේ නොව ආසන්නයේ ඇති නියාමක කුටියේය. ඕනෑම කෙනෙකු පදවන වාහනයක් කිසියම් අනතුරකට ලක්වෙන්නේ නම් ක්ෂණිකව රියදුරු සිදුකරන්නේ තිරිංග ක්‍රියාත්මක කිරීමය. ඔවුන් ඊළඟ තීරණයට එළඹෙන්නේ තිරිංග පිළිබඳ විශ්වාසය නැතිවීමෙන් පසුය. මෙම දුම්රියේ රියදුරු සහ සහායකට සිදුවී ඇත්තේ එවැනි දෙයක් නොවේ යැයි සැකයකින් තොරව බැහැර කළ නොහැක. මෙම සිද්ධියේදි අනතුරේ වගකීම රියදුරා යැයි උපකල්පනය කළත්, එස් - 11 දුම්රිය නියමිත ප්‍රමිතියෙන් යුත් දුම්රියක් වූයේ නම් අනතුරට පත් වන මොහොතේ පැයට කිලෝමීටර් 26 වැනි අඩු වේගයකින් ධාවනය එස් - 11 දුම්රියටත්, ඉදිරිපස දුම්රියටත් සහ ජීවිත 03 ක් අහිමිවීම සහ විශාල පිරිසක් අනතුරට භාජනය වීම වළක්වා ගැනීමට හැකියාව තිබුණි.

මෙම එස්-11 දුම්රියන් ඉන්දියාවෙන් ගෙන්වීමේදී සුදු යකඩ ලෝහයෙන් ඉදිරිපස

> මගී ජීවිත සිය ගණනක් රැගෙන යන දුම්රියක තිබිය යුතු උපරිම ආරක්ෂාව පාලකයින්ට ලැබෙන සන්තෝෂම් හමුවේ නොසලකා හැරීම විසින් වටිනා ජීවිත කිහිපයක් සහ මිලියන 70 ක පමණ දේපළ හානියක් සිදු වී ඇත.

ආවරණය සකස් කිරීම ගිවිසුම අනුව සිදු කළ යුතු වුවද, එය ෆයිබර් දක්වා පරිවර්තනය වීම විසින් අනතුරේ හානිය වැඩි වී ඇත. අනතුර සිදු වූ අවස්ථාවේ පසුපසින් පැමිණි දුම්රිය ඉදිරිපස දුම්රිය ඇතුළට පැමිණ තිබූ අකාරය අප දුටුවෙමු.

මෙරටට ගෙන්වනු ලබන සෑම දුම්රියක්ම රේල් පීල්ලේ සිට අඩි 3 අඟල් 5.5 ලෙස තිබිය යුතු වුවද මෙරටට ගෙන්වීමේදි එස් -11 බලවේග දුම්රිය මෙකී ප්‍රමිතියෙන් තිබී නැත. එකිනෙක දුම්රියන්වල උස සමාන තත්වයේ පැවතීම විසින් මෙවැනි අනතුරකදී ඉදිරිපස ඇති කව් කැචර් එකට ගැටීම විසින් සිදුවන හානිය අවම කරගැනීමට හැකි වුවත් මෙම දුම්රියේ උස පිළිබඳ ප්‍රශ්නය නිසා සිදු වූ ජීවිත සහ දේපළ හානිය වැඩි වී ඇත.

මගී ජීවිත සිය ගණනක් රැගෙන යන දුම්රියක තිබිය යුතු උපරිම ආරක්ෂාව පාලකයින්ට ලැබෙන සන්තෝෂම් හමුවේ නොසලකා හැරීම විසින් වටිනා ජීවිත කිහිපයක් සහ මිලියන 70 ක පමණ දේපළ හානියක් සිදු වී ඇත.

සැප්ः 17 දින අනතුර සිදු වී දින තුනකට පසු අමාත්‍යවරයා ප්‍රකාශ කරනු ලැබුවේ මේ පිළිබඳ සොයා බැලීමට කමිටුවක් පත්කරන බවත් සති දෙකක් ඇතුලත වාර්තාව එළිදක්වන බවත්ය. මේ වන විට මාස එකහාමාරක් පමණ ගත වී ඇතත් කමිටු වාර්තාවක් එළි දක්වා නොමැත. නඩුත් හාමුදුරුවන්ගේ බඩුත් හාමුදුරුවන්ගේ යැයි කියමින් ජනතාවට ඉවත බලා සිටිය නොහැක. මක් නිසාද යත් නඩු හාමුදුරුවන්ගේ වුවාට බඩු ජනතාවගේ නිසාය. වගකිවයුතු ඉංජිනේරුවන් මෙන්ම තාක්ෂණ ශිල්පීන්ද, වෘත්තීය සමිති නියෝජිතයින්ද විවිධ මානයන්ගෙන් මෙහි අසාර්ථකභාවය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළද ඒවා බාර ගැනීමට තරම් රට ගැන කැක්කුමක් හෝ ජනතාව ගැන වේදනාවක් හෝ නැති පාලකයෝ සූදානම් වන්නේ නැත. ඒ වෙනුවට තමන්ට ලැබෙන කොමිස් මුදල ගැන පමණක් සිතමින් මෙම බලවේග කට්ටල ගෙන්වා ඇති බවට දැන් දැන් තොරතුරු හෙළිවෙමින් තිබේ. මෙම බාල දුම්රිය බලවේග කට්ටල ඉන්දියානු රජය එරට ධාවනයට නුසුදුසු යැයි තත්ව පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කොට ඉවත් කරන ලද ඒවාය. ඉන්දියාවේ රයිට්ස් නම් සමාගම විසින් මෙම බලවේග කට්ටල සම්පූර්ණ කැලි සවිකිරීම්, සිදුකරනු ලදුව ප්‍රමිතියෙන් බාල නිසා එරටදී ප්‍රතික්ෂේපවීම හේතුවෙන් මෙරටට විකිණීමට එම සමාගම තීරණය කොට ඇත්තේ අතිවිශාල මුදලක් කොමිස් ලෙස ගනුදෙනුව කරන අයට ලබාදීමට රයිට්ස් සමාගම එකඟවීම නිසාය. මුදල් බලය සමාජමය වටිනාකම් බවට පටු වූ විට දී එය නීතියෙන් ආවරණය කිරීමට කටයුතු කරන පාලකයන් සිටින විටදී ජනතාවගේ අයිතිය මිනී පෙට්ටියකට තල්ලුවීම වැලැක්විය නොහැකි වනු ඇත. එබැවින් තම අයිතිය සුරක්ෂිත කරගැනීම වෙනුවෙන් එවන් පාලකයන්ට එරෙහිව මෙන්ම එවැනි පාලන ක්‍රමයන්ට එරෙහිවද නැගී සිටීමේ අයිතිය ජනතාව ගත යුතුව ඇත.

ලෙඩ රෝග විපත් උපදවන කණු වි දුගද හමන පල් වු වල ඉවත් නොකොට ලෙඩ රෝගවලින් ආරක්ෂාවිය නොහැක. මෙරට ජනතාව ණයකාරයින් බවට පත්කරන, අප රට විදෙස් රටවල සොහොන් පිටියක් බවට පත්කරන කොල්ලකාරී ආර්ථික පිළිවෙත සැබෑ ලෙස හඳුනාගෙන පරාජය නොකරන්නේනම් බාල බඩු හේතුවෙන් හෙට දවසේත් තව තවත් ජීවිත විනාශ වෙනු ඇත. එබැවින් වත්ත බද්දට දී ඇස්සට දත නියවනවා වෙනුවට කොල්ලකාරී ආර්ථික ක්‍රමය මුලුමනින්ම පරාජය කිරීම සඳහා අවබෝධයෙන් යුතුව පෙරට පැමිණීම සැමගේ වගකීමක් වනු ඇත.



# 22 වන ඉල්මහ සමරුව

නොයෙකුත් දාර්ශනිකයන්, චින්තකයන් විවිධාකාරයෙන් ලෝකය විග්‍රහකිරීම වෙනුවට වෙනස් කිරීම අවශ්‍යව ඇති බව ශ්‍රේෂ්ඨ ගුරුවර කාල් මාක්ස් පෙන්වා දුන්නේ 19 වන සියවස මැද භාගයේදීය.

සියවසකට පසු 20 වැනි ශතවර්ෂයේ මැද භාගය වනවිට මෙම ප්‍රකාශයේ වලංගුභාවය ලෝකයට ඉතා තදින් දැනෙමින් තිබිණ. ශ්‍රී ලංකාවද ඒ අතර මුලින්ම සිටියේය. ඒ 1960 දශකයේ මැද භාගයයි විරැකියාව, වසංගතරෝග, ආහාර අහේණිය, අධ්‍යාපනයේ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක අවස්ථා පුළුල් නොවීම, සම්පත් බෙදීයාමේ අසාධාරණය පුළුල් වීම, දෙමළ මුස්ලිම් මැලේ බර්ගර් ජාතිකත්වයන්ට, අනන්‍යවූ ප්‍රශ්න වර්ධනයවීම සහ විශේෂයෙන්ම ඉන්දීය සම්භවයක් සහිත වතු කම්කරු ජනයා වහල් සූරාකෑමට යටත්කර තිබීම ලාංකේය සමාජයේ අර්බුද දෘෂ්‍යමානව තිබූ ආකාර වූයේය. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ පසු ගෙවී තිබූ දශක 1 1/2 තුළ එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ වමේ දේශපාලන හවුල් ආණ්ඩු රට පාලනය කර තිබිණ. අධිරාජ්‍යවාදීන්ගෙන් පසු ඒජන්තයා වූ එක්සත් ජාතික පක්ෂය අවම වශයෙන් වසර 8ක් පමණ සහ පෙනුමින් ජාතිකවාදී වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමග හවුල් ආණ්ඩු අවම වශයෙන් වසර 9ක් පමණ වශයෙනි.

මෙම කාලය තුළ ජනතාවගේ අපේක්ෂා බිඳවැටීමේ තරම කොතෙක් වූයේද යන්න සහ ආර්ථික දේශපාලනික පීඩනයේ තරම කොතෙක් වැඩිවී තිබුණේද යන්න පැහැදිලි වන්නේ 1953 අගෝස්තුවේ සිදුවූ ජනතා නැගිටීම තුළිනි. ''1953 හර්තාලය'' යනුවෙන් හැඳින්වෙන්නේ මෙම නැගිටීමයි.

ඒ වනවිට සමාජයෙන් දෘශ්‍යමානවූ අර්බුද සියල්ල ඇතිවූ දේශපාලනික වාස්තවිකත්වයක් තිබිණ. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ සෘජු සූරාකෑම නව යටත්විජිතවාදී උපායමාර්ග දක්වා මාරුවෙමින් තිබීම, පසුගාමී අවවර්ධිත ධනපති ක්‍රමය, ආසියාතික වැඩවසම් නෂ්ඨාවශේෂවල ප්‍රබලතාව සහ සාම්ප්‍රදායික වම, ධනපති හවුල් දේශපාලනය දක්වා පසුබැස තිබීම වැනි ප්‍රමුඛ කරුණු නිසා ශ්‍රී ලාංකේය සමාජය බහුවිධ අර්බුද සුලියක් කරා ඇදී යමින් තිබිණ.

මෙම තත්වය වෙනස් කළයුතු විය. එය සරල මතුපිට වෙනසක් නොවේ. සමාජ, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික යන සියලු අංශවල ගැඹුරු පරිවර්තනයක් වී තිබිණ. එවැනි පරිවර්තනයක් ඕපපාතිකව ඇති නොවේ. එය නිවැරැදි සැලසුමක් අනුව කළයුතුය. එවැනි ගැඹුරු පරිවර්තනයක් කිරීම සපුමල් කුමාර සංකල්පවලට හෝ වෙනත් එවැනිවූ ගැලවුම් කරුවන් පිළිබඳ අපේක්ෂාවලට කළ නොහැකිය. ඒ සඳහා මැනවින් සංවිධානය වූ දේශපාලන ව්‍යාපාරයක් අවශ්‍යමය.

1964 පමණ වන විට වයස අවුරුදු 21 ක් වූ දොන් නන්දසිරි විජේවීර නම් තරුණයා එම දේශපාලන ව්‍යාපාරය පිළිබඳ අවශ්‍යතාවය මැනවින් අවබෝධ කරගෙන සිටියේය. පවත්නා තත්වයන් පිළිබඳ හාන්සිපුටු විප්ලවවාදී විග්‍රහ විශ්ලේෂණ නොව එම තත්වයන් ගැඹුරින් වෙනස් කිරීමට අවශ්‍ය බව තේරුම්ගෙන සිටි ඔහු ඒ අනුව ක්‍රියාකාරී විය. මෙම ව්‍යායාමය කිසිසේත්ම ලෙහෙසි පහසු කටයුත්තක් නොවන බවද ඔහු මැනවින් තේරුම්ගෙන සිටියේය. එම තේරුම් ගැනීම සහ ක්‍රියාකිරීම වෙනුවෙන් මේ තරුණයා සිය පුද්ගලික ජීවිතය සම්පූර්ණයෙන්ම අත්හළේය. සෝවියට් දේශයේ ලුමුම්බා විශ්වවිද්‍යාලයෙන් වෛද්‍ය උපාධිය ලබා මෙරටට පැමිණ වෛද්‍යවරයෙකු ලෙස එක් එක් රෝගීන්ගේ ශාරීරික සෞඛ්‍ය පරීක්ෂාකර වෛද්‍ය ප්‍රතිකාර නිර්දේශ කරනවාට වඩා අතිශය බරපතළ ඛේදජනක දේශපාලන තත්වයකට ඇද වැටෙමින් තිබෙණ. මුළුමහත් සමාජයකට ප්‍රතිකාර කර සුවපත් කිරීම වෙනුවෙන් වූ වගකීම දෙවරක් නොසිතාම ස්වේච්ඡාවෙන් තමන්වෙත පවරා ගත්තේය.

එතැන්සිට ඉදිරියට වූයේ අතිශය දුෂ්කර තත්වයන් සැහැල්ලුවෙන් විඳදරාගත හැකි වූවන්ට පමණක් යාහැකි ගමනකි. එතැන්සිට ඉදිරියට වූයේ කිසිම දෙයකින් කිසිම ආකාරයකින් නොපසුබස්නා ධෛර්යකින් යුක්තවූවන්ට පමණක් යාහැකි ගමනකි. එතැන් සිට ඉදිරියට වූයේ අතිශයෙන්ම වේදනා සහගත් මර්දනය හමුවේ පවා පසුබැස නොයන්නන්ට පමණක් යාහැකි වූ ගමනකි. එතැන් සිට වූයේ දරුණු පරාජයන්හිදී පවා ජයග්‍රහණයන් පිළිබඳ දැඩි අපේක්ෂා සහගතව ඉදිරියට යාහැකි වූවන්ට පමණක් යාහැකි ගමනකි. එතැන් සිට වූයේ අතිශය සමීපතමයන්ගෙන් පවා නින්දා අපහාස ගැරහුම් එල්ලවෙද්දී නොසැලී මුහුණදී ඉදිරියට යායුතු අතිශය දුෂ්කර ගමනකි.

වයස අවුරුදු 21ක් වූ දොන් නන්දසිරි විජේවීර තරුණයා මේ සියල්ලට ඉතා හොඳින් සූදානම්ව සිටියේය. අතිශය සමීපතමයන්ගෙන් පවා මොනම ආකාරයකවත් කීර්ති ප්‍රශංසා නොලබා නොඅසා නොවිඳ පංතිමය වගකීම වෙනුවෙන් කැපවීමේ දැඩි අධිෂ්ඨාන සහය ධෛර්යෙන් යුතුව 1964 දී ඓතිහාසික කාර්යකට මුලපිරීමය. එතැන්සිට වසර 4 හෝ 5 ක් පුරා විප්ලවවාදියෙකුගේ ඉවසීමේ ශක්තිය කොතෙක් තිබිය යුතුදැයි තමන් තමන්ටම ආදර්ශ වෙමින් ක්‍රියාකාරී විය.

''එබැවින් අපි ප්‍රථමයෙන් කළේ ධනේශ්වර මතවාදයට එරෙහිව ජනතාව අතර විප්ලවීය මතවාදය ගොඩනැගීම සඳහා කටයුතු කිරීමයි. මේ කටයුත්ත සඳහා දියුණු වූ වර්ධනය වූ පරිසමාප්තවූ මාක්ස් ලෙනින්වාදී සමූහයක් එක්රැස්කර ගැනීමට සිටියේ නැත.'' යනුවෙන් ඔහු පසුකලෙක සටහන් කළේය. මෙරට පීඩිත ජනතාවගේ විමුක්තිය දිනාගැනීම සඳහා අරගල කරන සැබෑ වමේ ව්‍යාපාරයක්ගොඩනැගීම කොතරම් දුෂ්කර වූයේදැයි තවදුරටත් මෙසේ ලිවීය.

''අපට නිර්ධන පන්ති විප්ලවවාදී දේශපාලන පක්ෂයක් ගොඩනැගීමේ අරමුණ ඇතිව ජනතාව අතර මතවාදී අරගලයක් කිරීමට අවශ්‍ය ප්‍රමාණයක් දක්ෂ සහ වැඩුණු මාක්ස් ලෙනින්වාදී කාඩර්වරු සිටියේ නැහැ. කුඩා හෝ සංවිධාන මට්ටමක් ගොඩනගා ගැනීමට අවශ්‍ය විප්ලවවාදීන් කිහිපදෙනෙකුවත් සිටියේ නැහැ.'' මෙයින් පැහැදිලි වන්නේ තමාට තමාම ආදර්ශ කොට ගනිමින් ක්‍රියාකළ බවයි.

එපමණක් නොව ''අප නිර්මාණය කළ යුත්තේ අප සමග ගමන්කරන මිනිසුන් නොව අප පසුකර යාහැකි මිනිසුන්ය.'' යනුවෙන් ආදර්ශ පාඨයක් ඉදිරියෙන් තබාගෙන ක්‍රියා කළේය. මෙහි සියල්ල එක් තැන්කළ අසාමාන්‍ය විප්ලවවාදියෙකු ශ්‍රී ලාංකේය සමාජයේ බිහිවී සිටියේය. පන්නගමුව පොලේ මුට්ට කරගසමින් නිර්ධන පංති ව්‍යාපාරය ගොඩනැගීමට අවශ්‍ය අරමුදල් සොයාගැනීමේ වෙහෙසකර කටයුත්තේ ඔහු නිරත විය. රටේ විවිධ ප්‍රදේශවල ගොවිපළ ආරම්භ කරමින් අරමුදල් රැස්කිරීමට ක්‍රියා කළේය. කිරින්ද ගොවිපළ ඒ අතරින් විශේෂිතය. දිනක් මේ විප්ලවීය යෞවනයා කිරින්ද ගොවිපළේ වැඩකරමින් සිටින අතර ඔහු හමුවීමට පැමිණි ව්‍යාපාරයේ සගයින් වෙරිමතින් සිටින අයුරු දක්නා ලදී. අපේ පන්ති සගයන් මත්පැන්වලට සහ සිගරට්වලට යොදන මුදල් ව්‍යාපාරයේ සගයින්ගේ කුසගිනි නිවීමට කැපකිරීමේ අගය එහිදී පහදා දුන්නේය. එතැන්සිට ලාංකේය නිර්ධන පංති විප්ලවවාදී ව්‍යාපාරයේ කාඩර්වරුන් දුම්වැටි සහ මත්පැනින් තොර විය. ''බෞද්ධ මූලධර්ම මත පදනම් වූ ආසියාතික අගතීන්'' යැයි වර්තමාන ළදරු වලිප්පුකාරයින් හඳුන්වන්නේ එවැනි කැපකිරීම්මත බිහිවූ විප්ලවීය විනයන්ය.

ඒ පිළිබඳව පසුකාලයක අත්දැකීම් සටහන් තබන මෙම අසහාය ලාංකීය විප්ලවවාදියා ''1964 සිට 1969 දක්වා අපවිසින් කරන ලද්දේ තනිකරම ධනේශ්වර මතවාදයට එරෙහිව විප්ලවීය මතවාදයක් ජයග්‍රහණය කිරීම සඳහා ජනතාව අතර කරන ලද කයෝරවූත්, දුෂ්කර වූත් අරගලයක් පමණි. 1969 දක්වාම පක්ෂ සංවිධානයක් ගොඩනැගුවේ නැත. '' යනුවෙන් සඳහන් කරයි.

විප්ලවීය මතවාදයක් ජයග්‍රහණය කිරීම සඳහා ජනතාව අතර කරන ලද කයෝර සහ දුෂ්කර අරගලයේ අවසානය සටහන් වූයේ ලාංකේය ජනතාවගේ අයිතිවාසිකම් ජයග්‍රහණය කිරීම සහ සමානාත්මතාව ගොඩනැගීම වෙනුවෙන් දිවි දෙවැනිකොට ක්‍රියාකරන නොපසුබස්නා විප්ලවවාදීන් ඒකරාශී කළ හැකි පක්ෂයක් ගොඩනැගීමෙනි. ජනතා විමුක්ති පෙරමුණ එම විප්ලවීය පක්ෂයයි. එහි නිර්මාතෘ දොන් නන්දසිරි විජේවීර පසුව රෝහණ විජේවීර නමින් ලාංකේය ජනතාව හැඳින ගත්තේය. එතැන්සිට ජනතා විමුක්ති පෙරමුණ සහ රෝහණ විජේවීර යනු පක්ෂයක් සහ නායකයෙකු නොව එම දෙදෙනාම එක් අධ්‍යාත්මික බලවේගයක් බවට පත්විය. එය දශලක්ෂ සංඛ්‍යාත ලාංකීය විමුක්ති වාදීන්ගේ අධ්‍යාත්මික බලවේග යකි. ''කොටින්ම කියතොත් ජනතා විමුක්ති පෙරමුණ අනාගතයේදී ගොඩනැගෙන කොමියුනිස්ට් පක්ෂය සඳහා කොමියුනිස්ට් සදාචාරයන් සහ ජීවගුණයෙන් යුත් සැබෑ මාක්ස් ලෙනින්වාදීන් බිහිකරන පක්ෂ පාසලක් බවට පත්කිරීමයි. මගේ අභිප්‍රාය වූයේ.'' යනුවෙන් අනාගත අපේක්ෂා කුළු ගැන්වීය.

එහෙත් ධනේශ්වර පාලන තන්ත්‍රයේ ඒජන්තයින් සහ නිර්ධන පන්ති ව්‍යාපාරය තුළින් ඉපිද පසුව පාවාදෙන්නන් බවට පත්වූවන්ගෙන් පක්ෂයට එල්ලවූයේ සුළුපටු තර්ජනයක් නොවේ. ලාංකේය සමාජය ගැඹුරු පරිවර්තනයක් සඳහා ගෙනයාමට කැපවූ විප්ලවීය ජීවයෙන් පිරුණු විප්ලවවාදීන් හා විප්ලවවාදිනියන් දස දහස් ගණනක් 1971 ධවල භීෂණයට ගොදුරු කරන්නේ එම බාහිර ඒජන්තයන්ගේ සහ පංති සගයන්ගේ මුහුණින් පෙනීසිටි අභ්‍යන්තර ද්‍රෝහීන්ගේ ඒකාබද්ධ කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් වශයෙනි. කුමන්ත්‍රණ එකපිට සිය දහසක් එකාබද්ධ කලද ලෝකයේ ඉදිරියට සහ ප්‍රගතිය කරා යනු මිස ආපස්සට ගමන් කරන්නේ නැත. ජනතා විමුක්ති පෙරමුණේ විප්ලවවාදීන් සහ ඔවුන්ගේ පවුල්වල දහස් ගණනක් ඝාතනය කිරීමෙන් පවා විප්ලවවාදීන්ගේ ජීවගුණය මරා දැමිය නොහැකිය. ''අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාව'' නම් තක්කඩි අධිකරණය ඉදිරියේ මේ විප්ලවවාදීන්ට චෝදනා ඉදිරිපත්



මළවුන්ගේ සොහොන් මත හෙළන කඳුළුවලට සීමාවක් තිබේ. එය පීතෘ භූමිය කෙරෙහි වන අත්‍යන්ත ආදරයයි. ඔවුන්ගේ දේහ මත දිවුරා ලබන අසිරියයි. එම ආදරය කිසිදා බිය නොවේ. කිසිදා නොවරදියි. කිසිදා දුර්වල නොවෙයි. ගෞරවයෙන් උත්තුංග පුදසුන රට වෙනුවෙන් දිවි දුන් වීරයන්ගේ සොහොන් බිම බැවිනි.

**හොසේ මාටි**

# ගඩාෆි ඉරණම පිළිබඳ දේශපාලනික කියවීමක්

පසුගිය ඔක්තෝබර් 25වැනි දින හිරු උදාවීමට පෙර ලිබියානු කාන්තාරයේ නම නොදන්නා ස්ථානයක මළ සිරුරු 03ක් වළ දැමුණා. මිනිසුන් කිහිපදෙනෙකුගේ පමණක් සහභාගිත්වය ඇතිව ලොවට රහසින් මෙසේ වළ දැමුණේ ලොව නොදන්නා සාමාන්‍ය මිනිසුන්ගේ සිරුරු නොවෙයි. මේ වන විට මුළු ලොවම බලා සිටි මිනිසෙකුගේ (ගඩාෆි) දේහයද ඇතුළත්ව තවත් දෙදෙනෙකුගේ (මුටාසිම් ගඩාෆි හා ආරක්ෂක ඇමති අබු බකර් යුනුස්) සිරුරු මෙසේ වළලා දැමුණා. මේ හතළිස් දෙවසරක් ලිබියාව පාලනය කළ මුවම්මර් ගඩාෆිගේ අවසන් ඉරණමයි.

ඔහුගේ ජීවිතය ඒකාධිපතියකු පිළිබඳ වන පැරණි ලතින් පිරුලක් හා අතිශය අපූර්ව සාම්‍යයක් පළ කරනවා. 'ඔහු නරියෙකු සේ බලයට එයි; සිංහයෙකු සේ පාලනය කරයි; සුනඛයෙකු සේ මිය යයි.' එහි කියැවෙනවා. ඔහුගේ ජීවිතය හා සැසඳුවහොත් ඔහු බලයට පැමිණියේ හමුදා කුමන්ත්‍රණයක් මගිනුයි. ඔහුගේ පාලනයේ වැඩිම කාලය තුළ විවිධ ගෝත්‍රික ජන ප්‍රජාවන්ගෙන් සමන්විත වූ ලිබියාව මත අයෝමය ආඥාදායක පාලනයක් පවත්වා ගැනීමට සමත්ව සිටියා. ඔහුගේ මරණය සිදුවූයේ මහ මඟදීයි. ඔහුගේ මළ සිරුරට ලැබුණේද මිනිසෙකුගේ මරණින් මතු ලැබිය යුතු අන්දමේ බුහුමනක් නොවෙයි. කරුණු මෙසේ වන්නට කරුණු යෙදුණේ ඓතිහාසික වශයෙන් සිදුවූ අහම්බයන් නිසා නොවන බව පැහැදිලිය. ඒ ඒ සිදුවීම්වලට බලපෑ ලිබියානු සමාජ ආර්ථික දේශපාලන සන්දර්භයන්ගෙන් වියුක්තව ඔහුගේ ඉරණම සලකා බැලිය නොහැකියි.

අවුරුදු 27 ක් තරම් අඩු වයසක පසුවූ කපිතාන්වරයෙක්ව සිටිමින් රටක පාලකයා බවට පත්වීම පහසු කටයුත්තක් නොවෙයි. එහෙත් මෙයට අවුරුදු 42 කට පෙර 1969 දී මුවම්මර් අල් ගඩාෆි තරුණයා ඒ අභියෝගය ජයගත්තා. 1969 සැප්තැම්බර් පළමුවෙනි දින ලේ නොසැලුණ හමුදා කුමන්ත්‍රණයකින් බලයට පැමිණි ගඩාෆි 70 දශකය තුළ තම පාලන බලය රට තුළ ශක්තිමත් කර ගැනීමට කටයුතු කළා. තෙල් සම්පත භාවිත කරමින් බටහිර සමග ගැටුණ ඔහු තම දැක්ම ඔහුගේ සුප්‍රකට 'ග්‍රීන් බුක්' කෘතිය මගින් ප්‍රකට කළා. ජාත්‍යන්තරය තුළද නායකත්ව භූමිකාවක් අත්පත් කර ගත් ගඩාෆි විශේෂයෙන් බනිජ තෙල් ආධිපත්‍ය මගින් බටහිර ලෝකය නැටවූ 73-74 කාලයේ තෙල් අර්බුදය තුළ කැපී පෙනෙන චරිතයක් වුණා.

බනිජ තෙල්වලින් පොහොසත් බිමක කුමන්ත්‍රණ පිට කුමන්ත්‍රණ සිදුවුණු ලෝකයක තම බලය රැකගැනීමට ඔහු සමත්ව සිටියා. එක්සත් ජනපදය හා සෝවියට් දේශය අතර සීතල යුද්ධය දිගහැරෙද්දී ඔහු එහි ගොදුරක් බවට පත්නොවී නොනැසී රැකුණා. වෙනත් රටවල නායකයන් බලයට පත්වී, බලයෙන් ඉවත් වී යන ආකාරය ඔහු දශක 04ක් පුරා දැකගත්තා. තම අණසක යටතේ අයෝමය හමුදාවක් ගොඩනගා ගත් ඔහු අප්‍රිකානු මහද්වීපය තුළ තෙල් ධනයෙන් දානපති භූමිකාවකටත් පෞරුෂ ශක්තියෙන් නායක භූමිකාවකටත් පණ පෙව්වා. ඔහුගෙන් ආධාර නොලැබූ අප්‍රිකානු රටක් නැති තරම් වුණා.

මුස්ලිම් හා අරාබි ලෝකය බටහිර අධිරාජ්‍යවාදය සමග ගැටෙද්දී ජාතිකවාදියෙකු ලෙස පෙනී සිටිමින් ගඩාෆි එහි ප්‍රමුඛ නායකයෙක් බවට පත්වුණා. ඒ වෙනුවෙන් ඔහුට වන්දි ගෙවීමට සිදුවූ අතර 1986 අප්‍රේල් එක්සත් ජනපදය ට්‍රිපොලි අගනුවරට හා බෙන්ගාසි නුවරට ගුවන් ප්‍රහාර එල්ල කළා. සැබැවින්ම ඒ ගඩාෆි මරාදැමීම ඉලක්ක කර ගෙනයි. එහිදී ඔහුගේ හදාගත් දියණියක මිය ගිය නමුත් ගඩාෆි යටත්වීමට සූදානම් වුණේ නැහැ.

කෙසේ වුවද ඔහු බටහිර සමග ගැටුණේ, එය විසින් නියෝජනය කළ අධිරාජ්‍යවාදී භූමිකාව නිවැරදිව තේරුම් ගෙන නෙමෙයි. එනිසාම බටහිර මතුපිට පෙනුම සමග ඔහුට ගැටුමක් තිබුණා. ඒ, සාම්ප්‍රදායික කුරුස යුද්ධ සිහිග න්වන ක්‍රිස්තියානු විරෝධය සහිත අරාබි ජාතිකවාදය තුළ සිටිමිනුයි.

එසේම බටහිර සමග ගැටීමට ඔහු තෝරාගත් උපක්‍රම පෙරළා ඔහු අර්බුදයට යැවීමට හේතු වුණා. නිදසුනක් ලෙස 1986 ස්කොට්ලන්තයේ ලොකර්බිහි දී පැන්-ඇම් ගුවන් යානයක් පුපුරා මගීන් 270ක් මිය යෑමේ සිදුවීමට වරදකරුවන් වූණේ ලිබියානුවන් දෙදෙනෙකුයි. ඔවුන් ස්කොට්ලන්ත අධිකරණයට භාර නොදීමට ඔහු තීරණය කළා. මෙය කෙටි කාලීනව ඔහුට රට තුළ ජනප්‍රියත්වයක් කැටුව ආවද එය ඔහුට රාජ්‍යතාන්ත්‍රික වශයෙන් බරපතළ ප්‍රතිවිපාක ගෙන ආවා. මේ නිසා ලිබියාව ඉතා අසීරුතාවයකට ඇද දැමූ ආර්ථික සම්බාදකවලට මුහුණ දීමට එයට සිදුවූ අතර 1999 දී එම තත්වය අවසන් වූයේ වරදකරුවන් දෙදෙනා පිටුවහල් කිරීමෙන් පමණක් නොවෙයි. බටහිර සමග තදින් ගැටුණු දශක 03 ක ඔහුගේ භූමිකාවද අවසන් කරමිනුයි. අනතුරුව බටහිර අධිරාජ්‍යවාදී රටවල් සමඟ ආර්ථික, දේශපාලන හා හමුදාමය සබඳතා ශක්තිමත් කර ගැනීමට ගඩාෆි උත්සාහ කළා. විශේෂයෙන් බ්‍රිතාන්‍යය, ප්‍රංශය හා ඉතාලිය සමග ඔහුගේ සබඳතා ඉහළ යද්දී එක්සත් ජනපදයේ 'ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය' සමග ගඩාෆි අත්වැල් බැඳගත්තා. පසුකාලීනව ගඩාෆි විරෝධී සටන්කාමීන්ට එක්සත් ජනපද සහය ලැබීම වැළැක්වීම සඳහා ගඩාෆි පාලනය උත්සහ දැරුවේද ඔවුන් අල් කයිඩාවට සම්බන්ධ සටන්කාමීන් බව පුන පුනා කියමිනුයි. එහෙත් එම උත්සහය ඵල දැරුවේ නැහැ.





පාලනයේ ස්ථාවරත්වය පතා බටහිර සමග ගනුදෙනුවලට යාමට ඔහුට කඩිනමින්ම බලකෙරුණා. ඔහු පාලනයේ පරිහානි සමයද මේ හා සමගාමී වුණා. තමන්ට හිතවත් කවයක් පමණක් විශ්වාස කිරීමේ තත්වයක් කරා තල්ලු වු ගඩාෆි තම පුතුන් හමුදාවේ උසස් තනතුරුවලට පත්කර විශ්වසනීයම බලකා නිර්මාණය කළා. ඔහුගේ පුතෙකු වූ කාමිස්ගේ නමින් වූ 'කාමිස් බලකාය' ඉන් එකක්. මහජන මතයට වඩා ආයුධ මත විශ්වාසය මත විශ්වාසය තැබීමේ ඒකාධිපති වැරදි ගණන් බැලීම ඔහු අතින්ද සිදු වුණා. අධිරාජ්‍යවාදය සමග වන නව මිත්‍රත්වය තමන් ශක්තිමත් කරනු ඇතැයි ඔහු කල්පනා කළද සැබැවින්ම සිදුවෙමින් තිබුණේ රට තුළ ඔහුගේ ප්‍රතිරූපය දියවෙමින් යාමයි. මෙය මෙවැනි කල්පනාවකට යන ඕනෑම රටක පාලකයෙකුට විය හැකි පොදු තත්වයකුයි. වඩ වඩාත් ආඥාදායකත්වයක් කරා ඔහුගේ පාලනය ඇදී යද්දී රට තුළ ජනතා අප්‍රසාදය ඊට සමාන්තර ලෙස වර්ධනය වන්නට වුණා. එහෙත් විය හැකි පරිදිම අද ගඩාෆිගේ දොස් දකින එක්සත් ජනපදය ඇතුළු බටහිර රටවල් ගඩාෆි සමග සබඳතා පවත්වද්දී ලිබියාවේ ආඥාදායකත්වය, ජන මර්දනය ආදී කිසිවක් පිළිබඳව මැසිවිල්ලක්වත් ප්‍රකාශ නොකිරීමට පරෙස්සම් වුණා. ඒ ගඩාෆි තමන්ගේ පීල්ලේ හොඳින් ගමන් කරමින් සිටින බව ඔවුන් සිතූ නිසායි.

එහෙත් 2010 දෙසැම්බරයේදී ටියුනීසියාවෙන් ඇරඹි අරාබි ජනරැල්ලේ බලපෑමෙන් ගඩාෆි මුදාලන්නට ඔහු ගොඩ නගාගත් හමුදා බලයට නොහැකි වුණා. අනෙක් අතට ඔහු කීකරුකම පෙන්වන්නට උත්සාහ කළ බටහිර අධිරාජ්‍යවාදී රටවල් ඔහු අතහැර දැම්මා. වැඩි ආයෝජන අවස්ථා විවර කර දෙමින් ළංකරගන්නට බැලූ චීනය වැනි රටවල්ද ඔහුට පිටුපා යමින් සිටියා. ජන නැගිටීම්වලට යුධ ශක්තියෙන් පිළිතුරු සෙවීමට උත්සාහ කිරීම බූමරංග යක් සේ ඔහු සොයා ආවා. ඒ, නැගිටීම්වලට සන්නද්ධවීම ආදේශ වීමෙනුයි. අනෙක් අතට බටහිර අධිරාජ්‍යවාදී රටවල් තමන්ගේ න්‍යාය පත්‍රයක් සහිතව එයට උදව්කිරීමට තීරණය කිරීමත් සමගයි. විශේෂයෙන් ගඩාපි විරෝධී සටනේ නායකත්වය තමන් අත රඳවා ගැනීමට අධිරාජ්‍යවාදී රටවල් පරෙස්සම් වූ බව පෙනෙනවා. පෙබරවාරියේ ඇරඹි ජන නැගිටීම්වලට මාර්තු වන විට නෙටෝ ගුවන් ප්‍රහාර මගින් ආවරණ සැපයීමට තීරණය වන්නේ ඒ අනුව බව පැහැදිලියි. ඔහු සමග සිටි අප්‍රිකානු මිතුරන්, අරාබි ලෝකයද මෙහිදී ඔහු අතහැර යෑමෙන් පිළිඹිබු වූයේ තමන්ගේ ජනතාවගෙන් හුදකලා වන විට ඕනෑම පාලකයෙකුට මෙන් ඔහුටද අත්වූ ප්‍රතිඵලයයි. ඒ සමග ඔහුගේ පාලනය අවසන්වීම, කාලය පිළිබද ප්‍රශ්නයක් පමණක් වූ බව අමුතුවෙන් කිව යුතු නැහැ.

ඔහු කී පරිදිම එනම් ජන නැගිටීම් ආරම්භ වී මාස 8කට පසු ඔක්තෝම්බර් 20 වැනි දින ඔහු ලිබියානු පොළොවේ ලේ හලමින් මියගොස් ගියා. අවසන් බලකොටුව එනම් තම උපන්බිම වන සර්ටේ නගරයේදී එල්ලකෙරුණු නේටෝ ප්‍රහාරයකින් පසු අත්අඩංගුවට පත්ව සිටියේදී ඔහු මරා දමනු ලැබ තිබුණේ දරුණු වධ හිංසාවලට බඳුන් කිරීමෙන් පසුවයි.

ඔහුගේ ඉරණම මෙසේ අවසන් වනු ඇතැයි 2011 වසර ඇරඹෙන විට කිසිවෙකත් සිතා තිබුණේ නැහැ. සැබැවින්ම ගඩාෆිගේ පාලනය පිළිබදව ජනතාවට තිබුණේ කාලය දීර්සවීම නිසා හටගත් ප්‍රශ්නයක්ම නොවේ. ඒ, ඔහු පසු කාලීනව ගන්නා ලද දේශපාලනික හැරවුමේ තර්කානුකූල ප්‍රතිඵලයක් ලෙස හටගත් ජනතා අප්‍රසාදයයි. කියුබාවේදී ෆිදෙල් කස්ත්‍රෝ වසර 40ක් නායකත්වය දීම කියුබානුවන්ට ගැටලුවක් වුණේ නැහැ. එසේම ඔහු අද සෞඛ්‍ය හේතූන් මත ක්‍රියාකාරී දේශපාලනයෙන් ඉවත්ව සිටියත් කියුබානු ජනතාවගේ හදවතේ වීරයෙකු ලෙස තැන්පත්ව සිටිනවා. අනෙක් අතට ලිබියාවේදී ගඩාෆිගේ වසර 42ක පාලනයේ අවසානයේ ඔහුට අත්වූයේ මෙවැනි ඉරණමක්. මෙම කරුණු ද්විත්වය භූමිකා දෙක පිළිබඳ සැසඳීමකට ඉඩ විවර කරනවා.

අනෙක් අතට මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා තම ලිබියානු සංචාරයේදී ගඩාෆි තමන්ගේ කරට අතදාගත් ඡායාරූප ජනමාධ්‍යයට නිකුත් කරමින් අපේක්ෂා කළේ, ගඩාෆි වැනි මිතුරන් තමන් සමඟ සිටින්නේ යැයි ලෝකයට පෙන්වා දීමටයි. ඒ ඇතැම් විට බටහිර කෙනෙහිලිකම්වලට පිළිතුරු දීමේ අටියෙන් විය යුතුයි. එහෙත් ගඩාෆිට මෙවැනි ඉරණමක් අත්කරදීමෙන් අධිරාජ්‍යවාදී රටවල් තම ඔඩොක්කුවේ සිට දඟකාරකම් කිරීමට හිතන නායකයින්ට බලවත් පණිවිඩයක් ලබා දී තිබෙනවා, එසේම අධිරාජ්‍යවාදීන්ගේ ඔඩොක්කුවේ හුරතල් වෙමින් සිටින ඕනෑම අයෙක් ඔවුන්ට එපාවූ ඕනෑම මොහොතක බිමට වැටීමේ අවදානමද දරාගත යුතුයි. අධිරාජ්‍යවාදය සතුටුකිරීම උදෙසා අතිශය පීඩාවට පත් කරනු ලැබූ ජනතාව, වැටුණු නායකයින් ඔසවන්නට කිසිදා නොඑනවා පමණක් නොව ඒ නායකයින් ඉතිහාසයේ කුණු බක්කියට තල්ලුකර දමන්නටද උත්සුක වෙන බවට කිසිදු සැකයක් නැහැ.

එසේම ගඩාෆි පාලනය පෙරළා දමා ගඩාෆි මරා දමා ස්ථාපිත කෙරුණු නව පාලනය ලිබියානු ජනතාව මුහුණ දෙන

11 වැනි පිටුවට

# ධනවාදය නිරුවත් කරන

## ඇමරිකානු ආර්ථික දත්ත




සැප්තැම්බර් මස මැදදී ඇමරිකා එක්සත් ජනපදයේ කරන ලද සමීක්ෂණයක ප්‍රතිඵල, ආර්ථිකය පිළිබඳව උනන්දු බොහෝ ඇමරිකානුවන්ගේ ඇස් උඩ හිඳුවා තිබුණා. ඉන් කියවුණේ, ඇමරිකානුවන්ගෙන් 1/3කට මාසික වැටුප පමණක් ඔවුන්ගේ එකම ආදායම් මාර්ගය වී ඇති බවයි. එය වෙනත් ආකාරයකින් කියතොත් මෙසේයි. එනම් ඔවුන්ට රැකියාව අහිමි වුවහොත් ඔවුන්ගේ මීළඟ කුලී හෝ උකස් වාරිකය ගෙවීමට ඔවුන්ට නොහැකි වන බවයි.

මෙහි විශේෂත්වය වනුයේ, මෙය මෙම පිරිස දරිද්‍රතා රේඛාව තුළ හෝ ඒ ආසන්නයේ සිටීම නිසා ඇති වන තත්වයක් නොවීමයි. ඉහළ වාර්ෂික ආදායමක් ලබන්නවුන්ට පවා තමන්ගේ ආදායම් මාර්ගය එක් මසකට අහිමි වීමෙන් ඊළඟ නිවාස වාරිකය ගෙවීමට නොහැකි තත්වයක් ඇති වනු ඇති බව එම සමීක්ෂණය පෙන්වා දෙයි. සමීක්ෂණයට බඳුන් කරන ලද පිරිසෙන් සියයට 61ක් කියා ඇත්තේ, තම රැකියා අහිමි වුවහොත් තමන්ගේ කුලී හෝ උකස් වාරික ගෙවිය හැක්කේ මාස 05ක කාලයකට පමණක් බවයි.
අනෙක් අතට එක්සත් ජනපද ජනගහන කාර්යංශයේ වාර්ෂික වාර්තාව පෙන්වා දෙන්නේ, පසුගිය වසරේ ඇමරිකානුවන් මිලියන 46.2ක් දරිද්‍රතාවයෙන් පෙළුණු බවයි. එහි කෙටි අදහස නම් සෑම ඇමරිකානුවන් 6 දෙනකුගෙන්ම එක් අයෙක් දුප්පතෙකු වන බවයි. කැපී පෙනෙන කරුණ නම් 2009දී සියයට 14.3 ක් වූ දරිද්‍රතා අගය 2010 වසරේදී 15.1 දක්වා ඉහළ නැගීමයි. සෞඛ්‍ය රක්ෂණ පහසුකම් නොමැති ඇමරිකානුවනගේ සංඛ්‍යාවද මිලියන 49.9 දක්වා ඉහළ ගොස් ඇති බව එම වාර්තාවේ සඳහන්.

ඇමරිකානු දත්තවලට අනුව හතර දෙනෙකුගෙන් යුතු පවුලක වාර්ෂික ආදායම ඩොලර් 22,314ට වඩා අඩුනම් හෝ එක් පුද්ගලයෙකුට ඩොලර් 11,139ට වඩා අඩුනම් දරිද්‍රතා රේඛාවට පහළින් යැයි සැලකෙනවා. සැබැවින්ම දුප්පත්කමටත් ජනවාර්ගික භේදයක්

11 වැනි පිටුවට

### 09 පිටුවෙන් 22 වන ඉල් ...



කළේ '' එංගලන්තයේ මහරාජෝත්තමියට එරෙහිව කැරලි ගැසීම'' යනුවෙනි. මෙය 1971 මහ නඩුව ලෙස ඉතිහාස ගතවී ඇත. රෝහණ විජේවීර අසාහය විප්ලවවාදියා මෙම තක්කඩි අධිකරණය ඉදිරියේ ''අප මරාදැමුවද අප නඟන හඬ සදා නොමියෙනු ඇත. යනුවෙන් ඓතිහිසික ප්‍රකාශනය කරමින් විප්ලවවාදීන්ගේ නිර්දෝෂීභාවය සහ ඔවුන්ට කැරලි ගැසීමට තිබූ අයිතිය සනාථ කළේය. ආණ්ඩුවේ ඒජන්තයන් සහ කැරැල්ළෙන් පසුව ද්‍රෝහී පාවාදෙන්නන් වී ආණ්ඩුවේ සාක්ෂිකරුවන් වූ පිරිස හැර මුල් පෙලේ විප්ලව වාදී සියලු දෙනාටම සිර දඬුවම් නියම විය. බොහෝ දෙනෙකුට එය ජීවිතාන්තය දක්වාය. එහෙත් 1977 මහ මැතිවරණයෙන් ආණ්ඩු පෙරළිය සිදුවූ පසු රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු විප්ලව වාදීන්ටද නිදහස ලැබිණ. ඒකාධිපති ජේ.ආර්. ජයවර්ධන 1983 දී බොරුචෝදනා නඟමින් පක්ෂය තහනම් කරන තුරු ජනතා විමුක්ති පෙරමුණ මෙරට එකම සැබෑ වමේ දේශපාලන බලවේගය වශයෙන් වැඩෙමින් තිබිණ. එහෙත් ජේ.ආර්. ජයවර්ධන වසරකට පෙර (1982) දී කැඳවූ ජනාධිපතිවරණය සහ ඉන්පසුව පැවැත්වූ ඊනියා ජනමත විචාරණය නම් ලාම්පු කළගෙඩි ඡන්ද මංකොල්ලයට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ ගෙනගිය ප්‍රජාතන්ත්‍රවාදී අරගල ජේ. ආර්. පාලනයට මරුපහර වූයෙන් 1983 ජූලි කලබල වලට මුවාවී බොරු චෝදනා මත ජවිපෙ තහනම් කර එහි නායකයින් වෙත මර්දනය මුදා හලේය. එතැන් සිට ජවිපෙට දේශපාලනය කිරීමට සිදුවූයේ රහසිගතවය.

මේ අතර ධනපති මර්දනයට එරෙහිව පංතියක් වශයෙන් නැගීසිටිය යුතු වුවද අධිරාජ්‍යවාදීන්ගේ බෙදා වෙන් කර පාලනය කිරීමෙන් ඇරඹි සහ 1948 ලබාගත්තේ යැයි කියන නිදහසින් පසුව රට පාලනය කළ ධනපති නායකයින් විසින් වර්ධනය කරන ලදුව උතුරු නැගෙනහිර දෙමළ තරුණ පිරිස් ද්‍රවිඩ ඊළාම් රාජ්‍යයක් බිහිකිරීමේ සන්නද්ධ බෙදුම්වාදී ව්‍යාපාරයට තල්ලුකර හරින ලදුව එය වර්ධනය වෙමින් තිබිණ. එම තත්වයට අදාළ වමේ ස්ථාවරය කුමක්ද්‍දයි වසර 6ක් පැවැති න්‍යායික සාකච්ඡාව අවසන් කරමින් ''දෙමළ ඊළාම් අරගලයට විසඳුම කුමක්ද?'' කෘතිය රෝහණ විජේවීර සහෝදරයා විසින් රචනා කරන ලද්දේ පක්ෂය තහනම් කර තිබියදීය. එම කෘතිය ලේඛන ගතකර හැකිවූවා පමණි. ඒ පිළිබඳ සජීවී සංවාදයක් සමාජ ගත කිරීමට අවස්ථාව අහිමි කර තිබුනේ ජයවර්ධන පාලනයේ මර්දනය නිසාය.

මේ අතර රෝහණ විජේවීර අසාහය විප්ලව වාදියා 1961 දශකයේදී අනාවරණය කල ඉන්දියානු ව්‍යාප්තවාදය 1987 ජූලි මස වනවිට ලාංකිකයන්ට අත්දැකීමට ලැබිණ. යැංකි ඩිකී යන නමින් හැඳින්වූ අධිරාජ්‍යවාදී සුරතලෙකු වූ ජේ. ආර්. ජයවර්ධන ආණ්ඩුව ඉන්දියාව ඉදිරියේ දන ගස්වා ලංකාවේ ගුවන් හා නාවික සීමා බලහත් කාරයෙන් ආක්‍රමණය කර ගුවනින් පරිප්පු හෙලා ඉන්දියාව තම බලය පෙන්වූයේ දෙමළ ඊළාම් බෙදුම්වාදී යුද්ධය උපයෝගී කරගෙනය. අවසානයේ ඉන්දීය ආක්‍රමණික හමුදා මෙරටට ගොඩ බසින්නේ ජේ. ආර්. රජීව් ගාන්ධි එක්ව අත්සන් කළ තක්කඩි ''ඉන්දු-ලංකා සාම ගිවිසුම'' මුවාවක් කරගෙනය. මෙම ආක්‍රමණිකයාට සහ එයට මග හෙළිකල ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුවට එරෙහි අරගලය රටපුරා ලැව්ගින්නක් සේ ඇවිළ ගියේය. ජේ.ආර් ජයවර්ධන ආණ්ඩුවේ මර්දනය මෙම විරෝධතා වලට ම්ලේච්ඡ ආකාරයෙන් දියත් කරන ලදී. මර්දනයට එරෙහිව දකුණේ අවිගත් නැගිටීමක් නොවැළැක්විය හැකි විය. ඒ හමුවේ බලය අත්හැර පල්ලම් බසින ජේ. ආර් වෙනුවට මර්දන යාන්ත්‍රනය මෙහෙයවීම රණසිංහ ප්‍රේමදාසට විතැන් කළේය. රණසිංහ ප්‍රේමදාස රන්ජන් විජේරත්න සමග එක්වී මච්චිමේ අස්සක් මුල්ලක් නැර භීෂණය මුදාහැර තිබුනේ ඉන්දීය හමුදාවල මෙන්ම ඊළාම් බෙදුම්වාදීන්ගත් උපකාර නොමඳව ලබා ගනිමින්ය. එම මර්දනය උච්ඡතම මට්ටමකට පත්කර තිබූ 1989 නොවැම්බර් 13 වැනිදා අත්අඩංගුවට ගන්නා ලද රෝහණ විජේවීර සහෝදරයා, උපතිස්ස ගමනායක ඇතුළු නායකයින් රැසක් රහසේ ඝාතනය කළේය.

''අප මරාදැමුවද අප නැගූ හඬ මරාදැමිය නොහැකිය'' යන්න යළි යළිත් සනාථ කරමින් පක්ෂය යළි 1990 සිටම නැගීසිටියේ දේශපාලන මණ්ඩලයේ සෝමවංශ අමරසිංහ සහෝදරයා හැර අන් සියලු නායකයින් ඝාතනය කර තිබියදීය. සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ, බර්ගර් ඇතුලු සියලුම ජනතාවගේ අයිතීන් දිනාගැනීම වෙනුවෙන් අද පර්සි මහේන්ද්‍ර රාජපක්ෂ පාලනයට එරෙහිව අභීතව ප්‍රජාතන්ත්‍රවාදී අරගල කරන එකම බලවේගය ජනතා විමුක්ති පෙරමුණ පමණි. එහි නිර්මාතෘ සදාදරණීය රෝහණ විජේවීර සහෝදරයා නොමැතිව අද ඒ මහා අධ්‍යාත්මික ශක්තිය මේ බිමේ අටදෙස සිසාරා නැගළුමින් තිබේ. මේ තත්වය ඉවසාගත නොහැකි සකලවිධ පංති සතුරන් විසින් නිර්ධන පංතියේ මිතුරන් හා විමුක්ති වාදීන් ලෙස සිටිනා අවස්ථාවාදී ළදරු වළිප්පුකාරීන් ජනතා විමුක්ති පෙරමුණ නම් මහා බලවේගය ඇතුළතින් හා පිටතින් දුර්වල කර විනාශ කිරීමට සියලු ශක්තීන් එක් කල සකලවිධ උපාය උපක්‍රම ක්‍රියාවට නගමින් සිටින තවත් එක් මොහොතකි මේ. මෙයට පෙර 1970 සිට එවැනි බලවේග ඒකාබද්ධව නැගීසිටියද පරාජයම අත්වින්දේය. එහෙත් ලෝකය සිසාරා ජයකෙහෙළි නංවන අනාගත කොමියුනිස්ට් වාදීන් බිහිකරන පාසලක් වූ ජනතා විමුක්ති පෙරමුණේ ගමන නැවතීමට හැකි කිසිඳු ජගතෙකු නොවන බව අදටත් වඩා හොඳින් හෙට තහවුරු වනු ඇත. 22 වැනි ඉල්මහ සැමරුමෙන් නැගෙන පණිවුඩය එයයි.

ඔව්, නියත වශයෙන්ම මේ මහා අධ්‍යාත්මික බලවේගය විසින් මෙරට ගැඹුරු පරිවර්තනයකට මග පෙන්වනු ඇත.

### 12 පිටුවෙන් ජනතාව වෙනුවෙන්...

වැඩිදුරටත් අදහස් දැක්වූ ටිල්වින් සහෝදරයා මෙසේද පැවසීය.

''ජවිපෙ කියන්නේ ලෝකයේ ලොකුම පවුලයි. මේ පක්ෂයට අභියෝග කරන්න බැරි ඒ නිසයි. ජ.වි.පෙ. තිබෙන්නේ පක්ෂ මූලස්ථානයේ නෙවෙයි. මැතිවරණ කොමසාරිස්ගේ ලේඛනවලත් නෙවෙයි. අපේ පක්ෂ සාමාජිකයාගේ හදවත පතුලෙයි. ජවිපෙ එක සාමාජිකයෙක් හෝ ජීවත් වෙනවා නම් ඔහුගේ හදවත පතුලේ ජ.වි.පෙ. පවතිනවා. ජනතා විමුක්ති පෙරමුණට ආදරය කරන්නේ අපේ පන්තියේ ජනතාවයි. ජවිපෙ තුළ ගැටුම් ඇති කරවා පංතියේ විශ්වාසය බිඳිමට අපේ සතුරන්ට අවශ්‍යයි. ඒත් අපි පැහැදිලිවම කිව යුතුයි. අපි එවැනි උගුල්වලට හසුවන්නේ නැහැ. අපිට සතුරන්ගේ වුවමනා අනුව කරන සංවාදවල ලැග සිටීමට අවශ්‍ය නැහැ. අපට පැවරුණ විශාල වගකීමක් තියෙනවා. ඒ මේ රටේ ජනතාව වෙනුවෙන් සමාජවාදය යථාර්ථයක් කරන්නයි. අපි එතෙක් වෙහෙස නොබලා වැඩ කරනවා.''

### 10 පිටුවෙන් ගඩාපි ඉරණම ...

ප්‍රශ්නවලට සැබෑ විසඳුමක් වේද යන්නත් ඔවුන්ගේ බලාපොරොත්තු ඉටු කරන්නක් වේද යන්නත් ගැටලු සහගතයි. මන්ද ගඩාෆිට එරෙහි යුද්ධයට උදව් කිරීම වෙනුවෙන් ලන්ඩනයේදී, පැරීසියේදී, රෝමයේදී ඇතිවූ යැයි විශ්වාස කළ හැකි එකඟතා ලිබියානු පොදු ජනතාවගේ වුවමනාකම් සමග ගැටෙනු ඇති බව නිශ්චිත නිසයි.

### 05 පිටුවෙන් මාක්ස්වාදය ලංකාවට ...



පෙළකට පෙළගැස්වීම ආදී කරුණු ගණනාවක් අප වෙත පැවරී තිබෙනබව. ඒ කරුණු වෙනුවෙන් අපි එළියේ අරගලයක් කළ යුතුයි. ඉඩම් විකිණීමට එරෙහිව ගොවි ජනතාව අරගලයකට බහිනකොට ඒ ජනතාවගේ හඬ පාර්ලිමේතුව තුළ අපේ හඬ බවට පත්කර ගත යුතුව තිබෙනවා. කටුනායක වැනි තැනක කම්කරුවන්ගේ අරගලයන් පැන නගින විට එහි හඩක් බවට අපි පාර්ලිමේන්තුව පත්කර ගත්තා. ඒ වගේම අධ්‍යාපනය පෞද්ගලීකරණය කරන විට අපි පාර්ලිමේන්තුව ශිෂ්‍ය ව්‍යාපාරයේ හඬ බවට පත්කර ගත්තා. ඒ වගේම යුද්ධයෙන් පසුව දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් තහවුරු කිරීමටත් අපි හඬ නැගුවා. අත්අඩංගුවට පත්වූවන්ගේ ප්‍රශ්නය, අතුරුදහන් වූවන්ගේ ප්‍රශ්නය වැනි ඒ ජනතාවගේ එළියේ උද්ඝෝෂණය සහ පාර්ලිමේන්තුවේ හඬ අතර ඒකාබද්ධතාවක් අපි ඇතිකර තිබෙනවා.

ඒ නිසා පාර්ලිමේන්තුව තුළ අද ක්‍රියාත්මක වෙමින් පවතින්නේ, පාර්ලිමේන්තුවෙන් පිටත උද්ඝෝෂණය සහ පාර්ලිමේන්තුවේ ක්‍රියාදාමය අතර ඒකාබද්ධතාවයක් ගොඩනගමිනුයි. ඒකාබද්ධතාව අවශ්‍යයි. මන්ද අපට අවශ්‍ය වී තිබෙන්නේ, පක්ෂයට නායකයින් පමණක් නොවෙයි. පංතියට නායකයින් අපි ගොඩනැගිය යුතුයි. පොදු ජනතාවගේ අතිමහත් බහුතරයේ විශ්වාසය දිනාගැනීමකින් තොරව සමාජවාදී විප්ලවීය පරිවර්තයක් කරා යාමට අපට නොහැකියි. ඒ නිසා පුළුල් ජනතා ව්‍යාපාරයක් ගොඩනැගීමට අවශ්‍ය සෑම තැනක්ම කිසිදු පැකිළීමකින් තොරව අපි උපයෝගී කරගත යුතුයි.

මෙම කණ්ඩායම පාර්ලිමේන්තුව, වෘත්තීය සමිති ප්‍රතික්ෂේප කිරීම, බහුජන දේශපාලනය ප්‍රතික්ෂේප කිරීම නිසා ඔවුන්ට විප්ලවීය වාක්‍ය කණ්ඩ දොඩවමින් සිටීමට හිතකර තත්ත්වයක් ඇති වූවත් සැබැවින්ම සමාජ පරිවර්තනයක් වෙනුවෙන් හිතකර තත්වයක් ඇතිකරන්නේ නැහැ. විප්ලවවාදය ආභරණ බවට පත්කර ගැනීමට උත්සාහ කරන, ඉතාමත්ම බොළඳ, අසාර්ථක යථාර්ථවාදී නොවන දේශපාලන ප්‍රවණතාවයක් ඔවුන් තුළින් දිස්වෙමින් තිබෙනවා.

***නියමුවා: ජාත්‍යන්තර වශයෙන් නව ලිබරල්වාදී ධනවාදය අර්බුධදට ගොස් තිබියදී එයම අනුගමනය කරන ආණ්ඩුවේ ඉදිරි ගමන්මග ජනතාව වඩ වඩාත් පීඩාවට පත්කරන්නක් බව පැහැදිලියි. ඒත් අලුත් ගමනක් සඳහා ඒ ජනතාව සංවිධානය කිරීම පහසු වෙයිද?***

*අනුර දිසානායක සහෝදරයා:*

විශේෂයෙන් අපි දන්නවා නව ලිබරල්වාදී ධනවාදයට අපේ රට පරිවර්තනය කිරීමේදී 1977 ජේ.ආර් ජයවර්ධන ආණ්ඩුව සුවිශේෂී කාර්යභාරයක් කළා. 1972-1977 සිට ලෝකයේ මහා පරිමාණ ආර්ථික අර්බුදයක් නිර්මාණය වුණා. එම ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස ලෝකය තමන්ගේ ප්‍රාග්ධනයට යටපත් කරගන්න ධනවාදය නව ලිබරල්වාදී ස්වරූපයෙන් ලෝකය පුරා යද්දී විවෘත ආර්ථිකය ලෙස අපේ රටට හඳුන්වා දුන්නා.

ජේ.ආර්. ජයවර්ධන ඒ සඳහා ආරම්භයක් දුන්නා. ඒ සඳහා අවශ්‍ය දේශපාලන ස්ථාවරත්වය හදාගත්තා. විරුද්ධ පක්ෂ, වෘත්තීය සමිති මර්දනය කළා. නමුත් ඉන්දියාව සමග වූ ඔහුගේ ගැටුමේ ප්‍රතිඵලයක් ලෙස ඉන්දියානු හමුදා පැමිණීමෙන් ඔහුගේ ගමන අවසන් කරගන්න ඔහුට නොහැකි වුණා. ප්‍රේමදාසටත් ඔහුගේ කාලසීමාව කෙටිවීම නිසාම ඉදිරියට යන්න බැරිවුණා. චන්ද්‍රිකා කුමාරතුංග 1994 බලයට පත්වන්නේම විවෘත ආර්ථිකයට මානුෂික මුහුණුවරක් දෙන බව කියන සටන් පාඨය මත. ඇයටත් 1998 වනතුරුම නව ලිබරල්වාදී ගමන වේගවත්ව ඉදිරියට යන්න බැරි වුණා. ඉන්පසුව වේගයෙන් ඉදිරියට යන්න හැදුවත් ඇගේ ආණ්ඩුව ඉක්මනින්ම කඩා වැටුණා. නැවත රනිල් අතට බලය මාරු වුණා. ඔහු ඉතා ක්ෂණික න්‍යාය පත්‍රයක් හදා ඉදිරියට යන්න හැදුවා. එහෙත් ඔහුගේ පාලන බලය ඉක්මණින් ගිලිහී ගියා. 2005 දී බලයට පත්වූ මහින්ද රාජපක්ෂගේ 2010 වනතෙක් න්‍යාය පත්‍රය වූයේ, යුද්ධය ජයගැනීම සහ ඒ ඔස්සේ බලය තහවුරු කරගැනීමයි. ඒ කාලය තුල ආර්ථිකය කෙරෙහි යොමු වූයේ අවම අවධානයක්.

නමුත් 2010 දී ඔහු ජනාධිපති ධූරය සහ පාර්ලිමේතුවේ 2/3ක බලය අත්පත් කරගෙන ධූරකාල වාර ගණන වැඩිකරගත්තා. අනතුරුව ප්‍රාග්ධනයට යටිතල පහසුකම් සැලසීම මගින්, නීති සංශෝධනය මගින් ජේ.ආර්. ජයවර්ධනට අවසන් කළ නොහැකි වූ ගමන ඔහු අරඹා තිබෙනවා. ඒ නිසා ඉඩම් සම්පත, දූපත් විකුණමින් සංචාරක කර්මාන්තය තමන්ගේ එකම ආර්ථික උපාය මාර්ගය කරගනිමින් නව ලිබරල්වාදයේම ජාති ලක්ෂණයක් වුණු වංචා දූෂණයන්ට ඉඩ සලසමින් මහා පරිමාණ යටිමඩි ගැසීම් සිදුකරමින් ආර්ථිකය හසුරුවමින් සිටිනවා.

එළඹෙන අයවැය ලේඛනයෙනුත් නිසැක ලෙසම නව ලිබරල්වාදයට විශාල තල්ලුවක් දීමට උත්සාහ කරාවි. එහෙත් ලෝක පරිමාණයෙන් නව ලිබරල්වාදය කඩා වැටෙමින් තිබෙනවා. සහන කප්පාදු වෙමින්, රැකියා කප්පාදු කෙරෙමින් බදු ඉහළ නැගෙමින් තිබෙනවා. මිනිසුන් ජීවත් වීමට නොහැකි තරමේ අර්බුදයකට මුහුණපා සිටිනවා. ඒයම අනුගමනය කරන මහින්ද රාජපක්ෂ පාලනයටත් හැකිවන්නේ, අධිරාජ්‍යවාදයට රට තව තවත් විවෘත කරන්නත් ජනතාව පීඩාවට පත් කරන්නත් ඊට එරෙහි වන ජනතාවට මර්දනය කැඳවන්නත් පමණයි.

ඊට පිළිතුර ඇත්තේ මේ සමාජ ක්‍රමය වෙනුවට සමාජවාදී සමාජ පරිවර්තනයක් කරා මේ රට රැගෙන යාමයි. ඒ සඳහා ජනතාව පෙළගැස්වීමට සුදුසු වාතාවරණයක් ගොඩනැගෙමින් තබෙනවා. ජනතා විමුක්ති පෙරමුණ ඒ සඳහා ජනතාව පෙළගැස්සවීමටත් ඒ ජනතාවට නායකත්වය දීමටත් සූදානමින් සිටිනවා. නැවතත් පුද්ගල මාරුවකින් මේ අර්බුදය කෙළවරවීමට ඉඩ නොදී මේ සමාජ ක්‍රමය කෙළවර කරමින් අර්බුදය අවසන් කිරීමට නව උපක්‍රම තුළ ජනතාව අවදි කිරීමට නව අදියරකට ඔසවා තබන්න ජනතා විමුක්ති පෙරමුණ ලෙස අපි දැඩි කැපවීමක සිටිනවා.

### 10 පිටුවෙන් ධනවාදය නිරුවත් කරන...

තිබෙනවා. කළු හා හිස්පැනියක් (ස්පාඥ‍ඥ සම්භවයක් සහිත) ඇමරිකානුවන් අතර දරිද්‍රතා අගය පිළිවෙළින් සියයට 27.4ක් හා 26.6 ක් වෙනවා.

මේ සියල්ල සිදු වෙමින් ඇත්තේ, දැනට 10%කට ආසන්න විරැකියාවකට මුහුණ දෙන්නට ඇමරිකානුවන්ට සිදුව තිබියෙදීයි. එම අගය අඛණ්ඩ ලෙස මාසිකව ඉහළ යමින් තිබෙනවා.

මෙයින් ඇමරිකානු ආර්ථිකය පිළිබඳව ඇඳෙන චිත්‍රය අතිශය බිහිසුණුයි. ගොඩඒමක් පෙනෙන තෙක් මානයේවත් නොමැති ආර්ථිකය තව තවත් විරැකියාව වර්ධනය කරමින් සිටිනවා. බැන්ක් ඔෆ් ඇමරිකා වැනි දැවැන්ත සමාගම් සේවක ඉවත් කිරීම් ප්‍රකාශයට පත් කොට තිබෙනවා. නත්තල් සමයේ අලෙවිය පහළ යනු ඇති බවට වන වාර්තා එළඹෙන වසරේ රැකියා අහිමි කිරීම්වලට දායක වන ඇති. මන්ද විරැකියාවෙත් අමතර වියදම් කපා හැරීමේත් විෂම චක්‍රය විසින් පටි තදකර ගැනීම් සහ වියදම් සීමා කිරීම් දිරිගන්වනු ඇති අතර එය පෙරළා නිෂ්පාදනය ඇද වට්ටනු නොඅනුමානයි. බොහෝ විශේෂඥයින් පුරෝකථනය කළ ආකාරයටත් වඩා දරුණු ලෙස නැවතත් ඇමරිකා ආර්ථිකය කඩා වැටෙමින් තිබෙනවා. එය වෙනත් වචනයෙන් කියතොත් ධනවාදය සීඝ්‍රයෙන් නිරුවත් වෙමින් තිබෙනවා.

### 07 පිටුවෙන් 2012 අයවැය...

ඇත. ණය ගැනීමේ සීමාව ආණ්ඩුව ඉහළ දැමීමෙන්ම ඒ බව ප්‍රත්‍යක්ෂ වේ.

මෙවර අයවැයෙන්ද වැඩිම මුදලක් වෙන්කර ඇත්තේ, ආරක්ෂක අංශයටය. එය රු. කෝටි 22,994කි. පහුගිය වසරට වඩා කෝටි 2000ක් පමණ ඉක්මවන මුදලකි. ආරක්ෂක අමාත්‍යංශයට එලෙස වෙන් කරන විට අධ්‍යාපනයට වෙන් කර ඇත්තේ එයින් 10න් පංගුවකි. ආණ්ඩුව ආරක්ෂාවට මුල් තැනක් දී ඇත්තේ, ආරක්ෂක

**2012 ට මුදල් වෙන් කරන අයුරු (විසර්ජන පනත ඇසුරින්)**

කෝටි

| | |
|---|---|
| ආරක්ෂක හා නාගරික සංවර්ධන | 22.994 |
| මහාමාර්ග | 14.457 |
| මුදල් අමාත්‍යංශය | 12.422 |
| ආර්ථික සංවර්ධන අමාත්‍යංශය | 10.457 |
| රාජ්‍ය පරිපාලන හා ස්වදේශීය කටයුතු | 11.362 |
| පළාත් පාලන හා පළාත් සභා | 12.911 |
| සෞඛ්‍ය අමාත්‍යංශය | 7.400 |
| අධ්‍යාපන අමාත්‍යංශය | 3.327 |

අමාත්‍යංශය මුවාවෙන් ජනතාව රැවටීමේ ප්‍රෝඩාව ඉදිරියටම ගෙනයාම අරමුණු කරගෙනය.

ආණ්ඩුව කෙරෙහි නැති විශ්වාසයක් අයවැය කෙරෙහි ජනතාවගේ ඇතිවිය නොහැකිය. අයවැය මගින් වසරකට ගැලපෙන පුරාජේරු කයිවාරු කතාවක් මුදල් ඇමතිවරයා ලෙස ජනාධිපතිවරයා කළද යථාර්ථය එයින් වැසිය නොහැකිය. ජනතාව පීඩාවෙන් පීඩාවට පත් කරන මේ බොරුකාර පාලනය මෙන්ම ජනයා පෙළන මේ සමාජ රටාව අවසන් කරන තුරු ජනතාවාදී අයවැයක් ජනතාවට සිහිනයක් පමණි.

### 12 පිටුවෙන් චේ සමරුව...

රටවල් 45ක සංචාරය කරද්දී තමන් ලබපු සමාජ අත්දැකීම් මත ඔහු තේරුම්ගත්තා මේ කුරිරු සමාජය වෙනස් කළ යුතුයි කියලා.

ජීවත් වුණ චේට වඩා මරාදැමූ චේ බලවත්. චේ ජීවත්වෙලා ඉන්නකොට දන්නෙ රටවල් 10යි නම් ඔහු මරාදැමූ මොහොතේ සිට මුළු ලෝකයාම ඔහුව අඳුනාගත්තා.

අපි ඉදිරි වසරවලදී විප්ලවවාදී චේ සහෝදරයා සැමරුමකට සීමා නොකර එක් විටකදී සම්මන්ත්‍රණයකට තවත් විටක උද්ඝෝෂණයක් තවත් විටෙක රැලියක් කරන්න සමාජවාදී තරුණ සංගමයේ අපි තීරණය කරලා තියෙන්නේ. ශ්‍රී ලාංකේය තරුණ තරුණියන් මේ තුළ අවදි කළ යුතුයි. නැගී සිටිය යුතුයි.

උල්කාපාතයක් කාඩා හැලෙන විට එහි දිස්වෙන ආලෝකය හිරුටත් වඩා දීප්තිමත්. ඒත් ඒ උල්කාපාතයට ආලෝකය දෙන්නෙ හිරු. උල්කාපාතය කඩාවැටුණට පස්සෙ ආලෝකය නැතිවෙලා යනවා. හිරු හැමදාමත් තම ආලෝකය විහිදුවමින් ඉන්නවා.

චේ දිනය සමරනවා කියන්නේ දේශපාලන ක්‍රියාවක්. අපි යන්නේ සමාජවාදී ශ්‍රී ලංකාවක් නිර්මාණය කරන්න. අපේ පොත්පත්වල, අඳින ටීෂට්වල ඉන්න චේ මෝස්තරයක් කරගන්නවා වෙනුවට චේ මඟ යමින් අදට වඩා යහපත් මනුෂ්‍යත්වය අගයන සමාජයක්, සමාජවාදී සමාජයක් බිහිකරීම වෙනුවෙන් චේ මග ගමන්කල යුතුයි. ඒ අරමුණු අපි ජයගත යුතුයි.

චේ මාධ්‍ය වලින් විප්ලවය කලේ නැහැ. චේ මහපොළොවේ පය ගහලා විප්ලවය කළ වීරයෙක්. ආජන්ටිනාවෙ ඉපදිලා, කියුබාවේ විප්ලවය කරල, කියුබාවෙම ඇමතිකම් කිහිපයක් දරමින් සිටියදී ඒ සියල්ල දාල බොලීවියාවට ගියේ බොලීවියානු විප්ලවය සඳහා නායකත්වය දෙන්නයි. චේ බොලීවියාවට ගියා මිසක් ඕස්ට්‍රේලියාවට ගියේ නැහැ. තමන්ගෙ බිරින්දෑවරු දාලයි විප්ලවයට ගියේ. පවුල් පිටින් ගියේ නැහැ. ගරිල්ලා භටයන් 100ක් එක්කයි චේ බොලීවියාවට ගියේ. එවැනි විප්ලවීය ජන නායකයෙකුගේ මාවතෙයි අපි අද ගමන් කරමින් ඉන්නේ.

රෝහණ සහෝදරයා චේ වගේ වෙමින් අපේ පක්ෂය ගොඩනැගුවා. අපි ගොඩනැගුවා. රෝහණ සහෝදරයා අත්අඩංගුවට ගෙන අඳුරු සිර කුටියක දමා සිටියදී ඔහු අඟුරු කැබැල්ලකින් බිත්තියේ ලියාතිබුණේ ''ජනතාවනි මම නුඹලාට ප්‍රේම කරමි'' යනුවෙනුයි. අනාගත සමාජය ගැන ඔහු විශ්වාස කළා. ඔහු අඳුරු සිරකුටියේ සිටියදී පවා සමාජවාදය විශ්වාස කළා.

රෝහණ සහෝදරයා චේ මඟ යමින් ගමන් කළ මාවතේ අපි ඉදිරියටම යනවා. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ඉදිරියේ දණින් නොවැටී, රාජපක්ෂලාට වින්දනයක් ලබාදෙන්නන්ගේ බාධක බිඳහෙළමින් ඔවුන්ද පරාජයට පත්කරමින් ඉදිරියට යනවා.''

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com


## බ්ලැන්කිවාදී කල්ලියක්ද? පුළුල් බහුජන ව්‍යාපාරයක්ද?

අප ජීවත් වන්නේ සමාජ පරිවර්තන අවදියකය. අර්බුදයෙන් අර්බුදයට පත් අධිරාජ්‍යවාදය ඔප්පු කරමින් සිටින්නේ, මානව සංහතියට විනාශය මිස ජීවිතය ගෙනදීමට එය අසමත් බවය. අප වැනි රටවල දුබල, පසුගාමී, අධිරාජ්‍යවාදයට යටවූ ධනවාදයේ කෙළිරිය විසින් පෙන්වා දෙන්නේ, ධනවාදය අවසන් ගමන් යාමට ආසන්න බවත් එහි අවමඟුල් ගීතය ගැයීමට මෙන්ම ධනවාදයේ අවසානය සමග උපදින නව සමාජයේ ජය මඟුල් ගීතය ගැයීමටත් ජනතාව සූදානම් කළ යුතු බවය.

ධනවාදයේ අභාවයත් සමග උදාවන නව සමාජය වෙනුවෙන් ''වින්නඹු මාතාවගේ කාර්යය'' පැවරී ඇත්තේ, නිර්ධන පංතියේ පෙරමුණු බළඇණිය වන විප්ලවවාදී ව්‍යාපාරයකටය. එය ධනවාදය පරදා සමාජවාදී සමාජ පරිවර්තනයකට නායකත්වය දිය යුතුවක් මෙන්ම ඉන්පසු සමාජවාදය ගොඩනැගීමේ කාර්යයටද නායකත්වය දිය යුතුය. එය සරල කාරණයක් නොවේ. ඒ සඳහා විප්ලවවාදී පක්‍ෂය දියුණු න්‍යායකින් මගපෙන්වනු ලැබිය යුතුය. එසේම න්‍යාය ඇදහිල්ලක් බවට පත්කර නොගෙන එම න්‍යාය භාවිතයට නැගීමේ හැකියාවද අත්පත් කරගත යුතුය. පංති සටනේ අත්දැකීම් සහිත සටන්කාමී මෙන්ම පරිණත දේශපාලන ව්‍යාපාරයක් බවට පත් පක්ෂයක් අවශ්‍ය වන්නේද උක්ත තත්වය නිසාය.

සමාජවාදී සමාජ පරිවර්තනය ජනතාවට හොරෙන් කළ හැකි නොවේ. ජනතාවගේ සහයෙන් තොරව කළ හැකි නොවේ. ඒ සඳහා විප්ලවවාදී ව්‍යාපාරයේ නායකත්වයෙන් පුළුල් බහුජන ව්‍යාපාරයක් අවශ්‍ය වේ. පංතියට, පුළුල් බහුජනතාවට නායකත්වය දීමට, එය මෙහෙයවීමට විප්ලවවාදී පක්‍ෂයට හැකිවන්නේ පොදු ජනතාවගේ මනෝභාවය, ඔවුන්ගේ වුවමනාවන් හඳුනාගැනීමට සමත්වන්නේනම් පමණි. සමාජවාදී විප්ලවයේ ජයග්‍රහණය සඳහා පොදු ජනතාවගේ පක්‍ෂපාතීත්වයේ වැදගත්කම වරක් ලෙනින් සඳහන්කර තිබුණේ මෙසේය.

''නිර්ධන පංතියේ පෙරමුණු බලඇණිය අප පැත්තට දිනාගෙන තිබේ. ප්‍රධාන කටයුත්ත එයයි. මෙය ඉටු නොකර ජයග්‍රහණය දෙසට ප්‍රථම පියවරවත් තැබිය හැකි නොවේ. නමුත් ජයග්‍රහණය කරා තව යා යුතු දුර බොහෝය. පෙරමුණු බලඇණියක් පමණක් ඇතිව දිනුම ලැබිය නොහැක. මුළු පංතිය, පුළුල් ජනතාව, එක්කෝ එක චල්ලේම පෙරමුණු බලඇණියට ආධාර කරන නැතහොත් යටත් පිරිසෙන් ඒ කෙරෙහි අනුකූලතා පූර්වක මධ්‍යස්ථභාවයක් දක්වන හා සතුරන්ට ආධාර නොදෙන ස්ථාවරයක් ගන්නා තැනට ඒමට පෙර පෙරමුණු බලඇණිය පමණක් තීරණාත්මක සංග්‍රාමයකට ඇද දැමීම හුදෙක් මෝඩකමක් පමණක් නොව අපරාධයක්ද වන්නේය. - ලෙනින් තෝරාගත් කෘති 10 වෙළුම 214 පිටුව. විප්ලවයේදී බහුජනතාවගේ පක්‍ෂපාතීත්වයේ වැදගත්කම ලෙනින් දැක්කේ එසේය.

විප්ලවවාදී පක්‍ෂය පුළුල් බහුජන ව්‍යාපාරයක් ගොඩනැගීමට, බහුජනතාව විප්ලවයට එක්කර ගතහැකි වන සටන්පාඨ භාවිතාකිරීමට උපක්‍රම තෝරාගැනීමට සමත් විය යුතුය. පන්තියේ සටන් පාඨ, පොදු ජනයාගේ සටන් පාඨ, බොහෝවිට ඔවුන්ගේ දෛනික වුවමනාවන් සමග බැඳී තිබේ. ඒවා පොදු ජනයාට තෝරාගැනීමට තරම් සරල විය යුතුය. රුසියානු විප්ලවයේදී ලෙනින්ගේ සටන් පාඨ බවට ''ජනතාවට පාන්ඟ ගොවියන්ට ඉඩම්ඟ සොල්දාදුවන්ට සාමයඟඟ'' බවට පත්වූයේ ඒ නිසාය.

විප්ලවීය වාග් පාඨ පමණක් දොඩවන බහුජන ව්‍යාපාරයක වුවමනාව නොදකින හෝ එය අවතක්සේරු කරන කුඩා කල්ලියකට කණ්ඩායමකට සමාජවාදී සමාජ පරිවර්තනයකට නායකත්වය දිය නොහැක. විප්ලවීය වාග් පාඨ දෙඩවීම, සටන් ගැන කතා කිරීම ආශ්වාදජනක විය හැක. එය පහසුද විය හැකිය. එය බැලූ බැල්මට විප්ලවකාරී හා රැඩිකල් ලෙස පෙනිය හැක. එහෙත් එයට සමාජ පරිවර්තනයක් සඳහා පොදු ජනතාව මෙහෙයවිය නොහැක.

පංතිය බහුජනතාව සංවිධානය කිරීමේ කාර්යය ඉතා දුෂ්කර බැවින් එම දුෂ්කර කාර්යය මගහැර කුඩා කණ්ඩායමක කැපවීම මගින් බලය ගැනීමට කල්පනා කළ කණ්ඩායම් ලෝක වමේ දේශපාලනය පුරාම විටින් විට මතුවී තිබේ. බ්ලැන්කිවාදය ඉන් එකකි. අද අපට අවශ්‍ය වන්නේ, බ්ලැන්කිවාදී කුඩා කණ්ඩායමක ක්‍රියාකාරීත්වය නොව පුළුල් බහුජන ව්‍යාපාරයක් ගොඩනගා ඊට නායකත්වය දිය හැකි පරිණත වමේ ව්‍යාපාරයකි.

''අප මරා දැමුවද අප නගන හඬ සදා නොමියනු ඇත'' නම් කෘතියේ 57 වන පිටුවේ මේ පිළිබඳව රෝහණ විජේවීර සහෝදරයා මෙසේ සඳහන් කරයි. '' 'අපි බ්ලැන්කිවාදීන් නොවෙමු' යැයි ලෙනින් නොයෙක් වතාවල ලියා තිබේ. ලුවී බ්ලැන්ක්වි මනෝරාජික කොමියුනිස්ට්වාදියෙකු විය. රහසිගත විප්ලවවාදී කණ්ඩායම් ගණනාවක නායකත්වය දැරූ ඔහු කුඩා විප්ලවකාරී කණ්ඩායමක සහයෝගයෙන් බලය අල්ලාගැනීමට තැත් දැරූ අතර විප්ලවීය අරගලයේදී බහුජන සංවිධානවල තීරණාත්මක වැඩ කොටස තේරුම්ගැනීමට අසමත් විය.''

වර්තමානයේ මතුව ඇති නූතන බ්ලැන්කිවාදී කණ්ඩායම්වල නිර්මාක්ස්වාදී මතවාදයන්ගෙන් නිර්ධන පංති ව්‍යාපාරය පරෙස්සම් විය යුතුව තිබේ. මෝස්තරයට අරගල හා සටන් ගැන 'කතා කරන' විප්ලවීය සටන්පාඨ ආස්වාදජනක ලෙස තෙපලන, මනෝරාජික කල්ලියක් වෙනුවට විප්ලවවාදී ව්‍යාපාර කෙතරම් දුෂ්කර වුවත් තම සංවිධානයේ නායකත්වයෙන් පුළුල් බහුජන ව්‍යාපාරයක් ගොඩ නැගිය යුතුව තිබේ. බහුජනතාව සමාජ පරිවර්තනයට දායක කර ගත හැකි ලෙස උපක්‍රම තෝරාගනිමින්, ක්‍රියාමාර්ග තෝරාගනිමින්, වැරදීම් නිවැරදි කරගනිමින් කටයුතු කරන දේශපාලන ව්‍යාපාරයක් පමණක් අවසානයේදී ජයග්‍රහණය කරනු ඇත. ජනතා විමුක්ති පෙරමුණ යා යුත්තේ ඒ මාර්ගයේය.

## මහ වැසි නොතකා
# ජ.වි.පෙ. උද්ඝෝෂණයට මහ සෙනඟක්

පසුගිය 24වැනිදා කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරිපිට පැවැති ජනතා විමුක්ති පෙරමුණේ විරෝධතාවයට කම්කරු, ගොවි, ශිෂ්‍ය, සහ කාන්තා බලවේග නියෝජනය කරමින් දහස් ගණනක් එක්වී සිටියහ.

පසුගිය අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් මෙරට ජනතාවට ලබාදුන් පොරොන්දු ඉටු නොකර 2012 අයවැය ඉදිරිපත්කිරීමට විරෝධය පළකරමින් සහ ජීවන වියදමට සරිලන සේ වැඩකරන ජනතාවට වැටුප් වැඩි කරන ලෙසට බලකරමින් මෙම විරෝධතාව පවත්වනු ලැබිණි.

මේ අවස්ථාවේ අදහස් දක්වූ අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා පැවසුවේ රාජපක්ෂ ආණ්ඩුව පාතාලයන්ගේ ක්‍රියාවන් සහ නීතිවිරෝධී ජාවාරම්කරුවන්ගේ බලය රට තුළ තහවුරුකරමින් ඔවුන්ට ආරක්ෂාව සපයන අතර මෙරට වැඩකරන ජනතාව, ශිෂ්‍යයන්, ගොවියන්, ධීවරයන් කාන්තාවන්



ඇතුළු පොදු මහජනතාවගේ කිසිදු අයිතිවාසිකමක් ලබාදීමට ක්‍රියාකර නැති බවය.

මෙයට එරෙහිව වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් දිනාදීමට ජනතා විමුක්ති පෙරමුණ සමග එක්වී අන්තර් සමාගම් සේවක සංගමයද සටන් වදින බවද ජයග්‍රහණ දිනා දීමෙන් මෙපිට මෙම උද්ඝෝෂණ ක්‍රියාමාර්ග නොනවත්වන බවද ඔහු අවධාරණය කළේය.

## චේ සමරුව ඉහළින්



සමාජවාදී තරුණ සංගමය මගින් සංවිධානය කරන ලද 'චේ සමරුව' මෙවර ඔක්තෝබර් 15 වන දින කොළඹ ජයවර්ධන කෙන්ද්‍රයේදී පැවත්වනු ලැබිණි. ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසින් ප්‍රධාන දේශනය පවත්වනු ලැබූ මෙම සමරුවේදී අදහස් දක්වූ සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා මෙසේ පැවසීය.

''ඔබ දන්නවා අපි චේ සමරන්නේ අනුස්මරණය කිරීමේ අරමුණෙන් නෙවෙයි. අපි විප්ලවාදීන් විදිහට විප්ලවවාදී චේ සහෝදරයාගේ විප්ලවවාදී ගුණයන් ගැන කතාකරන්න තමයි අපි චේ සමරන්නෙ. ආජන්ටිනාවේ මධ්‍යම පාංතික පවුලක ඉපදුන චේ

11 වැනි පිටුවට

## ජනතාව වෙනුවෙන් පක්ෂය තුළ කල්ලි කණ්ඩායම් පරාජය කළ යුතුයි

**ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා**




දිනෙන් දින පිරිහෙමින් සිටින මහින්ද රාජපක්‍ෂ පාලනයට ඒ බව සඟවාලීමට හෝ සංවර්ධන සිහිනවලින් වසා දැමීමට හැකියාවක් නැති බවත් ජනතාව රවටන රාජපක්ෂ පාලනයට එරෙහිව ජනතාව සංවිධානය කිරීම වැළැක්වීම සඳහා ඔවුන් පක්ෂය තුළ කල්ලි කණ්ඩායම් බිහි කිරීමට උත්සාහ දරන බවත් ජනතාව වෙනුවෙන් ඒවා පරාජය කිරීම හැර තමන්ට වෙනත් විකල්පයක් නොමැති බවත් ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා අවධාරණය කළේය.

ඔහු මේ බව කියා සිටියේ, ජනතා විමුක්ති පෙරමුණ විසින් පසුගිය 05වැනිදා කොළඹ මාලිගාවත්තේදී සංවිධානය කරන ලද ජනතා රැලියේදීය. විශාල ජන සහභාගිත්වයක් ඇතිව පැවැත්වුණු එම රැලිය සඳහා ජ.වි.පෙ. නායකයින් සියලු දෙනා සහභාගි වී සිටියහ.

11 වැනි පිටුවට

## නියමුවා නවතම ප්‍රකාශන එළි දකී




2012 දින දර්ශනය - ආධාරය රු. 100.00




නවතම පොත් පිංච - ආධාරය රු. 50.00

## ආණ්ඩුවේ බොරු අයවැය වෙනුවට ජනතාවට සැබෑ අයිතීන් දිනාදිය යුතුයි!

**ජනතා විමුක්ති පෙරමුණ**



මෙම වසර සඳහා අණ්ඩුව ඉදිරිපත් කළ අයවැයෙන් ජනතාවට දුන් පොරොන්දු රාශියක් ඇති බවත් ඒ කිසිවක් ඉටු නොකර තිබියදී 2012 වසර වෙනුවෙන් ඉදිරිපත්කර තිබෙන විසර්ජන පනත ජනතාව මුළාකරන ඉලක්කම් විජ්ජාවක් පමණක් බවත් ජනතා විමුක්ති පෙරමුණ අවධාරණය කරයි.

රාජපක්ෂ ආණ්ඩුවේ අයවැය විසර්ජන පනත පිළිබඳව අදහස් දැක්වීම සඳහා පසුගිය 19වැනිදා ජ.වි.පෙ. විසින් සංවිධානය කරන ලද මාධ්‍ය හමුවකදී ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා මේ බව සඳහන් කළේ පසුගිය 19වැනිදා ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වූ ප්‍රවෘත්ති සාකච්ඡාවකදීය. මෙම ප්‍රවෘත්ති සාකච්ඡාවට සුනිල් හඳුන්නෙත්ති සහ විජිත හේරත් යන සහෝදරවරු ද සහභාගි වී සිටියහ.

## නිදහස් අධ්‍යාපනය රැකගැනීමට ධෛර්යයෙන් සටන්වදිනවා

**සමාජවාදී ශිෂ්‍ය සංගමය**



විවෘත ආර්ථිකය හඳුන්වාදීමත් සමග ජේ.ආර්. ජයවර්ධන පාලන සමයේ සිට මේ දක්වා බලයට පැමිණි විවිධ ආණ්ඩු විසින් 08 වරක් විශ්වවිද්‍යාල අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීමට උත්සාහ කර ඇති බව පවසන සමාජවාදී ශිෂ්‍ය සංගමය නිදහස් අධ්‍යාපන රැකගැනීමට ධෛර්යයෙන් සටන්වදින බව කියා සිටී.

ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේදී මාධ්‍ය හමුවක් පවත්වමින් සමාජවාදී ශිෂ්‍ය සංගමයේ නව ජාතික සංවිධායක නලින්ද ජයතිස්ස සහෝදරයා පසුගිය 31වැනිදා මේ බව පැවසීය.

කොළඹ 10, පංචිකාවත්ත පාරේ අංක 198/19 හි පදිංචි ටිල්වින් සිල්වා වන මා විසින් අංක 70 මිෂන් පාර, පිටකෝට්ටේ පිහිටි ආර්. සී. ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්හි මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.